# කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# களனிப் பல்கலைக்கழகம், இலங்கை

# UNIVERSITY OF KELANIYA, SRI LANKA

## වාර්ෂික වාර්තාව හා ගිණුම්

## ஆண்டறிக்கையும் கணக்குகளும்

## ANNUAL REPORT & ACCOUNTS

# 2019

# කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# වාර්ෂික වාර්තාව හා ගිණුම්

# 2019

# කැලණිය විශ්වවිද්‍යාලය

## දැක්ම

තිරසර සංවර්ධනයක් උදෙසා දැනුම නිර්මාණය කිරීමේ හා බෙදාහැරීමේ විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.

## මෙහෙවර

නිර්මාණශීලීත්වය හා නව්‍යකරණය තුළින් ජාතික සංවර්ධනය උදෙසා බුද්ධිමත් පුරවැසියන් බිහි කිරීම.

## පරමාර්ථ

1. ඉහළ ගුණාත්මකභාවයකින් යුත් නම්‍යශීලී ශික්ෂණ හා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම.
2. විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික ඉලක්ක සපුරා ලනු වස් ඉහළම ගුණාත්මකභාවයෙන් යුත් පීඨ සහ කාර්ය මණ්ඩලයක් ගොඩනැගීම.
3. ගෝලීය පිළිගැනීමක් ඇති බහු-විෂය පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කිරීම.
4. ආර්ථික සහ සාමාජීය සහභාගීත්ව පරාසයන් පුළුල් කිරීම මගින් විශ්වවිද්‍යාලයේ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම.
5. කාර්යක්ෂම හා ඵලදායී පරිපාලනය හා මූල්‍ය කළමනාකරණය හරහා විශිෂ්ට පාලන ක්‍රමයක් ගොඩනැංවීම



## උපකුලපතිවරයාගේ පණිවුඩය



***"කැලණිය විශ්වවිද්‍යාලයේ මූලයන් නැවත නිර්වචනය කරමින්: මෙම වසරේ දී අපි ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන අංශය තුළ පළමු වරට විශ්වවිද්‍යාලය දෝෂ ශූන්‍ය විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය කරන්නෙමු."***

කීර්තිමත් උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස අපි සැම දිනකම ඉහළම කාර්යක්ෂමතාවකින් සහ උසස්ම ඵලදායීතාවකින් මහජනතාවට සේවය සැලසීම පිණිස අපේ උපරිමය කැපකිරීමට වෙහෙසෙන්නෙමු. උසස් අධ්‍යාපන අංශය තුළ වසර 60ක් විශිෂ්ටත්වයක් සපුරාලන විශ්වවිද්‍යාලයට 2019 වසර ඉතා වැදගත් වසරක් විය.

2019 වසර තුළ දී අධ්‍යාපන මෙන්ම පරිපාලන ක්ෂේත්‍රවල ද සිදු වූ නව වැඩිදියුණුවීම් සමග විශ්වවිද්‍යාලයේ කාර්යසාධනය ඉහළ ගොස් ඇත. පෙර වසර හා සමානවම, පර්යේෂණ පරිසංවාද කීපයක්ම පවත්වන ලද අතර විශ්වවිද්‍යාලයේ ශික්ෂණ ඉගෙනුම් සංස්කෘතිය ඉහළ නැංවීම පිණිස කාර්ය මණ්ඩලය මෙන්ම ශිෂ්‍යයින් විසින් ද විවිධ විෂය බාහිර ක්‍රියාකාරකම් රාශියක් සංවිධානය කරන ලදී. තව ද, කීර්තිමත් දේශීය හෝ අන්තර්ජාතික සම්මාන දිනා ගනිමින් කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 31 දෙනෙක් විසින් විශ්වවිද්‍යාලයට ගෞරවයක් ගෙන දීමට සමත් විය.

මෙම වාර්තාවේ ප්‍රකාශයට පත් කර ඇති විශ්වවිද්‍යාලයේ ජයග්‍රහණ සහ කාර්යසාධනය විමසුමට ලක් කිරීම සඳහා මා ඔබ සැමට ආරාධනා කරන්නේ හද රැඳි තුටිනි.

අවසාන වශයෙන්, විශ්වවිද්‍යාලය ප්‍රවර්තන මට්ටම දක්වා උසස් කරමින්, 2019 වසර විශ්වවිද්‍යාලය සඳහා සාර්ථක වසරක් බවට පත් කිරීමට නොපිරිහෙළා දායක වූ කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍ය ප්‍රජාවගේ නොනිත් කැපවීම සහ උනන්දුව වෙනුවෙන් මාගේ කෘතඥතාව පළ කරන්නෙමි.

**මහාචාර්ය ඩී. එම්. සේමසිංහ**
උපකුලපති
කැලණිය විශ්වවිද්‍යාලය

## මෙම වාර්තාව පිළිබඳව

මෙය 2019 වර්ෂය සඳහා වූ කැලණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික තොරතුරු වාර්තාවයි. මෙම වාර්තාව හරහා 2019 ජනවාරි 01 වැනි දින සිට 2019 දෙසැම්බර් 31 වැනි දින දක්වා විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය තොරතුරු, කාර්යසාධනය සහ ජයග්‍රහණ විස්තරාත්මකව විදහා දැක්වීමට අපේක්ෂා කරනු ලැබේ.

## වාර්තාකරණ රාමු සහ විෂයපථය

මෙම වාර්තාවේ ශිෂ්‍ය තොරතුරු, උපාධි ප්‍රතිඵල, මානව සම්පත් පිළිබඳ තොරතුරු, පර්යේෂණ හා නවෝත්පාදන, සම්මාන සහ ජයග්‍රහණ, ක්‍රීඩා කටයුතු හා ජයග්‍රහණ, සුභසාධන පහසුකම්, යටිතලපහසුකම් සංවර්ධන ව්‍යාපෘති, මූල්‍ය කාර්යසාධන සහ වාර්ෂික ගිණුම් පිළිබඳ තොරතුරු අන්තර්ගත වේ. මෙම වාර්තාවේ දැක්වා ඇති දත්ත සහ තොරතුරු කැලණිය විශ්වවිද්‍යාලයේ පරිපාලන හා අධ්‍යයන දෙපාර්තමේන්තු සහ ඒකක හා මධ්‍යස්ථාන හරහා එක්රැස් කර ගත් ඒවා වේ. වාර්තාව විශ්වවිද්‍යාල සංඛ්‍යාන සහ දත්ත අධීක්ෂණ ඒකකය මඟින් සකස් කර ඇත.

## වගු ලැයිස්තුව


1.1 **වගුව:** ඉදිරි සැලසුම්........................................................................................................ 8

2.1 **වගුව:** පීඨ සාරාංශය........................................................................................................ 9

2.2 **වගුව:** මානවශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන අංශ සහ අධ්‍යයන අංශ පිරිනමන අදාළ විෂයන්.. 33

3.1 **වගුව:** පීඨ අනුව නව බඳවා ගැනීම........................................................................... 47

3.2 **වගුව:** උපාධි වැඩ සටහන් සඳහා ඇතුළු වන නවකයින්-දේශීය ප්‍රවේශය........................ 48

3.3 **වගුව:** උපාධි වැඩ සටහන් සඳහා ඇතුළු වන නවකයින්-විදේශීය ප්‍රවේශය..................... 49

3.4 **වගුව:** මුළු බඳවාගැනීම 2019 - දේශීය ප්‍රවේශය.................................................................. 51

3.5 **වගුව:** මුළු බඳවාගැනීම 2019 - විදේශීය ප්‍රවේශය.............................................................. 53

3.6 **වගුව:** බාහිර ප්‍රථම උපාධි වැඩසටහන් සඳහා ඇතුළුවන නවකයින් - 2019..................... 54

3.7 **වගුව:** බාහිර ප්‍රථම උපාධි වැඩසටහන් සඳහා මුළු බඳවාගැනම - 2019............................ 54

3.8 **වගුව:** පශ්චාත් උපාධි වැඩසටහන් අනුව ශිෂ්‍යයින්.............................................................. 55

3.9 **වගුව:** පූර්ණකාලීන පශ්චාත් උපාධි අධ්‍යන සඳහා දේශීය ශිෂ්‍ය බඳවා ගැනීම - 2019... 56

3.10 **වගුව:** පශ්චාත් උපාධි අධ්‍යන සඳහා විදේශීය ශිෂ්‍ය බඳවා ගැනීම - 2019....................... 59

3.11 **වගුව:** කෙටිකාලීන පුහුණු/පැවැරුම්වල විදේශ ශිෂ්‍යයින්ගේ විස්තර................................ 60

4.1 **වගුව:** අභ්‍යන්තර උපාධිධාරීන්ගේ ප්‍රථම උපාධි අපේක්ෂක නිමැවුම - 2019...................... 62

4.2 **වගුව:** බාහිර උපාධිධාරීන්ගේ ප්‍රථම උපාධි අපේක්ෂක නිමැවුම - 2019............................. 63

4.3 **වගුව:** පශ්චාත් උපාධි නිමැවුම 2019.................................................................................. 64

5.1 **වගුව:** අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය................................. 67

5.2 **වගුව:** සේවක වර්ගීකරණය අනුව විශ්වවිද්‍යාලයේ සමස්ත කාර්ය මණ්ඩලය.................. 68

5.3 **වගුව:** අධ්‍යයන කාර්ය මණ්ඩල කාණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව සහ දැනට සිටින කාර්ය මණ්ඩලය........................................................................................................ 69

5.4 **වගුව:** අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉහළම අධ්‍යයන සුදුසුකම්........................................... 70

5.5 **වගුව:** පරිපාලන කාර්ය මණ්ඩලයේ ඉහළම අධ්‍යයන සුදුසුකම් සහ වෘත්තීය සුදුසුකම්.. 71

5.6 **වගුව:** අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ දැනට සිටින සාමාජිකයන්....................................... 72

5.7 **වගුව:** අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉහළම අධ්‍යන සුදුසුකම් ........................................ 72

5.8 **වගුව:** පැමිණි අන්තර්ජාතික කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ........................................ 73

6.1 **වගුව:** අධ්‍යයන කාර්ය මණ්ඩලය සිදු කළ පළකිරීම 2019 ........................................ 76

6.2 **වගුව:** විද්‍යා සහ තාක්ෂණ සංවර්ධන නිමැවුම - 2019 ........................................ 77

6.3 **වගුව:** පේටන්ට් බලපත්‍ර විස්තර ........................................ 77

6.4 **වගුව:** විශ්වවිද්‍යාලය දිනාගත් සම්මාන - 2019 ........................................ 78

7.1 **වගුව:** නේවාසිකගාර පහසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව ........................................ 86

7.2 **වගුව:** ස්ථිර නේවාසිකාගාර උපයෝජනය ........................................ 87

7.3 **වගුව:** කුලියට ගත් නේවාසිකාගාර උපයෝජනය ........................................ 87

7.4 **වගුව:** මහපොළ සහ ශිෂ්‍යාධාර ශිෂ්‍යත්වලාභීන් - 2019 ........................................ 88

8.1 **වගුව:** ක්‍රීඩා පුහුණු වැඩසටහන් සහ ඉසව් ........................................ 92

8.2 **වගුව:** අන්තර්විශ්වවිද්‍යාල ශූරතා ඉසව්වල නිපුණතා දැක්වීම් - 2019 ........................................ 93

10.2 **වගුව:** සමස්ත ආදායම - 2019 ........................................ 148

10.3 **වගුව:** ප්‍රාග්ධන ආදායම - 2019 ........................................ 148

10.4 **වගුව:** පුනරාවර්තන වියදම - 2019 ........................................ 149

# රූපසටහන් ලැයිස්තුව

1-1 රූපසටහන: විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යුහය ........ 3

3-1 රූපසටහන: පීඨය අනුව නව බඳවාගැනීම ........ 47

3-2 රූපසටහන: ස්ත්‍රී-පුරුෂභාවය අනුව නව බඳවාගැනීම ........ 47

3-3 රූපසටහන: පීඨය අනුව 2019 සමස්ත බඳවාගැනීම ........ 50

3-4 රූපසටහන: අධ්‍යයන මට්ටම අනුව සමස්ත බඳවාගැනීම 2019 ........ 50

3-5 රූපසටහන: ස්ත්‍රී-පුරුෂභාවය අනුව 2019 සමස්ත බඳවාගැනීම ........ 50

3-6 රූපසටහන: පශ්චාත්-උපාධි වැඩසටහන අනුව ශිෂ්‍යයින් ........ 55

5-1 රූපසටහන: කාර්ය මණ්ඩල කාණ්ඩය අනුව ශ්‍රම බලකාය ........ 66

5-2 රූපසටහන: අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉහළම සුදුසුකම් ........ 70

# සංකේත නාම ලැයිස්තුව

| | | |
|---|---|---|
| FCMS | : | වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය |
| FCT | : | පරිගණක හා තාක්ෂණ පීඨය |
| FGS | : | පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය |
| FHU | : | මානවශාස්ත්‍ර පීඨය |
| FMED | : | වෛද්‍ය පීඨය |
| FSC | : | විද්‍යා පීඨය |
| FSOSC | : | සමාජීය විද්‍යා පීඨය |




*2019 නොවැම්බර් මස 01වැනි දින රන් වැට සහ පඨිමාඝාරය සහිත බෝධිප්‍රාකාරය විවෘත කිරීම*

# පටුන

පිටු අංකය


| | |
|---|---|
| **කැලණිය විශ්වවිද්‍යාලය** | i |
| දැක්ම | iii |
| මෙහෙවර. | iii |
| පරමාර්ථ | iii |
| **උපකුලපතිවරයාගේ පණිවුඩය** | **iv** |
| **මෙම වාර්තාව පිළිබඳව** | v |
| **වාර්තාකරණ රාමු සහ විෂයපථය** | v |
| **වගු ලැයිස්තුව** | vi |
| **රූප සටහන් ලැයිස්තුව** | viii |
| **සංකේත නාම ලැයිස්තුව** | viii |

## පළමු කොටස - වාර්ෂික වාර්තාව - 2019

| | | |
|---|---|---|
| 1 | **කැලණිය විශ්වවිද්‍යාලය** | **1** |
| 1.1 | විශ්වවිද්‍යාලයේ 2019 වසර | 5 |
| 1.2 | වසරේ ලද ජයග්‍රහණ | 6 |
| 1.3 | ඉදිරි සැලසුම් | 8 |
| 2 | **විශ්වවිද්‍යාලයේ පීඨ** | **9** |
| 2.1 | වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය | 10 |
| 2.2 | පරිගණක හා තාක්ෂණ පීඨය | 13 |
| 2.3 | පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | 23 |
| 2.4 | මානවශාස්ත්‍ර පීඨය | 32 |
| 2.5 | වෛද්‍ය පීඨය | 35 |
| 2.6 | විද්‍යා පීඨය | 39 |
| 2.7 | සමාජීය විද්‍යා පීඨය | 43 |
| 3 | **ශිෂ්‍ය තොරතුරු** | **46** |
| 3.1 | නව බඳවා ගැනීම 2017/18 - අභ්‍යන්තර ප්‍රථම උපාධි වැඩ සටහන් | 47 |
| | අ දේශීය ප්‍රවේශය | 48 |
| | ආ විදේශීය ප්‍රවේශය | 49 |
| 3.2 | මුළු බඳවා ගැනීම 2019 - අභ්‍යන්තර ප්‍රථම උපාධි වැඩ සටහන් | 50 |
| | අ. දේශීය ප්‍රවේශය | 51 |
| | ආ. විදේශීය ප්‍රවේශය | 53 |
| 3.3 | බාහිර ප්‍රථම උපාධි වැඩ සටහන්වල ශිෂ්‍යයින් - 2019 | 54 |
| 3.4 | පශ්චාත් උපාධි වැඩ සටහන්වල ශිෂ්‍යයින් - 2019 | 55 |
| | අ. පශ්චාත් උපාධි අධ්‍යයනවල නියැලී දේශීය ශිෂ්‍යයින් | 56 |
| | ආ. පශ්චාත් උපාධි අධ්‍යයනවල නියැල විදේශීය ශිෂ්‍යයින් | 59 |
| 3.5 | කෙටිකාලීන පුහුණු/ පැවැරුම්වල විදේශීය ශිෂ්‍යයින් - 2019 | 60 |
| 4 | **විභාග දත්ත** | **61** |
| 4.1 | උපාධිධාරී නිමවුම - අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂකයින් - 2019 | 62 |
| 4.2 | උපාධිධාරී නිමවුම - බාහිර ප්‍රථම උපාධි අපේක්ෂකයින් - 2019 | 63 |
| 4.3 | පශ්චාත් උපාධි නිමවුම - 2019 | 64 |
| 5 | **විශ්වවිද්‍යාලයේ මානව සම්පත්** | **65** |
| 5.1 | විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය - අනුමත කාර්ය මණ්ඩලය සහ වර්තමාන කාර්ය මණ්ඩලය | 66 |
| 5.2 | අධ්‍යයන කාර්ය මණ්ඩලය - අනුමත කාර්ය මණ්ඩලය සහ වර්තමාන කාර්ය මණ්ඩලය | 69 |
| 5.3 | අධ්‍යයන, පරිපාලන සහ මුල්‍ය කාර්ය මණ්ඩලයේ ඉහළම සුදුසුකම් - 2019 | 70 |
| | අ. අධ්‍යයන කාර්ය මණ්ඩලය | 70 |
| | ආ. පරිපාලන සහ මුල්‍ය කාර්ය මණ්ඩලය | 71 |

| | | | |
|---|---|---|---|
| | 5.4 | අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 72 |
| | | අ. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ දැනට සිටින සාමාජිකයින් | 72 |
| | | ආ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉහළම සුදුසුකම් | 72 |
| | 5.5 | පැමිණි අන්තර්ජාතික කාර්ය මණ්ඩලයේ තොරතුරු - 2019 | 73 |
| 6 | **පර්යේෂණ සහ සංවර්ධන කටයුතු** | | **75** |
| | 6.1 | අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදු කළ ප්‍රකාශන - 2019 | 76 |
| | 6.2 | විද්‍යා සහ තාක්ෂණ නිමවුම - 2019 | 77 |
| | 6.3 | පේටන්ට් බලපත්‍ර විස්තර - 2019 | 77 |
| | 6.4 | විශ්වවිද්‍යාලය විසින් දිනාගත් සම්මාන - 2019 | 78 |
| 7 | **ශිෂ්‍ය සුභසාධන පහසුකම්** | | **85** |
| | 7.1 | නේවාසිකාගාර පහසුකම් - 2019 | 86 |
| | | අ ස්ථිර නේවාසිකාගාර උපයෝජනය | 87 |
| | | ආ කුලියට ලබා ගත් පහසුකම් උපයෝජනය | 87 |
| | 7.2 | මහපොළ සහ ශිෂ්‍යාධාර ශිෂ්‍යත්ව - 2019 | 88 |
| 8 | **ක්‍රීඩා ක්‍රියාකාරකම් - 2019** | | **89** |
| | 8.1 | ක්‍රීඩා පහසුකම් | 90 |
| | 8.2 | විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා ඉසව් | 91 |
| | 8.3 | ක්‍රීඩා පුහුණු වැඩසටහන් සහ උත්සව | 92 |
| | 8.4 | අන්තර් විශ්වවිද්‍යාලය ශුරතාවලියේ දැක් වූ කුසලතා - 2019 | 93 |
| | 8.5 | 2019 වසරේ දී ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය මගින් පැවැත්වූ වෙනත් විශේෂ ඉසව් | 94 |
| | 8.6 | 2019 වසරේ දී අනුබද්ධිත ක්‍රීඩා පාලන මණ්ඩල | 95 |
| | 8.7 | 2019 වසර තුළ දී කාර්ය මණ්ඩල සාමාජිකයින් දැරූ වෙනත් ධූර | 96 |
| 9 | **තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම්ව සිදු කළ ක්‍රියාකාරකම් සහ අනාගත සැලසුම්** | | **97** |
| | 9.1 | හැඳින්වීම | 97 |
| | 9.2 | යහපත් සෞඛ්‍යය | 98 |
| | 9.3 | ගුණාත්මක අධ්‍යාපනය | 98 |
| | 9.4 | ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව | 99 |
| | 9.5 | පිරිසිදු ජලය සහ සනීපාරක්ෂක පහසුකම් | 99 |
| | 9.6 | දැරිය හැකි සහ පිරිසිදු බල ශක්තිය | 100 |
| | 9.7 | වගකීම් සහගත පරිභෝජනය සහ නිෂ්පාදනය | 100 |
| | 9.8 | දේශගුණික ක්‍රියාකාරකම් | 100 |
| | 9.9 | මිහිමත ජීවිතය | 101 |
| | 9.10 | ඉලක්ක සඳහා හවුල්කාරිත්වය | 101 |


## දෙවන කොටස - මූල්‍ය ප්‍රකාශන තොරතුරු සහ විගණන තොරතුරු


| | | | |
|---|---|---|---|
| 10 | **මූල්‍ය ප්‍රකාශන තොරතුරු** | | **103** |
| | 10.1 | මූල්‍ය ප්‍රකාශන | 104 |
| | 10.2 | මුළු ආදායම - 2019 | 148 |
| | 10.3 | ප්‍රාග්ධන වියදම් - 2019 | 148 |
| | 10.4 | පුනරාවර්තන විදයදම- 2019 | 149 |
| 11 | **විගණකාධිපතිගේ වාර්තාව** | | **150** |
| 12 | **විගණන කමිටු වාර්තාව** | | **159** |
| 13 | **විගණකාධිපතිගේ වාර්තාව පිළිබඳ කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ නිරීක්ෂණය** | | **161** |

# පළමු කොටස

# වාර්ෂික වාර්තාව 2019

# 1. කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ජාතික රාජ්‍ය විශ්වවිද්‍යාලයක් වන කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ ආර්ථික අග නගරය වන කොළඹ මහ නගර සභා සීමාවෙන් පිටත ඓතිහාසික කැලණිය නගරයේ පිහිටා ඇති අතර වෙනස් අධ්‍යයන පීඨ හතකින්, අධ්‍යයන අංශ පනස් හයකින් (56) සහ ආයතන තුනකින් සමන්විත වන අතර, අධ්‍යයන කාර්ය මණ්ඩලය සාමජිකයින් 652ක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සාමාජිකයින් 832ක් ද ඇතුළත් වේ. තව ද ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, පාලි හා බෞද්ධ අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය සහ පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය යන අනුබද්ධ ආයතන තුනක් ද විශ්වවිද්‍යාලයට අයත් වේ.

විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයින්ට ශිෂ්‍ය උපදේශන සේවාව, වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය, පුද්ගලික උපදේශන ඒකකය (කළණ මිතුරු සෙවන), වෛද්‍ය මධ්‍යස්ථානය, ශාරීරික අධ්‍යාපන මධ්‍යස්ථානය, සංස්කෘතික මධ්‍යස්ථානය, කලා කවුන්සිලය, (පීඨ පුස්තකාල ඇතුළුව) පුස්තකාලය, තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථාන සහ අන්තර්ජාතික ශිෂ්‍ය සබඳතා ඒකකය වැනි කාණ්ඩ යටතේ විවිධ සේවා ලබා ගැනීමේ හැකියාව උදා වී ඇත. මෙම මධ්‍යස්ථාන සහ ඒකක හැරුණු කොට වෙනස් නමුත් නිශ්චිත සේවා සඳහා වූ වෙනත් ආයතන කිහිපයක් ද වේ. උදාහරණ ලෙස, අභ්‍යන්තර තත්ත්ව සහතික මධ්‍යස්ථානය, විශ්වවිද්‍යාල සංඛ්‍යාන හා දත්ත අධීක්ෂණ ඒකකය (USDMU), මාධ්‍ය ඒකකය, කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය, තාක්ෂණ හා නවෝත්පාදනය අනුග්‍රහ මධ්‍යස්ථානය, තිරසර සංවර්ධන මධ්‍යස්ථානය, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපනය සඳහා වූ මධ්‍යස්ථානය (CDCE), ක්‍රමෝපායන සන්නාම අනන්‍යතා සංවර්ධනය සඳහා වූ විශිෂ්ටතා මධ්‍යස්ථානය (CESBID) සහ මොඩියුල ක්‍රමය සම්බන්ධීකරණය සඳහා වූ අන්තර්-පීඨ මධ්‍යස්ථානය (ICCMS) දැක්විය හැකිය. විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සංස්කෘතිය තහවුරු කරමින්, සෑම පීඨයකම පර්යේෂණ සේවා කේන්ද්‍ර සම්බන්ධීකරණය කරන පර්යේෂණ සභාවක් විශ්වවිද්‍යාලය තුළ පිහිටුවා ඇත. රාගම පරිශ්‍රයේ පිහිටුවා ඇති වෛද්‍ය පීඨය සහ පැලියගොඩ පරිශ්‍රයේ පිහිටුවා ඇති පරිගණක හා තාක්ෂණ පීඨය හැරුණු කොට අනෙකුත් සියලුම පීඨ අග නගරයෙන් කිලෝ මීටර දොළහක් ඈතින් වූ, දළුගම අක්කර 55ක භූමි භාගයක පිහිටා ඇත. ශිෂ්‍ය මධ්‍යස්ථානය, විද්‍යා ගොඩනැගිල්ල, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ගොඩනැගිලි සංකීර්ණය, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන ගොඩනැගිලි සංකීර්ණය, විද්‍යා දේශන ශාලා සංකීර්ණය, ශ්‍රවණාගාරය හා අනුබද්ධ ගොඩනැගිල්ල, ශ්‍රී ධර්මාලෝක උපාධි ශාලාව, ජලජ හා ක්ෂුද්‍රජීව

විද්‍යා ගොඩනැඟිල්ල, තොරතුරු සන්නිවේදන තාක්ෂණ කේන්ද්‍රය, පුස්තකාලය සහ පරිපාලන ගොඩනැඟිල්ල දළුගම පරිශ්‍රයේ පිහිටි ප්‍රධාන ගොඩනැඟිලිවලට ඇතුළත් වේ. ශ්‍රී ධර්මාලෝක උපාධි ශාලාවේ 1,000ක ආසන ධාරිතාවක් ඇති අතර විද්‍යා පීඨ ශ්‍රවණාගාරයේ සහ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ මහාචාර්ය සුනිල් ශාන්ත අනුස්මරණ ශ්‍රවණාගාරයේ පිළිවෙලින් පුද්ගලයින් 250ක් සහ 300ක් සඳහා ආසන පහසුකම් ඇත. ශ්‍රී ධර්මාලෝක උපාධි ශාලාව සහ විද්‍යා පීඨ ශ්‍රවණාගාරය මෑතක දී නවීන තාක්ෂණයෙන් යුතු ශ්‍රවණාගාරයක් ලෙස නවීකරණය කරන ලදී. නේවාසිකාගාර පහසුකම් සම්බන්ධයෙන් සැලකීමේ දී, භික්ෂු නේවාසිකාගාරය සහ කාන්තා නේවාසිකාගාර සංකීර්ණය දළුගම විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පිහිටා ඇති අතර පිරිමි නේවාසිකාගාර සහ කාන්තා නේවාසිකාගාර කිහිපයක් ආසන්නයේ පිහිටා ඇත. ශිෂ්‍යාවන් 500 දෙනෙක් සඳහා නේවාසිකාගාර පහසුකම් සපයමින් පූජ්‍ය රත්මලානේ ශ්‍රී ධම්මාරාම කාන්තා නේවාසිකාගාරය දෙසැම්බර් මාසයේ දී විවෘත කරන ලදී. තොරතුරු තාක්ෂණ පහසුකම් සැපයීමේ දී ප්‍රධාන තොරතුරු සන්නිවේදන තාක්ෂණ කේන්ද්‍රයට අමතරව, සෑම පීඨයක් සතුවම සියලුම උපකරණවලින් සැදුම්ලත් තොරතුරු සන්නිවේදන තාක්ෂණ කේන්ද්‍ර පිහිටුවා ඇති අතර ඒවා පීඨය හෝ අධ්‍යයන අංශය මඟින් කළමනාකරණය කරනු ලැබේ. ශික්ෂණ, ඉගෙනුම් සහ පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් සමස්ත විශ්වවිද්‍යාලය සහ නේවාසිකාගාර ආවරණය වන වයි-ෆයි පහසුකම් සලසා ඇත. මානවශාස්ත්‍ර පීඨය තුළ භාෂා විද්‍යාගාර තුනක් ස්ථාපිත කර ඇත. විද්‍යා පීඨයේ සහ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ සියලුම අධ්‍යයන අංශ සඳහා පන්ති කාමර පහසුකම්වලට අමතරව පර්යේෂණ විද්‍යාගාර පහසුකම් ද සපයා ඇත. රාගම පරිශ්‍රයට පරිපාලන ගොඩනැඟිල්ල, දේශන ශාලා හා විද්‍යාගාර සංකීර්ණය, ආබාධ අධ්‍යයන ඒකක ගොඩනැඟිල්ල, අණුක වෛද්‍ය විද්‍යා ඒකක ගොඩනැඟිල්ල, පූර්ව සායන ගොඩනැඟිල්ල සංකීර්ණය, 200ක් පමණ පිරිසක් සඳහා වූ ආසන පහසුකම් ඇති ශ්‍රවණාගාරය සහ පිරිමි හා කාන්තා නේවාසිකාගාර ඇතුළත් වේ. දේශන ශාලා දෙකක් සහ ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකිරීමේ කටයුතු පීඨය පරිශ්‍රය තුළ මෑතක දී ආරම්භ කරන ලදී. විශ්වවිද්‍යාලයේ මානව සම්පත සලකා බැලීමේ දී අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්, පරිපාලන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය, විධායක කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාලයේ මානව සම්පතට ඇතුළත් වේ. පහත දැක්වෙන රූප සටහන විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යුහය පැහැදිලි කරනු ලැබේ.

### අ. ආයතනික ව්‍යුහය




*1-1රූපසටහන: විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යුහය*

*ආ. පාලක සභාව*

| | | |
|---|---|---|
| **උපකුලපති** | මහාචාර්ය ඩී. එම්. සේමසිංහ | 20.03.2017 සිට 19.03.2020 |
| **නියෝජ්‍ය උපකුලපති** | මහාචාර්ය ලක්ෂ්මන් සෙනෙවිරත්න | 19.05.2017 සිට 18.05.2020 |
| **පීඨාධිපතිවරු** | | |
| ආචාර්ය පී.එන්.ඩී. ප්‍රනාන්දු | වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය | 07.04.2017 සිට 06.04.2020 |
| ආචාර්ය පී. ජී. විජයරත්න | පරිගණක හා තාක්ෂණ පීඨය | 06.05.2019 සිට 05.05.2022 |
| මහාචාර්ය ජේ. එම්. ඩී. ආරියරත්න | පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | 09.03.2019 සිට 08.03.2022 |
| මහාචාර්ය ආර්.එම්.පී.එෆ්. රත්නායක | මානවශාස්ත්‍ර පීඨය | 21.04.2017 සිට 20.04.2020 |
| මහාචාර්ය පී. එස්. විජේසිංහ | වෛද්‍ය පීඨය | 14.08.2018 සිට 22.09.2020 |
| මහාචාර්ය බී. එම්. ජයවර්ධන | විද්‍යා පීඨය | 03.01.2017 සිට 02.01.2020 |
| මහාචාර්ය එම්. එම්. ගුණතිලක | සමාජීය විද්‍යා පීඨය | 15.12.2019 සිට 14.12.2022 |
| **ඡන්දයෙන් පත් කළ සාමාජිකයින්** | | |
| මහාචාර්ය එන්. ඒ. කේ. පී. ජේ. සෙනෙවිරත්න | | 04.02.2017 සිට 03.02.2020 |
| මහාචාර්ය පී. එම්. සී. තිලකරත්න | | 04.02.2017 සිට 03.02.2020 |
| **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවය පත් කළ සාමාජිකයින්** | | |
| මහාචාර්ය එස්. ටී. බී. අමුණුගම | | 20.04.2018 සිට 20.12.2019 |
| මහාචාර්ය ඩී. එම්. ඒ. දිසානායක | | 20.04.2018 සිට 20.12.2019 |
| පූජ්‍ය අම්බලන්වල ඥානාලෝක ස්වාමීන්වහන්සේ | | 20.04.2018 සිට 20.12.2019 |
| ඩබ්ලිව්. එම්. ඒ. එස්. ඉද්දවෙල | | 20.04.2018 සිට 20.12.2019 |
| අසේල කලුගම්පිටිය මහතා | | 20.04.2018 සිට 20.12.2019 |
| ඊ. පී. ඩොනට් නන්දසිංහ මහතා | | 20.04.2018 සිට 20.12.2019 |
| එච්. එම්. එන්. වරකාඋල්ල මහතා | | 20.04.2018 සිට 20.12.2019 |
| ප්‍රීති පෙරේරා මහතා | | 20.04.2018 සිට 20.12.2019 |
| පී. එම්. පී. පෙරේරා මහතා | | 20.04.2018 සිට 20.12.2019 |
| විද්‍යා නිධි මහාචාර්ය ඩබ්ලිව්. එම්. ටී. බී. වන්නිනායක | | 20.04.2018 සිට 20.12.2019 |
| මහාචාර්ය එස්. පී. ලමාබදුසූරිය | | 20.04.2018 සිට 20.12.2019 |
| නිශාන් ප්‍රේමතිරත්න මහතා | | 20.04.2018 සිට 20.12.2019 |

**පාලක සභාවේ ලේකම්**

ඩබ්ලිව්. එම්. කරුණාරත්න මහතා (නිල බලයෙන්)

## 1.1. විශ්වවිද්‍යාලයේ 2019 වසර

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන දින දර්ශනයට අනුකූලව 2016/17 අධ්‍යයන වර්ෂය 2019 පෙබරවාරි මස 04 වැනි දින අවසන් වූ අතර 2019 පෙබරවාරි මස 05වැනි දින ආරම්භ වූ 2017/18 වර්ෂය සඳහා වූ අධ්‍යයන කටයුතු 2020 පෙබරවාරි මස 29වැනි දින අවසන්වීමට නියමිතය. 2019 වසරේ දී අභ්‍යන්තර ප්‍රථම උපාධි වැඩසටහන්වල නව බඳවාගැනීම් ලෙස 3,377ක් වූ දේශීය ශිෂ්‍යයින් බඳවා ගන්නා ලද අතර 2019 වසරේ දී ශිෂ්‍යයින් 871 දෙනෙක් පශ්චාත්-උපාධි අධ්‍යයන සඳහා බඳවා ගන්නා ලදී. 2019 වසරේ දී ප්‍රථම උපාධි සහ පශ්චාත්-උපාධි අධ්‍යයන සඳහා අන්තර්ජාතික ශිෂ්‍යයින් 132 දෙනෙක් බඳවා ගැනීම මඟින් විශ්වවිද්‍යාලයේ අන්තර්ජාතික පිළිගැනීම ඉහළ නංවා ගැනීමට හැකි විය. අද වන විට කැලණිය විශ්වවිද්‍යාලය තුළ ශිෂ්‍යයින් දොළොස් දහස් එකසිය හත් දෙනෙක් (12,107) ප්‍රථම උපාධි වැඩසටහන්වල අධ්‍යාපන කටයුතු හදාරන අතර ශිෂ්‍යයින් එක් දහස් නමසිය අසූ හතර දෙනෙක් (1,984) පශ්චාත්-උපාධි අධ්‍යයනවල නියැලී සිටිති. 2019 වසර තුළ දී විශ්වවිද්‍යාලය අභ්‍යන්තර උපාධිධාරීන් 1587 දෙනෙක් සහ පශ්චාත්-උපාධිධාරීන් 984 දෙනෙක් බිහි කර ඇත.

විශ්වවිද්‍යාලය එහි අන්තර්ජාතික ප්‍රතිරූපය ගොඩනැංවීම පිණිස පියවර කීපයක්ම ගෙන ඇති අතර පර්යේෂණ කටයුතු සඳහා සහ කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් හුවමාරු කිරීමේ වැඩසටහන් යන කාර්යයන් සඳහා ලෝව පුරා විශ්වවිද්‍යාල කිහිපයක් සමගම අන්තර්ජාතික අවබෝධතා ගිවිසුම් දෙකක් අත්සන් කර ඇත. ක්‍රමෝපායන සන්නාම අනන්‍යතා සංවර්ධනය සඳහා වූ විශිෂ්ටතා මධ්‍යස්ථානය (CESBID) විශ්වවිද්‍යාලය සඳහා ක්‍රමෝපායන සන්නාම අනන්‍යතාවක් නිර්මාණය කිරීමේ කාර්යයේ නිරතව ඇත. විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සංස්කෘතිය සඳහා මූල්‍යමය ශක්තිය සපයමින් විශ්වවිද්‍යාලය අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ කටයුතු සහ විශ්වවිද්‍යාලය තුළ සංවිධානය කළ සම්මන්ත්‍රණ සහ පරිසංවාද සඳහා අරමුදල් සපයා ඇත.

## 1.2. වසරේ ලද ජයග්‍රහණ

කැලණිය විශ්වවිද්‍යාලය 2019 වසරේ UI හරිත ප්‍රමිතික ශ්‍රේණිගත කිරීම අනුව ලෝක ශ්‍රේණිගත කිරීමෙන් 272වැනි ස්ථානය හිමිකර ගෙන ඇත. UI හරිත ප්‍රමිතික ශ්‍රේණිගත කිරීම පරිසරය, ආර්ථිකය හා සමානාත්මතාව පිළිබඳ රාමුව යන පුළුල් සංකල්පය මත පදනම් වී ඇත. පසුගිය වසරේ දී රටවල් 76ක විශ්වවිද්‍යාල 679ක සහභාගීත්වය හා සැසඳීමේ දී මෙම වසරේ දී රටවල් 83කින් විශ්වවිද්‍යාල 779ක් මෙම තරඟයට සහභාගී විය. ශ්‍රේණිගත කිරීම සඳහා සෑම විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන්ම දර්ශක හයක් සැලකිල්ලට ගනු ලැබේ. පිහිටීම හා යටිතලපහසුකම්, බලශක්තිය හා කාලගුණික වෙනස්කම්, අපද්‍රව්‍ය, ජලය, ප්‍රවාහනය සහ අධ්‍යාපනය මෙම දර්ශක හය වේ.

විශ්වවිද්‍යාලය 2019 වසරේ විශිෂ්ටතම වෙබ් සම්මාන උළෙල විශ්වවිද්‍යාල සහ අධ්‍යාපන ආයතන කාණ්ඩය යටතේ ලෝකඩ සම්මානය ජයග්‍රාහකයා ලෙස සම්මානයට පාත්‍රව ඇත. 2019 වසරේ විශිෂ්ටතම වෙබ් සම්මාන උළෙල එල්කේ ඩොමේන් රෙජිස්ට්‍රි (LK Domain Registry) මඟින් 9වැනි වරටත් සංවිධානය කරනු ලැබුවේ ශ්‍රී ලංකාවේ ඇති විශිෂ්ටතම වෙබ් අඩවි පිළිගැනීමේ පරමාර්ථය ඇතිව වන අතර ශ්‍රී ලංකාවේ වෙබ් අඩවි ජනප්‍රිය කරවීම සහ දිරිමත් කරවීම සඳහාත් ශ්‍රී ලාංකික මාර්ගගත නිපුණතාවන් ප්‍රදර්ශනය කරවීම සඳහාත් අද්විතීය ඉඩප්‍රස්ථාවක් සලසා දෙනු ලබන වෙබ් අඩවි පාදක තරඟයකි.

වෛද්‍ය පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් හට විද්‍යාත්මක ප්‍රකාශන සඳහා වූ ජනාධිපති සම්මාන ප්‍රදානය කර ඇත. විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සංස්කෘතිය වැඩිදියුණු කිරීම පිණිස 2019 වර්ෂයේ දී අධ්‍යයන පරිසංවාද සහ පර්යේෂණ සම්මන්ත්‍රණ කීපයක්ම පවත්වන ලදී. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මඟින් සංවිධානය කරනු ලබන "ඩිජිටල් පරිවර්තනය/ පරිවාර්තන හරහා බහුවිෂය පර්යේෂණ පවත්වා ගෙනයාම"යන තේමාව රැගත් වාර්ෂික පර්යේෂණ පරිසංවාදය, 20වැනි අන්තර්ජාතික පශ්චාත්-උපාධි පර්යේෂණ සම්මන්ත්‍රණය 2018 දෙසැම්බර් මස 30වැනි දින පවත්වන ලදී. උසස් අධ්‍යාපනය පිළිබඳ අන්තර්ජාතික ප්‍රජාවේ නැගෙනහිර ආසියානු ආයතන සංගමයේ (ASAIHL) සාමාජිකයෙක් ලෙස කැලණිය විශ්වවිද්‍යාලය දෙසැම්බර් මස 9 සහ 10 යන දෙදින තුළ කොළඹ, ගලදාරී හෝටලයේ දී ASAIHL සංගමයේ අන්තර්ජාතික සම්මන්ත්‍රණය සංවිධානය කරන ලදී. මෙයට පරිසංවාදයට අමතරව, විශ්වවිද්‍යාලය තුළ පර්යේෂණ සංස්කෘතිය පෝෂණය කිරීමේ

කාර්යය සඳහා පීඨ සහ අධ්‍යයන අංශ මගින් අන්තර්ජාතික සහ ජාතික මට්ටමේ පර්යේෂණ සම්මන්ත්‍රණ සහ පරිසංවාද 37ක් සංවිධානය කර පවත්වා ඇත.

කැලණිය විශ්වවිද්‍යාලයේ 60වැනි සංවත්සරය සමරමින් උසස් අධ්‍යාපනයේ විශිෂ්ටත්වය ප්‍රදර්ශනය කිරීම පිණිස උත්සව කිහිපයක්ම සංවිධානය කරන ලදී. මෙහි සමාරම්භ උත්සවය 2019 ජූනි මස 17වැනි දින පවත්වන ලද අතර ඉන් අනතුරුව පැවති "පහන් පූජාව" සඳහා විශ්වවිද්‍යාලයේ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ ශිෂ්‍යයින් සහභාගී වූහ. "විදූලකර පුනරාවලෝකනය" අධ්‍යාපන ප්‍රදර්ශනය 2019 නොවැම්බර් මස 27වැනි දින සිට 29වැනි දින දක්වා අති සාර්ථකව පවත්වන ලදී. පර්යේෂණ සබඳතා පරිසංවාදයක්, සංගීත ප්‍රසංගයක්, දානමය වැඩසටහනක් සහ පිරිත් සජ්ජායන පූජාවක් විශ්වවිද්‍යාලයේ සංවත්සරයට සමගාමීව පවත්වන ලද අනෙකුත් වැඩසටහන් අතර වේ.

කැලණිය විශ්වවිද්‍යාලයේ නව ගෘහස්ථ ක්‍රීඩාංගනය 2019 අගෝස්තු මාසයේ දී එළැඹි විශ්වවිද්‍යාලයේ 60වැනි සංවත්සරයට සමගාමීව විවෘත කරන ලදී. එමෙන්ම කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් වන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 90වැනි සංවත්සරය ද මේ වසරේ දී යෙදී ඇත.

විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින්ගේ කලාත්මක හා සාහිත්‍යය කුසලතා වැඩිදියුණු කිරීමේ පරමාර්ථය ඇතිව කලා කවුන්සිලය මගින් තුන්වැනි වරට ද රිකිල්ල- *Sprout* (කළණ) 2019 නාට්‍ය, මාධ්‍ය, කලා හා සාහිත්‍යය තරඟය සංවිධානය කර පවත්වන ලදී. එක් එක් කාණ්ඩයේ පළමු ස්ථානය දිනා ගත් ජයග්‍රාහකයින් සඳහා සම්මාන ප්‍රදානය කළ අතර සෑම කාණ්ඩයකම පළමු, දෙවැනි සහ තෙවැනි ස්ථාන දිනා ගත් ජයග්‍රාහකයින්ට වටිනා මුදල් ත්‍යාග සහ සහතිකපත්‍ර ද ප්‍රදානය කරන ලදී.

මෙම වැඩසටහන්වලට අමතරව, ජේත්තුකාර අලෙවිකරු මෝස්තර නිරූපණ ප්‍රදර්ශනය, අන්තර්-විශ්වවිද්‍යාල හොඳම කථිකයා තරඟය, චිත්‍ර ප්‍රදර්ශන, විශ්වවිද්‍යාල වේදිකා නාට්‍ය උළෙළ, ඡායාරූප ප්‍රදර්ශන, මාධ්‍ය උළෙළ, නිපුණතා ප්‍රදර්ශන, වර්ණ සම්මාන උළෙළ,රුක් රෝපණ වැඩසටහන්, රැකියා පොළ 2019, සුභසාධන ව්‍යාපෘති සහ වැඩමුළු කීපයක් 2019 වසරේ දී පැවැත් වූ විෂය බාහිර ක්‍රියාකාරකම් අතර විය.

සෑම පීඨයකම ශිෂ්‍යයින් 2019 වසර තුළ දී පැවැත් වූ ජාතික හා අන්තර්ජාතික ක්‍රීඩා හා තරඟාවලීන්ට සහභාගී වූ අතර කැලණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයින් ජාතික සහ අන්තර්ජාතික සම්මාන කිහිපයක්ම

දිනා ගනු ලැබූයේ විශ්වවිද්‍යාලයට කීර්තියක් දිනා දෙමිනි. 2019 අන්තර් විශ්වවිද්‍යාල ශූරතාවලියේ දී විශ්වවිද්‍යාලයට 4වැනි ස්ථානය දිනා ගැනීමට හැකිවිය.

විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය අධ්‍යයන අංශ, පීඨ හෝ සංවිධාන ලෙස විශ්වවිද්‍යාලය තුළ සංවිධානය කළ විවිධ ඉසව් සහ ක්‍රියාකාරකම් විශ්වවිද්‍යාලය කීර්තිය ඉහළ නැංවීමට පමණක් නොව විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නිපුණතා සහ කුසලතා විදහා පෙන්වීමට ද දායක විය.

## 1.3. ඉදිරි සැලසුම්

යටිතල පහසුකම් සංවර්ධනය යටතේ පහත 1-1 වගුවේ දක්වා ඇති පරිදි ගොඩනැගිලි ව්‍යාපෘති කිහිපයක් යෝජනා කර ඇත.

*1-1වගුව: ඉදිරි සැලසුම්*

| කොන්ත්‍රාත්තුවේ නම | ඉල්ලා ඇති දිනය | 2020/12/31 දිනය තත්ත්වය |
|---|---|---|
| යෝජිත CKDU ගොඩනැගිල්ල නවීකරණය | 21/02/2019 | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති අතර වැඩ සිදු කරමින් ඇත |
| ලලිත කලා අධ්‍යයන අංශයේ සේනක බණ්ඩාරනායක විවෘත රඟහලේ යෝජිත නවීකරණයන් හා වෙනස්කිරීම් | 04/04/2019 | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත |
| පිරිපහදු යන්ත්‍රාගාරයේ යෝජිත පිරිපහදු යන්ත්‍රාගාර සේවකයින්ගේ කාමරය | 16/05/2019 | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත |
| වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ දැනුම් කේන්ද්‍රයේ යෝජිත වෙනස් කිරීම් | 13//12/2019 | ලේඛන සඳහා ප්‍රසම්පාදන කමිටු මට්ටම |

# 2. විශ්වවිද්‍යාලයේ පීඨ

කැලණිය විශ්වවිද්‍යාලයට වෙනස් අධ්‍යයනවලින් යුත් පීඨ හතක් ඇත. සෑම පීඨයක් සඳහාම ඉහළ ශික්ෂණයකින් යුත් හෝ විශ්වවිද්‍යාලය මඟින් මහජන උසස් අධ්‍යාපනය සඳහා හඳුන්වා දී ඇති අද්විතීය උපාධි වැඩසටහන් ඇත.

*2-1 වගුව: පීඨ සාරාංශය*

| පීඨය | ශිෂ්‍ය සංඛ්‍යාව | කාර්ය මණ්ඩලය සංඛ්‍යාව |
|---|---|---|
| වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය | 2,509 | 124 |
| පරිගණක හා තාක්ෂණ පීඨය | 569 | 20 |
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | 1,984 | -- |
| මානවශාස්ත්‍ර පීඨය | 2,517 | 108 |
| වෛද්‍ය පීඨය | 1,213 | 129 |
| විද්‍යා පීඨය | 2,093 | 130 |
| සමාජීය විද්‍යා පීඨය | 3,206 | 125 |
| **මුළු එකතුව** | **14,091** | **636** |

## 2.1. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

**මෙහෙවර**

කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ මෙහෙවර නම් ''ආයතනවල කළමනාකරණ ධූර භාර ගත හැකි අධ්‍යාපන අංශයෙන් හා වෘත්තීයභාවයෙන් දක්ෂ නිලධාරීන් බිහි කිරීමත්, ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීමත්, වාණිජ හා කළමනාකරණය යන විෂයයන් පිළිබඳ දැනුම පුළුල් කිරීමත්" වේ.

**පීඨය හැඳින්වීම**

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය දිවයිනේ විශිෂ්ටතම පීඨයක් බවට පත්වීමේ අද්විතීය ලක්ෂණ ඇතිව කැලණිය විශ්වවිද්‍යාලයේ සීඝ්‍රයෙන් සංවර්ධනය වෙමින් පවතින පීඨයකි. 1976 වසරේ දී සමාජීය විද්‍යා පීඨය යටතේ වාණිජ දෙපාර්තමේන්තුව පිහිටුවීම මෙම පීඨයේ ආරම්භය විය. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ, ශිෂ්‍යයන්ගේ සහ අනෙකුත් පරදුතබන්නන්ගේ කැපවීම හා උත්සාහය සමඟ 1995 වසරේ දී පීඨ තත්ත්වය අත්කර ගැනීමට හැකි විය.

**වර්තමාන ප්‍රගතිය**

***අධ්‍යයන වැඩසටහන්***

එවක පටන් පීඨය උපාධිධාරීන්ගේ සංඛ්‍යාවට වඩා ඔවුන්ගේ ගුණාත්මකභාවය අතින් විවිධ පාර්ශ්වයන්ගේ අවධානය හා විශ්වවිද්‍යාල ප්‍රජාව අතර ජනප්‍රියතාවක් දිනා ගැනිමට සමත් වී ඇත. මෙම ප්‍රගතියේ වර්ධනය පිළිබඳ විශිෂ්ඨතම සාක්ෂි කීපයක් පහත දැක්වේ. උපාධිධාරීන් රැකියාවල නිරතවීමේ ප්‍රතිශතය 85.5%ක් වන අතර දිවයිනේ විශ්වවිද්‍යාලවල කළමනාකරණ පීඨ අතර ඉහළම අගය වේ. අලෙවිකරණ අධ්‍යයන අංශය දිවයිනේ කළමනාකරණ විෂය පිරිනමන අනෙකුත් විශ්වවිද්‍යාල අතුරින් අයිඑස්ඕ තත්ත්ව සහතිකය හිමිකර ගත් එකම අධ්‍යයන අංශය වන අතර ඒ අනුව වර්තමානයේ දී අයිඑස්ඕ සහතික ලත් උපාධි වැඩසටහන් පිරිනමන එකම අධ්‍යයන අංශය ද වන අතර මූල්‍ය අධ්‍යයන අංශය මඟින් පිරිනමනු ලබන ව්‍යාපාර කළමනාකරණය (මූල්‍ය) පිළිබඳ විශේෂ උපාධි වැඩසටහන සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ වරලත් මූල්‍ය විශ්ලේෂණ ආයතනය මඟින් පිළිගැනීමක් හිමි විය. 2019 වසරේ දී පීඨය 'The Association to Advance Collegiate School of Business' ආයතනයේ සාමාජිකත්වය අත්කර ගෙන ඇති අතර මෙම පීඨයේ ගුණාත්මක ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපනයේ තවත් වැදගත් සන්දිස්ථානයකි.

වර්තමානයේ දී පීඨය අධ්‍යයන අංශ පහකින් (5) සමන්විත වන අතර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 126 දෙනෙක්, අනධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 30 දෙනෙක්ගෙන් සහ ප්‍රථම උපාධි අපේක්ෂකයින් 2561 දෙනෙක්ගෙන් සමන්විත වේ. වාණිජ හා මූල්‍ය කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ගිණුම්කරණය, අලෙවි කළමනාකරණය සහ මූල්‍ය යන අධ්‍යයන අංශ පහ මඟින් ව්‍යාපාර පරිපාලනවේදය පිළිබඳ ආචාර්ය උපාධිය වැඩසටහනට (DBA) අමතරව ප්‍රථම උපාධි වැඩසටහන් එකොළහක් (11), ශාස්ත්‍රපති උපාධි පාඨමාලා පහක් (05), පශ්චාත් උපාධි ඩිප්ලෝමා දෙකක් (02), ඩිප්ලෝමා වැඩසටහන් හතරක් (04) සහ උසස් ඩිප්ලෝමා හයක් (06) පිරිනමයි. 2019 වසරේ දී මූල්‍ය අධ්‍යයන අංශය මඟින් ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා මූල්‍ය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය හඳුන්වා දෙනු ලැබීය. ගිණුම්කරණ අධ්‍යයන අංශය මඟින් විගණනය හා අධිකරණ විද්‍යා ගිණුම්කරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය සහ ගිණුම්කරණ තොරතුරු පද්ධතිය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය හඳුන්වා දීමට නියමිත වන අතර පීඨය මඟින් ව්‍යාපාර තොරතුරු පද්ධති පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය හඳුන්වා දීමට නියමිතය.

පීඨය මඟින් අධ්‍යයන වාර පදනම් කර ගත් අධ්‍යයන වැඩසටහන් පිරිනමනු ලබන අතර 2013/2014 අධ්‍යයන වසර තුළ ක්‍රියාත්මක කළ විෂයමාලා සංශෝධනයත් සමඟ විෂය ක්ෂේත්‍රවල නවීනතම නැඹුරුතාවන්, අධ්‍යාපනඥයින් අතර වූ උනන්දුව සහ ගතික රැකියා වෙළඳපොළේ ඇති වර්තමාන ඉල්ලුම අනුව යමින් කටයුතු කරයි. පීඨය සිය විෂයමාලා නිරන්තරයෙන් සංශෝධනය කිරීමටත් සිය ප්‍රධාන අධ්‍යයන වැඩසටහන්වලට අමතරව ප්‍රජාවට ඉටු කරනු ලබන අතිරේක සේවාවක් ලෙස නව පාඨමාලා හඳුන්වාදීමටත් කරනු ලැබේ.

***අධ්‍යයන කාර්ය මණ්ඩලය***

පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සිය පර්යේෂණ ක්ෂේත්‍ර වැඩිදියුණු කර ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කරන අතර ඔවුන්ගේ පර්යේෂණ පර්යේෂණ ප්‍රකාශනවල පළ කිරීම හරහා අධ්‍යයන වැඩසටහන්වලට දායක වේ. 2019 වසරේ දී පීඨ කාර්ය මණ්ඩලය ආසන්න වශයෙන් ප්‍රකාශන 308ක් පමණ සිදු කර ඇති අතර අන්තර්ජාතික සම්මාන 01ක් සහ දේශීය සම්මාන 09ක් ඇතුළත් සම්මාන 10ක් දිනා ගැනීමට සමත් වී ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 43 දෙනෙක් ආචාර්ය උපාධි (PhD) සුදුසුකම් ද සාමාජිකයින් 98 දෙනෙක් ශාස්ත්‍රපති සුදුසුකම් ද ලබා ඇති අතර මොවුන්ගෙන් 27 දෙදෙනෙක් මේ වන විට සිය ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතුවල නිරත වෙයි.

***විෂය-බාහිර ක්‍රියාකාරකම්***

උපාධි අපේක්ෂකයින් විසින් පවත්වනු ලබන සුවිශේෂී විෂයබාහිර ක්‍රියාකාරකම් පීඨයේ සියලුම අධ්‍යයන අංශවල ක්‍රියාත්මක වේ. වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශය සංවිධානය කළ තරුණ ව්‍යවසායකයින්ගේ දිනය, මූල්‍ය අධ්‍යයන අංශය සංවිධානය කළ ආයෝජන සතිය, අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය සංවිධානය කළ ජේත්තුකාර අලෙවිකරු - මෝස්තර නිරූපණ දැක්ම, මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශයේ '3D's' නිපුණතා දැක්ම සහ ගණකාධිකරණ අධ්‍යයන අංශයේ "අයිඩියා නයිට්" - ආධුනිකත්ව සහතික ප්‍රදාන උළෙල සහ ICARE වැඩසටහන මෙම වසරේ දී පවත්වන ලද වැදගත් අවස්ථා වේ.

මෙම ධාරිතාවන් සහ පීඨයේ මෙහෙවර අනුව යමින් පීඨය දැනුම, නිපුණතා සහ ආකල්පවලින් පිරිපුන් රටේ ආර්ථිකය, සිවිල් සමාජය හා රාජ්‍ය අංශය ඉදිරියට ගෙන යන මෙන්ම සමාජයේ සුභසාධනය වෙනුවෙන් තීරණ ගන්නා ඉතා ඵලදායී විද්වතුන් හා වෘත්තිකයින් බිහි කිරීමට සිය සේවාව ඉටු කරයි. ඒ අනුව, පීඨය මඟින් මේ වන විට උපාධිධාරීන් 8000කට අධික සංඛ්‍යාවක් බිහි කර ඇති අතර ඔවුන්ගෙන් බහුතරය රාජ්‍ය හා පෞද්ගලික අංශවල ප්‍රමුඛ ස්ථානවල සේවය කරන අතර අපගේ උපාධිධාරීන් කීපදෙනෙක්ම දිවයිනේ ප්‍රමුඛ ව්‍යවසායකයින් බවට ද පත් වී ඇත.

**ආචාර්ය පීඑන්ඩී ප්‍රනාන්දු**
**පීඨාධිපති/ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

## 2.2. පරිගණක හා තාක්ෂණ පීඨය

පරිගණක හා තාක්ෂණ පීඨය (FCT) අංක 1947/24 දරන ශ්‍රී ලංකා රජයේ ගැසට් නිවේදන ප්‍රකාරව ව්‍යවහාර පරිගණක අධ්‍යයන අංශය, පරිගණක පද්ධති ඉංජිනේරු ශිල්පය පිළිබඳ අධ්‍යයන අංශය සහ මෘදුකාංග ඉංජිනේරු ශිල්පය පිළිබඳ අධ්‍යයන අංශය යන අධ්‍යයන අංශ තුනකින් සමන්විතව 2015 දෙසැම්බර් මස 30වැනි දින පිහිටුවන ලදී. නව පීඨය 2016 ජනවාරි මස 18වැනි දින එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී.

පීඨයේ අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයින් ලියාපදිංචි කිරීම 2015/ 2016 අධ්‍යයන වර්ෂයේ සිට ආරම්භ කරන ලදී. පීඨය තාක්ෂණික විෂය ධාරාවේ ශිෂ්‍යයින් සඳහා වූ උපාධි වැඩසටහන් වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (BICT) සහ ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (BET) 2015/16 අධ්‍යයන වර්ෂයේ සිට ආරම්භ කරන ලදී. 2016/17 අධ්‍යයන වර්ෂයේ සිට පීඨය පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය පිරිනැමීම ආරම්භ කරන ලදී.

මෙයට අමතරව, පීඨය අනෙක් පීඨවල අනන්‍ය පරිගණක අවශ්‍යතාවන් සම්බන්ධයෙන් ද කටයුතු කරනු ඇත. මෙය උපාධිධාරීන්ගේ සේවානියුක්තිභාවය පිළිබඳ ඉතා වැදගත් තීරණාත්මක කරුණක් ලෙස හඳුනා ගෙන ඇති අනෙක් පීඨවල උපාධි අපේක්ෂකයින්ගේ පරිගණක සාක්ෂරතාව හා පරිගණක භාවිතය වැඩිදියුණු කිරීමට ඉවහල් වනු ඇත.

පීඨය මඟින් පරිගණක විද්‍යාව, මෘදුකාංග ඉංජිනේරු ශිල්පය, තොරතුරු තාක්ෂණය හා ඉංජිනේරු තාක්ෂණය යන විෂය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පශ්චාත් උපාධි වැඩසටහන් ද පිරිනැමීමට නියමිතය. අධ්‍යාපනය පිළිබඳ තොරතුරු තාක්ෂණ ශාස්ත්‍රපති වැඩසටහන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගුරුවරුන් පුහුණු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් ගොඩනගා ඇත. මෙම වැඩසටහන 2019 වසරේ සිට ආරම්භ කිරීමට නියමිතය.

පීඨය වැදගත් බලපෑම් ඇති විවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ පවත්වනු ඇත. පරිගණක හා තාක්ෂණ පීඨයේ පර්යේෂණ ව්‍යාපාරය මූලික පරිගණක විද්‍යා පර්යේෂණවල සිට සමස්තයක් ලෙස කර්මාන්තයට හා සමාජයට අදාළ යෙදවුම් සහිත නව තාක්ෂණය ගොඩනැගීම සඳහා ව්‍යාප්ත කරනු ලැබේ. නව තාක්ෂණය සොයා ගැනීම හා නිර්මාණය පරිගණක හා තාක්ෂණය පිළිබඳ ආචාර්ය උපාධි වැඩසටහන්වල හරය වේ. පීඨය පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන කීපයක් පිහිටුවීමේ ක්‍රියාවලියක ද නිරත වෙමින් ඇත.

පහත දැක්වෙන පර්යේෂණ මධ්‍යස්ථාන දැනටමත් පිහිටුවා ඇත:

- නැනෝ තාක්ෂණ මධ්‍යස්ථානය සහ
- ජාතික ඉ-ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය (NELRC)

පරිගණක හා තාක්ෂණ පීඨය නුදුරු අනාගතයේදීම පහත දැක්වෙන පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීමට සැලසුම් කරයි:

- භාෂා ඉංජිනේරු පර්යේෂණ මධ්‍යස්ථානය
- ජියෝඉන්ෆොමැටික්ස් මධ්‍යස්ථානය
- පරිගණක ගණිත මධ්‍යස්ථානය
- දත්ත විද්‍යා මධ්‍යස්ථානය
- සයිබර් ආරක්ෂාව සඳහා වූ මධ්‍යස්ථානය

පරිගණක හා තාක්ෂණ පීඨය මඟින් පහත දැක්වෙන පරමාර්ථ ඇතිව පරිගණක හා තාක්ෂණය සඳහා වූ කර්මාන්ත කටයුතු කුටිය (IICfCT) පිහිටුවා ඇත:

1. ජාතික ආර්ථිකයේ සංවර්ධනය උදෙසා විශ්වවිද්‍යාලයේ සිටින පරිගණක හා තාක්ෂණ විද්වතුන්ගේ ප්‍රවීණත්වය දායක කිරීම දිරිමත් කිරීම පිණිස
2. රාජ්‍ය හා කුඩා හා ක්ෂුද්‍ර ව්‍යවසායකින් සඳහා අවශ්‍ය පරිගණක පාදක පද්ධති දැරිය හැකි පිරිවැයක් යටතේ ගොඩනැගීම පිණිස.
3. තථ්‍ය වෙළඳපොළ රැකියා අවස්ථාවන් සලසා දෙමින් ශිෂ්‍යයින් සඳහා පුහුණු අවස්ථා ලබා දීම.
4. පර්යේෂණ හා සංවර්ධන කටයුතු වෙනුවෙන් පරිගණක හා තාක්ෂණ පීඨය සමඟ අනුබද්ධවීම පිණිස බාහිර විද්වතුන් දිරිමත් කිරීම.

මේ වනවිට පරිගණක හා තාක්ෂණ පීඨය නො. 407, නුවර පාර, කැලණිය යන ලිපිනයේ පිහිටා ඇත. පීඨය සඳහා යෝජිත ගොඩනැගිලි සංකීර්ණය ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය සහයෝගය ඇතිව කැලණිය, මුඩුනැලේ ප්‍රදේශයේ ඉදිකිරීමට නියමිතය.

***තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධි වැඩසටහන***

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය වසර හතරක උපාධි වැඩසටහනකි. සාමාන්‍ය ශිෂ්‍ය බඳවා ගැනීම 75කි. උසස් පෙළ තාක්ෂණික විෂයධාරාව හදාරා ඇති ශිෂ්‍යයින් මෙම වැඩසටහනට ලියාපදිංචි වීමට සුදුසුකම් ලබති. මෙම උපාධි වැඩසටහන මඟින් ශිෂ්‍යයින්ට මෘදුකාංග ගොඩනගන්නන්, ජාල පරිපාලකයින් හා තොරතුරු සහ සන්නිවේදන වෘත්තිකයින් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය කුසලතා, දැනුම හා ආකල්ප ගොඩනගා ගැනීමට උපකාර වනු ඇත. ඉලෙක්ට්‍රොනික සහ දත්ත සන්නිවේදනය පිළිබඳ ශක්තිමත් මූලික දැනුම සහ උපස්තම්භක විද්‍යාගාර සැසි කර්මාන්ත ප්‍රමිති මෘදුකාංග සහ පරිගණක ජාල නිර්මාණය කිරීමට, ගොඩනැගීමට හා පවත්වා ගෙන යාමට අවශ්‍ය කුසලතා ලබා දෙයි. වර්චුවලයිසේෂන් සහ ක්ලවුඩ් කම්පියුටින් (Virtualization and Cloud Computing), ජාල කළමනාකරණය, රැහැන් රහිත හා ජංගම සන්නිවේදනය, පරිගණක ආරක්ෂාව,

වෙබ් වැඩසටහන්කරණය, ජංගම යෙදවුම් සංවර්ධනය, පරිගණක ක්‍රීඩා සහ පණගැන්වීම, අතාත්වික යථාර්ථය (Virtual Reality) වැනි විශේෂිත යෙදවුම් ක්ෂේත්‍ර විෂයමාලාවට ඇතුළත් කර ගැනීම මඟින් ශිෂ්‍යයින්ට තමන් රුචි විෂය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂීකරණයවීම සඳහා නම්‍යශීලී ඉඩප්‍රස්ථා සලසයි. විෂයමාලාවේ පළමු වසර දෙක තුළ දී තොරතුරු සන්නිවේදන වෘත්තිකයෙක්ගෙන් අපේක්ෂා කරන පොදු නිපුණතා වර්ධනය කිරීමට ඉලක්ක කරන අතර අවසන් වසර දෙක ඇතුළත තෝරා ගත් විශේෂීකරණ ක්ෂේත්‍රවල සුවිශේෂී කුසලතා ගොඩනැඟීමට කටයුතු කරයි. මේ වන විට පිරිනමන විශේෂීකරණ ක්ෂේත්‍ර නම් :

- පරිගණක ජාලකරණය
- මෘදුකාංග පද්ධති
- ක්‍රීඩා සහ පණගැන්වීම

4වැනි වසරේ ඇති ආධුනිකත්ව මොඩියුලය හරහා ශිෂ්‍යයින්ට කර්මාන්තය තුළ මාස හයක කාලයක් සේවය කිරීමට අවස්ථාව ලැබෙනු ඇත. උපදෙස් හා විභාග මාධ්‍ය ඉංග්‍රීසි වේ.

***ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන***

ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය වයස හතරක උපාධි වැඩසටහනකි. මෙම උපාධිය සඳහා සාමාන්‍ය බඳවා ගැනීම ශිෂ්‍ය සංඛ්‍යාව 75කි. උසස් පෙළ තාක්ෂණික විෂයධාරාව හදාරා ඇති ශිෂ්‍යයින් මෙම වැඩසටහනට ලියාපදිංචි වීමට සුදුසුකම් ලබති. මෙම ඉංජිනේරු තාක්ෂණ ගෞරව උපාධි වැඩසටහන උපාධි අපේක්ෂකයින් පුළුල් පරාසයක කර්මාන්ත යෙදවුම් සඳහා සූදානම් කරවීමේ අරමුණ ඇතිව විද්‍යාව හා තාක්ෂණයේ ප්‍රායෝගික යෙදවීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ඇත. විෂයමාලාවේ පළමු වසර දෙක ඉංජිනේරු තාක්ෂණික ශිල්පියෙන්ගෙන් අපේක්ෂා කරනු ලබන පොදු නිපුණතා ගොඩනැංවීම කෙරෙහි ඉලක්ක කරන අතර අවසාන වසර දෙක තෝරා ගත් විශේෂීකරණ ක්ෂේත්‍රවල නිශ්චිත නිපුණතා ගොඩනැංවීම සඳහා වෙන් කර ඇත. මේ වන විට පිරිනමනු ලබන විශේෂීකරණ ක්ෂේත්‍ර නම්:

- ද්‍රව්‍ය හා ක්‍රියාවලි ඉංජිනේරු ශිල්පය
- කාර්මික ස්වයංක්‍රීයකරණය සහ රොබෝ විද්‍යාව
- තිරසර තාක්ෂණික ශිල්ප ක්‍රම

කාර්මික ස්වයංක්‍රීයකරණය හදාරන ශිෂ්‍යයින්ට පරිගණක හෝ රෝබෝ වැනි පාලන පද්ධති භාවිතා කිරීමට අවශ්‍ය නිපුණතා ගොඩනඟා ගැනීමටත් කර්මාන්තයක ක්‍රියාවලි සහ යන්ත්‍රසූත්‍ර හසුරුවීම සඳහා

වූ තොරතුරු සන්නිවේදන තාක්ෂණය අධ්‍යයනය කිරීමටත් හැකියාව ලැබෙයි. ද්‍රව්‍ය සහ ක්‍රියාවලි ශික්ෂණ විශේෂීකරණය අමු ද්‍රව්‍ය සහ භාණ්ඩ ද්‍රව්‍ය වටිනා නිමැවුම් බවට පරිවර්තනය කිරීමට අවශ්‍ය සියලුම ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය සම්බන්ධයෙන් අවධානය යොමු කරන අතර තිරසර තාක්ෂණය ප්‍රවර්තන ගෝලීය හා දේශීය සමාජ-ආර්ථික ගැටළු සඳහා තිරසර විසඳුම් ගොඩනැගීම ඉලක්ක කරයි.

4වැනි වසරේ ඇති ආධුනිකත්ව මොඩියුලය හරහා ශිෂ්‍යයින්ට කර්මාන්තය තුළ මාස හයක කාලයක් සේවය කිරීමට අවස්ථාව ලැබෙනු ඇත. උපදෙස් හා විභාග මාධ්‍ය ඉංග්‍රීසි පමණක් වේ.

***පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන***

මෙය කැලණිය විශ්වවිද්‍යාලය මගින් පිරිනමන පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියට මඟපාදන වසර හතරක උපාධි වැඩසටහනකි. මෙම උපාධි වැඩසටහන සඳහා සාමාන්‍ය බඳවා ගැනීම ශිෂ්‍යයින් 50කි. උසස් පෙළ විද්‍යා විෂයධාරාව හදාරා ඇති ශිෂ්‍යයින් මෙම වැඩසටහනට ලියාපදිංචි වීමට සුදුසුකම් ලබති. පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියේ පාඨමාලා ව්‍යුහය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පරිගණක පිළිබඳ ස්ථාවර කමිටුවේ නිර්දේශ, පරිගණක යාන්ත්‍රණය සඳහා වූ සංවිධානයේ (ACM) සහ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ශිල්පය පිළිබඳ ආයතනයේ (IEEE) මාර්ගෝපදේශවලට අනුකූල වන ලෙස සකස් කර ඇත.

මෙම උපාධි වැඩසටහන ශිෂ්‍යයින්ට මෘදුකාංග කර්මාන්තය තුළ කටයුතු කිරීමට, පර්යේෂණ පැවැත්වීමට සහ පරිගණක විද්‍යව පිළිබඳ දැනුම බෙදාහැරීමට අවශ්‍ය නිපුණතා, දැනුම සහ ආකල්ප ගොඩනගා ගැනීමට උපකාරී වෙයි. න්‍යායාත්මක පරිගණක විද්‍යාව පිළිබඳ ගැඹුරු මූලික දැනුම සහ එයට අනුග්‍රහය දක්වන විද්‍යාගාර සැසි මඟින් කර්මාන්ත සම්මත මෘදුකාංග විශ්ලේෂණයට, නිර්මාණය කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ නඩත්තු කිරීමට අවශ්‍ය කරන නිපුණතා සහ දැනුම ලබා දෙයි. දත්ත සමුදාය පද්ධති, යාන්ත්‍ර ඉගෙනුම, දත්ත ආරක්ෂාව, අනුකූලතා පිළිබඳ න්‍යාය, සමාන්තර පරිගණකගත කිරීම, ඉහළ කාර්යසාධන පරිගණක ගත කිරීම, ඩිජිටල් අධිකරණ විද්‍යාව, අර්ථ විචාර වෙබ් සහ විද්‍යුත්-ව්‍යාපාර තාක්ෂණය, පරිගණක ක්‍රීඩි හා සජීවීකරණය, අතාත්වික යථාර්ථය (Virtual Reality) වැනි විශේෂිත යෙදවුම් ක්ෂේත්‍ර විෂයමාලාවට ඇතුළත් කර ගැනීම මගින් ශිෂ්‍යයින්ට තමන් රුචි විෂය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂීකරණයවීම සඳහා නම්‍යශීලී ඉඩප්‍රස්ථා සලසයි. ශිෂ්‍යයින්ට මෙම උපාධි වැඩසටහනේ විශේෂීකරණය සඳහා පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රවලින් එකක් තෝරා ගැනීමට හැකියාව ඇත:

- දත්ත විද්‍යාව
- කෘතීම බුද්ධිය
- සයිබර් ආරක්ෂාව
- විද්‍යාත්මක පරිගණක

4 වැනි වසරේ ඇති ආධුනිකත්ව මොඩියුලය හරහා ශිෂ්‍යයින්ට කර්මාන්තය තුළ මාස හයක කාලයක් සේවය කිරීමට අවස්ථාව ලැබෙනු ඇත. උපදෙස් හා විභාග මාධ්‍ය අනිවාර්යයෙන්ම ඉංග්‍රීසි වේ. අවසන් වසරේ දී සියලුම ශිෂ්‍යයින් ඔවුන්ගේ විශේෂීකරණ ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කළ යුතුය.

**පරිගණක හා තාක්ෂණය සඳහා වූ කාර්මික ගනුදෙනු කුටිය (IICfCT)**

කැලණිය විශ්වවිද්‍යාලයේ පරිගණක හා තාක්ෂණ පීඨය මඟින් ඉංජිනේරු හා පරිගණක කර්මාන්තවලට උපදේශන සේවා සැපයීම, නිපැයුම් සංවර්ධනය හා වෙළඳපොළ වෙත ඉක්මන් කරවීම, සහ කර්මාන්ත - පීඨ ව්‍යාපාර සබැඳි පිහිටුවීම සඳහා පරිගණක හා තාක්ෂණය සඳහා වූ කාර්මික ගනුදෙනු කුටිය ස්ථාපනය කර ඇත. පෞද්ගලික හා රාජ්‍ය හවුල්කාරත්වය හරහා IICfCT මඟින් කර්මාන්ත සඳහා විශ්වාසදායක හා පිරිවැය කාර්යක්ෂම විසඳුම් ලබාදීමට අදහස් කරන අතර විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ට ඉගෙනුම් අත්දැකීම් සලසා දෙමින්, පීඨ සාමාජිකයින් සඳහා සහයෝගාත්මක පර්යේෂණ ඉඩප්‍රස්ථා ද උදා කරයි. IICfCT එහි ව්‍යාපෘති රාශියක් සඳහා මානව සම්පත ලබා ගන්නේ පරිගණක හා තාක්ෂණ පීඨය මඟිනි. අද වන විට, පරිගණක හා තාක්ෂණ පීඨයට සම්බන්ධ කාර්ය මණ්ඩල සාමාජිකයින් පුද්ගලික හා රාජ්‍ය ආයතන සඳහා පරිගණක හා මෘදුකාංග විසඳුම් රාශියක් ලබා දී ඇත. එමෙන්ම IICfCT ශිෂ්‍යයින් සඳහා වෘත්තීය ක්‍රියාකාරකම් හා රැකියා නියුක්තිභාවය ඉහළ නැංවීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කරන අතර එමගින් ඔවුන්ගේ මෘදු නිපුණතා, දැනුම හා ආයතනික අංශය පිළිබඳ අවබෝධය වැඩිදියුණු කර ගැනීමට හැකියාව ලැබේ. ආචාර්ය පී ඩබ්ලිව් සමරසේකර වර්තමානයේ දී මෙම කුටියේ අධ්‍යක්ෂ ලෙස සේවය කරයි.

**ඉගෙනුම් කේන්ද්‍රීය අධ්‍යාපනය**

පීඨය මඟින් ශ්‍රී ලංකාවේ පළමු වරට එහි වැඩසටහන් සැකසීම හා ඉදිරිපත් කිරීම සඳහා ඉගෙනුම් කේන්ද්‍රීය අධ්‍යාපන ශික්ෂණ ශාස්ත්‍රය යොදා ගෙන ඇත. ඉගෙනුම් කේන්ද්‍රීයභාවය නිරූපණය කිරීම පිණිස කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ විෂයමාලාව සකස් කිරීම සඳහා ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ඔක්ස්ෆර්ඩ් ඉගෙනුම් ආයතනයේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සංවර්ධනය කිරීම පිළිබඳ සම්මාන

මහාචාර්යවරයෙක් වන මහාචාර්ය ලින් මැකල්පයින්ගේ මාර්ගෝපදේශය යටතේ ශ්‍රී ලංකාවේ දී සහ එක්සත් රාජධානියේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ දී වැඩමුළු මාලාවක් පවත්වන ලදී.

ඉගෙනුම් කේන්ද්‍රීය අධ්‍යාපන ප්‍රවේශය සක්‍රීය ඉගෙනීමක් ප්‍රවර්ධනය කරන අතර පන්ති කාමරය ඇතුළත මෙන්ම පිටත ශිෂ්‍ය ඉගෙනීම සවිබල ගන්වන කාර්යයන් සහ ක්‍රියාකාරකම් නිර්මාණය කිරීම සහ හසුරුවීම වැඩිවශයෙන් අවධාරණය කරයි. සක්‍රීය ඉගෙනුම සබල කරවීමට අවශ්‍ය අධ්‍යාපනික ක්‍රමය සාම්ප්‍රදායක දේශන පැවැත්වීමට වඩා වෙනස් වේ. ඉගෙනුම් කේන්ද්‍රීය අධ්‍යාපන ප්‍රවේශයේ දී ශිෂ්‍යයින්ගේ ස්වාධීන ඉගෙගනුමට පහසුකම් සැලසීම සඳහා වෙනස්ම උපදේශන හා ඇගයීම් උපායමාර්ග මාලාවක් යොදා ගනු ලැබේ. කථිකාචාර්යවරයා විසින් අපේක්ෂා කළ ඉගෙනුම් ප්‍රතිඵල අත්කර ගැනීම පිණිස කුඩා දේශනවලට අමතරව, භාවිතා කළ හැකි අන්තර් ක්‍රියාකාරී ශිල්ප ක්‍රම සමූහයක් අතුරින් යෝග්‍ය ශිල්ප ක්‍රම තෝරා ගනී. එමෙන්ම කථිකාචාර්යවරයා විසින් සමස්ත පාඨමාලා මොඩියුලය පුරාවටම කලින් නියම කළ අභිධාන මත පදනම්ව, එක් එක් ශිෂ්‍යයා විසින් අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල අත්කර ගැනීමේ මට්ටම ඇගයීම පිණිස විධිමත් හා සමාකලනීය වෙනස් ඇගයීම් උපායමාර්ග කට්ටලයක් ද භාවිතා කරනු ඇත. මෙමඟින් සාම්ප්‍රදායක අධ්‍යයන වාර අවසාන පරීක්ෂණ සඳහා අඩු වැදගත්කමක් ලබා දෙන අතර ශිෂ්‍යයින් විසින් මොඩියුලය මුළුල්ලේ අඛණ්ඩ ඇගයීම හරහා සැලකිය යුතු ලකුණු ප්‍රතිශතයක් අත්කර ගනු ඇත.

**කර්මාන්ත උපදේශන මණ්ඩලය**

පරිගණක හා තාක්ෂණ අධ්‍යයන පීඨය කර්මාන්තයේ සිටින කීර්තිමත් වෘත්තිකයින්ගෙන්, කර්මාන්ත සංගම්වල නියෝජිතයින්ගෙන් මෙන්ම වෘත්තීය සංගම්වල නියෝජිතයින්ගෙන් සැදුම්ලත් කර්මාන්ත උපදේශන මණ්ඩලයක් පිහිටුවා ඇත.

පරිගණක හා තාක්ෂණ අධ්‍යයන පීඨයේ කර්මාන්ත උපදේශන මණ්ඩලයේ කාර්ය භාරය වන්නේ පරිගණක හා තාක්ෂණ අධ්‍යයන පීඨයේ මෙහෙවර හා උපායාමාර්ගික පරමාර්ථ සකස් කිරීමේ හා අත්කර ගැනීමේ කාර්යයේ දී පරිගණක හා තාක්ෂණ අධ්‍යයන පීඨයට සහායවීම පිණිස පරිගණක හා තාක්ෂණ අධ්‍යයන පීඨය සහ කර්මාන්තය අතර මෙන්ම වෙනත් ආයතනික පාර්ශ්වකරුවන් අතර සබැඳියක් ලෙස කටයුතු කිරීමයි. එමෙන්ම එය පරිගණක හා තාක්ෂණ අධ්‍යයන පීඨයට කර්මාන්ත දැක්මේ සිට යෙදවුම් හා නිර්දේශ ලබාදීම සහ අධ්‍යයන වැඩසටහන්, පර්යේෂණ හා හවුල්කාරීත්වයන් සම්බන්ධයෙන් පීඨයට උපායමාර්ගික විධාන සඳහා මඟපෙන්වීම සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

සීබ්‍රා ටෙක්නොලොජීස් ලංකා (පුද්ගලික) සමාගමේ දිවයිනේ ප්‍රධානී/ ඉංජිනේරු අධ්‍යක්ෂ, අනුරාධ තෙන්නකෝන් මහතා කර්මාන්ත උපදේශන මණ්ඩලයේ වර්තමාන සභාපති ලෙස කටයුතු කරයි.

**ක්‍රියාකාරකම් පාදක පුහුණුව (OBT)**

පරිගණක හා තාක්ෂණ අධ්‍යයන පීඨය එහි සියලුම උපාධි අපේක්ෂකයින් සඳහා වාර්ෂික වැඩසටහනක් ලෙස ක්‍රියාකාරකම් පාදක පුහුණු වැඩසටහනක් හඳුන්වා දී ඇත. මෙම වැඩසටහන හරහා පීඨය සාම්ප්‍රදායක පන්ති කාමර පරිසරයේ සිට ශිෂ්‍යයින්ගේ ආකල්ප හා මනස වෙනස් කිරීමට, ජීවිතයේ අභියෝග දිනා ගැනීම සඳහා වටිනා ඉගෙනුම් අත්දැකීමක් ලබාදීමට සහ ඔවුන්ගේ වැඩ කාර්යසාධනය සම්බන්ධයෙන් ධනාත්මක බලපෑම් ඇති කිරීමට තවත් වැදගත් පියවරක් ගෙන ඇත.

කැලණිය විශ්වවිද්‍යාලයේ පරිගණක හා තාක්ෂණ අධ්‍යයන පීඨයේ තරුණ නායකයින් සඳහා වූ ක්‍රියාකාරගත පුහුණු වැඩසටහන 2017 සහ 2018 වර්ෂවල කළුතර පොලිස් පුහුණු විද්‍යාලයේ දී අති සාර්ථක අන්දමින පවත්වන ලදී. පීඨයේ පළමු වසර ශිෂ්‍යයින් වන උපාධි අපේක්ෂකයින්ගේ කණ්ඩායම් ගතිකත්වය හා පෞරුෂ සංවර්ධනය වැඩිදියුණු කිරීම පිණිස පීඨය මඟින් මෙම දෙදින අන්තර්ක්‍රියාකාරකම් සහිත වැඩසටහන සංවිධානය කරන ලදී. තරඟකාරී නායකත්වය පිළිබඳ නිපුණතා වැඩිදියුණු කිරීම, ජවසම්පන්න හා ඉහළ කාර්යසාධනයක් ඇති කණ්ඩායම් ගොඩනැගීම, විශ්වාසය ගොඩනැගීම, පෞරුෂය හා ස්වයං-විශ්වාසය ගොඩනැංවීම, විවිධ පරිසර තුළ ඵලදායී ලෙස වැඩ කිරීම, අභියෝගවලට මුහුණදීම හා සාර්ථකවීම, විවෘත මනසක් නිර්මාණය කිරීම, ඵලදායී හා කාර්යක්ෂම තීරණ ගැනීම සහ ශිෂ්‍යයින්ගේ අධ්‍යාපන හා පෞද්ගලික ජීවිතවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට අවශ්‍ය විවිධ වෙනත් වැදගත් නිපුණතා වැඩිවර්ධනය කිරීම කෙරෙහි මෙම වැඩසටහන ඉලක්ක කරන ලදී.

**වාර්ෂික සම්මන්ත්‍රණය**

කැලණිය විශ්වවිද්‍යාලයේ පරිගණක හා තාක්ෂණ අධ්‍යයන පීඨය මඟින් සංවිධානය කළ පරිගණක හා තාක්ෂණයේ ප්‍රගමනයන් පිළිබඳ කැළණිය අන්තර්ජාතික සම්මන්ත්‍රණය 2016 නොවැම්බර් මස 25වැනි දින කොළඹ ජයික් හිල්ටන් හෝටලයේ දී ආරම්භ විය. එහි දෙවැනි සම්මන්ත්‍රණය 2017 ජුලි මස 25වැනි දින කැලණිය විශ්වවිද්‍යාලයේ දී පවත්වන ලද අතර තෙවැනි පරිගණක හා තාක්ෂණයේ ප්‍රගමනයන් පිළිබඳ කැළණිය අන්තර්ජාතික සම්මන්ත්‍රණය 2018 ජුලි මස 26වැනි දින වත්තල, පෙගාසස් රීෆ් හෝටලයේ දී පවත්වන ලදී.

මෙම සම්මන්ත්‍රණය මඟින් පරිගණක, නැනෝ තාක්ෂණය, ද්‍රව්‍ය හා ක්‍රියාවලි ඉංජිනේරු ශිල්පය, රෝබෝ විද්‍යාව හා ස්වයංක්‍රීයකරණය පිළිබඳ සියලුම අංශවල වර්තමාන වැඩ කටයුතු හා මෑත කාලීන ජයග්‍රහණ සාකච්ඡා කිරීම, බෙදාහදා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම පිණිස ශාස්ත්‍රීය, රාජ්‍ය, කර්මාන්ත හා රාජ්‍ය-නොවන සංවිධානවල පර්යේෂකයින්, අධ්‍යාපනඥයින්, ශිෂ්‍යයින්, වෘත්තිකයින්, තාක්ෂණිකවේදීන් හා ප්‍රතිපත්ති සම්පාදකයින් එක්රැස් කිරීමට අපේක්ෂා කරයි.

**ව්‍යවහාරික පරිගණක අධ්‍යයන අංශය**

ව්‍යවහාරික පරිගණක අධ්‍යයන අංශය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විද්‍යාවේදී උපාධි සහ ඉංජිනේරු තාක්ෂණ විද්‍යාවේදී උපාධි වැඩසටහන් සඳහා ප්‍රධාන දායකත්වයක් දක්වනු ඇත. යෝජිත ඒකාබද්ධ ප්‍රධාන පරිගණක උපාධි පිරිනැමීමේ දී සහ අනෙක් පීඨ මඟින් පිරිනමන දැනට පවතින උපාධි වැඩසටහන්වලට අවශ්‍ය පාඨමාලා මොඩියුල පිරිනැමීමේ දී ද මෙම අධ්‍යයන අංශය සම්බන්ධීකරණ ඒකකය වනු ඇත. කෘෂිකර්මය, අධ්‍යාපනය, සෞඛ්‍ය රැකවරණය, ප්‍රවාහනය ආදී වෙනත් විශේෂිත ක්ෂේත්‍ර සඳහා පරිගණක තාක්ෂණය යොදා ගැනීම මෙම අධ්‍යයන අංශයේ ප්‍රධාන ඉලක්කය වේ. ප්‍රථම උපාධි වැඩසටහන්වලට අමතරව, අධ්‍යයන අංශය පරිගණක හා තාක්ෂණ පීඨයේ පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා ද දායකත්වයක් දක්වයි. මෙම අධ්‍යයන අංශය පරිගණක හා තාක්ෂණය සඳහා වූ කාර්මික ගනුදෙනු කුටිය (IICfCT) සඳහා වැඩි දායකත්වයක් දක්වන අතර පරිගණක හා තාක්ෂණ පීඨය මඟින් යෝජිත පර්යේෂණ මධ්‍යස්ථාන සඳහා අනුග්‍රහය දක්වයි.

**පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයන අංශය**

පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයන අංශය පීඨය මඟින් පවත්වනු ලබන පරිගණක හා තාක්ෂණ උපාධි වැඩසටහන් සඳහා පරිගණක සම්බන්ධ සියලුම මූලික පාඨමාලා මොඩියුල පිරිනමයි. පරිගණකතගත ගණිතය, කෘතීම බුද්ධිය, පරිගණක පද්ධති, පරිගණක ජාල හා දත්ත ආරක්ෂාව අධ්‍යයන අංශය මඟින් විශේෂීකරණය ලබන මූලික ක්ෂේත්‍ර කිහිපයකි. ප්‍රථම උපාධි වැඩසටහන්වලට අමතරව, අධ්‍යයන අංශය පරිගණක හා තාක්ෂණ පීඨයේ යෝජිත පශ්චාත් උපාධි වැඩසටහන් වැඩසටහන් සඳහා ද දායකත්වයක් දක්වයි. අදාළ සුදුසුකම් ඇති උපාධිධාරීන්ට අධ්‍යයන අංශයේ දර්ශනපති හා දර්ශනශූරී උපාධි දක්වා උසස් අධ්‍යාපනය හැදෑරීමට හැකිය. තව ද, මෙම අධ්‍යයන අංශය පරිගණක හා තාක්ෂණය සඳහා වූ කාර්මික ගනුදෙනු කුටිය (IICfCT) සඳහා වැඩි දායකත්වයක් දක්වන අතර පරිගණක හා තාක්ෂණ පීඨය මඟින් යෝජිත පර්යේෂණ මධ්‍යස්ථාන සඳහා අනුග්‍රහය දක්වයි.

**මෘදුකාංග ඉංජිනේරු අධ්‍යයන අංශය**

මෘදුකාංග ඉංජිනේරු අධ්‍යයන අංශය 2015 දෙසැම්බර් මස 30වැනි දින පරිගණක හා තාක්ෂණ පීඨය ස්ථාපිත කිරීම සමඟ ආරම්භ විය. මෙම අධ්‍යයන අංශය අනෙකුත් අධ්‍යයන අංශ දෙක හා සම්බන්ධීකරණය වෙමින් පීඨය මඟින් පිරිනමන උපාධි වැඩසටහන් සඳහා සියලුම මූලික හා වෛකල්පිත පාඨමාලා මොඩියුල පිරිනමනු ඇත. මෘදුකාංග ඉංජිනේරු ශිල්පය, දත්ත විද්‍යාව හා මානව පරිගණක ගනුදෙනු අධ්‍යයන අංශය විශේෂීකරණය වන ක්ෂේත්‍ර කිහිපයක් වේ. මෙයට අමතරව, පරිගණක සම්බන්ධයෙන් ශික්ෂණය හා සහාය සේවා සැපයීම හරහා මෙම අධ්‍යයන අංශය අනෙක් පීඨවලට ද සිය සේවා දිගු කරයි. එමෙන්ම අධ්‍යයන අංශය යෝජිත පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා ද සක්‍රීයව දායක වනු ඇත. අනාගත උපාධිධාරීන්ට අධ්‍යයන අංශයේ දර්ශනපති හා දර්ශනශූරී උපාධි දක්වා උසස් අධ්‍යාපනය හැදෑරීමට හැකිය. තව ද, මෙම අධ්‍යයන අංශය පරිගණක හා තාක්ෂණය සඳහා වූ කාර්මික ගනුදෙනු කුටිය (IICfCT) සඳහා වැඩි දායකත්වයක් දක්වන අතර පරිගණක හා තාක්ෂණ පීඨය මඟින් යෝජිත පර්යේෂණ මධ්‍යස්ථාන සඳහා අනුග්‍රහය දක්වයි.

**පරිගණක හා තාක්ෂණ පීඨ ශිෂ්‍යයෙක් බිස්මයින්ඩ්ස් 2019 (BIZMINDS'19) තරඟයේ දෙවැනි ස්ථානය දිනා ගැනීම.**

කැලණිය විශ්වවිද්‍යාලයේ පරිගණක හා තාක්ෂණ පීඨයේ උපාධි අපේක්ෂකයෙක් BIZMINDS'19-අන්තර් විශ්වවිද්‍යාල සහ අන්තර් පාසැල් සැලසුම් තරඟයේ 2වැනි ස්ථානය දිනා ගත්තේ වෙනත් විශ්වවිද්‍යාල කිහිපයකම තරඟකරුවන් අභිභවා යමිනි.

පීඨයේ 3වැනි වසරේ උපාධි අපේක්ෂකයෙක් වන චමිල් රවිඳු ගීකියනගේ වාහනවල පිටකුරු විමෝචනය වැඩිදියුණු කිරීම සඳහා විප්ලවීය නිපැයුමක් ගොඩනඟා ඇති අතර එමඟින් හානිකර පිටකුරු වායුව කැපී පෙනෙන ලෙස අවම කරයි. චමිල්ගේ ව්‍යාපාර සැලසුම මඟින් වෛකල්පිත හා තිරසර බලශක්ති මූලාශ්‍රයක් ලෙස පරිසර හිතකාමී, කාබන්ඩයොක්සයිඩ් රහිත ඉන්ධන ලබා දෙන මෙම ඉතා කාර්යක්ෂම සහ ස්වයංක්‍රීය විද්‍යුත් විච්ඡේදක කෝෂය වාණිජකරණයට ඉලක්ක කර තිබුනි.

චමිල්ගේ ව්‍යාපාර සැලසුම පීඨයේ පරිගණක හා තාක්ෂණය සඳහා වූ කර්මාන්ත කටයුතු කුටිය (IICfCT) මඟින් සකස් කළ ව්‍යවසායකත්වය, අලෙවිකරණය සහ මූල්‍යසම්පාදනය පිළිබඳ සම්පත්, උපදේශන සහාය සහ දැනුම ලබා දෙන අතර නවීන තාක්ෂණය කේන්ද්‍රකර ගනිමින් ශිෂ්‍යයින් විසින් ව්‍යාපාර සැලසුම් නිර්මාණය කිරීමේ වැඩසටහනක කොටසක් වේ.

BIZMINDS කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශයේ තරුණ ව්‍යවසායකයින්ගේ සංගමය මගින් සංවිධානය කරනු ලබන වාර්ෂික තරඟයකි. මෙම තරඟය ඔස්සේ තරුණ ව්‍යවසායකයින්ට සිය ව්‍යාපාර අදහස් සහ සැලසුම් ව්‍යවසායක චින්තනයක් කරා වර්ධනය කර ගැනීමට වේදිකාවක් සලසයි.

**ආචාර්ය පීජී විජයරත්න**
**පීඨාධිපති/ පරිගණක හා තාක්ෂණ පීඨය**

## 2.3. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

**දැක්ම**

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ දැක්ම අතීතයේ සිට අධ්‍යාපනයේ අරමුණ සම්බන්ධයෙන් වූ සංකල්පය මත පදනම් වී ඇත: නත්ථි විජ්ජා සමාම් පානා (පාලි) (Natthi vijjaa Sama.m pa~n~naa) 'දැනුමට සමාන කිසිදු බලයක් නොමැත' නැතහොත් ipsa scientia potestas est [ලතින්] 'දැනුම බලය වේ.' එබැවින් සිය ශිෂ්‍යයින් විවිධ ක්ෂේත්‍රවල දැනුම උකහා ගනිමින්, පර්යේෂණ සඳහා දක්වන කැපවීම, නව අදහස් සඳහා ඇති විවෘතභාවය සහ විශ්ලේෂණ නිපුණතාවල සමත්භාවය හරහා ලෝකය වඩාත් විශිෂ්ට ස්ථානයක් බවට පත් කිරීම සඳහා දැනුම අත්පත් කර ගනු ඇතැයි පීඨය අපේක්ෂා කරයි.

**මෙහෙවර**

පශ්චාත් උපාධි මට්ටමේ දී පර්යේෂණ දිරිමත් කිරීම සහ දැනුම බෙදාහැරීම පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ මෙහෙවර වේ. පශ්චාත් උපාධි අධ්‍යාපනයේ විශිෂ්ටතා ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් පීඨය විශ්වවිද්‍යාලයේ සියලුම පීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩලය, ශිෂ්‍යයින් හා පරිපාලන කාර්ය මණ්ඩලය සමඟ කටයුතු කරයි. කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යාපනය බෙදා හදාගත් අත්දැකීමකි. පීඨය එහි ශිෂ්‍යයින් සඳහා ගතික බුද්ධිමය පරිසරයක් නිර්මාණය කර ගැනීම පිණිස ශාස්ත්‍රපති, දර්ශනපති සහ දර්ශනශූරී මට්ටම්වල උපාධි වැඩසටහන් සැලසීම පිණිස විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අංශ සම්බන්ධීකරණය කරමින් කටයුතු කරයි.

**පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මඟින් පිරිනමන වැඩසටහන්**

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය පශ්චාත්-උපාධි ඩිප්ලෝමා මට්ටමේ සිට දර්ශනපති උපාධිය දක්වා වූ විවිධ වැඩසටහන් රාශියක් පිරිනමනු ලබයි. වර්තමානයේ දී විවිධ පීඨ හා ආයතන මඟින් පිරිනමනු ලබන ශාස්ත්‍රපති උපාධිය දක්වා වූ වැඩසටහන් පනස් දෙකකට අධික සංඛ්‍යාවක් ඇත. ඇතැම් පාඨමාලා වැඩවලට (coursework) පමණක් සීමා වන අතර ඇතැම් පාඨමාලා පර්යේෂණ මත ද තවත් ඒවා පාඨාමාලා වැඩ හා පර්යේෂණ යන අංශ දෙකේම මිශ්‍රණයක් ද වේ. පශ්චාත් උපාධි අධ්‍යාන පීඨයේ පාඨමාලා වැඩ (coursework) යන්නෙන් සාම්ප්‍රදායක විශ්වවිද්‍යාලයක දී මෙන් ගුරු-ශිෂ්‍ය මුහුණට මුහුණ ශික්ෂණය අදහස් වේ. දැනටමත් රැකියාවල නියුතු තැනැත්තන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන් සාමාන්‍යයෙන් සති අන්ත හෝ සවස් භාගයේ දී පැවැත්වේ. පීඨයට ඇති

ප්‍රවේශය තවදුරටත් වැඩි දියුණු කිරීම පිණිස පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය නුදුරු අනාගතයේ දීම දුරස්ථ අධ්‍යාපන මොඩියුල දියත් කිරීම සඳහා අපේක්ෂාවෙන් සිටියි..

කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය යටතේ අදාළ අධ්‍යයන මණ්ඩල අනුව දර්ශනපති සහ දර්ශනශූරී මට්ටම්වල පශ්චාත්-උපාධි අධ්‍යයනය සඳහා හැකියාවන් තිබේ. පර්යේෂණ සිදු කිරීමේ දී අයදුම්කරුවන්ට මාර්ගෝපදේශය සැලසීම සඳහා සෑම ශිෂ්‍යයෙක් සඳහාම අධීක්ෂකවරයෙක් පත් කරනු ලැබේ. පර්යේෂණ වැඩසටහනේ පරමාර්ථ ඉටු කර ගැනීම වෙනුවෙන් අයදුම්කරු සහ අධීක්ෂකවරයා යන දෙදෙනාම එක්ව කටයුතු කරයි.

**ආචාර්ය උපාධි වැඩසටහන් (දර්ශනශූරී උපාධිය/ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය/DM)**

ආචාර්ය උපාධිය ශිෂ්‍යයෙක්ට ලබා ගත හැකි ඉහළම මට්ටමේ උපාධිය වේ. දර්ශනශූරී/ DBA/MD උපාධියක් සඳහා අධ්‍යයන කාලය වසර තුනක් වන අතර අධීක්ෂක/ අධීක්ෂකවරුන්ගේ නිර්දේශය මත මෙම කාලය දීර්ඝ කර ගැනීම සඳහා හැකියාව ඇත. ආචාර්ය උපාධි ඉල්ලුම්කරුවන් විසින් පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයට පර්යේෂණ යෝජනාවක් භාර දිය යුතුය. ඉතා උසස් ගුණාත්මක මුල් (original) පර්යේෂණ හරහා විශේෂ අධ්‍යයන ක්ෂේත්‍රයක් තුළ හරයාත්මක දැනුමක් උත්පාදනය කිරීම පිණිස හැකියාව ඇති පුද්ගලයෙක් නිර්මාණය කර ගැනීම මෙම සුදුසුකමේ පරමාර්ථය වේ. සුදුසුකම් සපුරන්නා විසින් සම්යුරු සමාලෝචනය කළ සූචිගත කළ ජර්නලවල ප්‍රකාශයට පත් කිරීම මඟින් නව දැනුම උත්පාදනය සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. ආචාර්ය උපාධියක් සඳහා අපේක්ෂකයෙක් මෙම SLQF මට්ටමේ හෝ ඊට සමාන සුදුසුකම් ඇති අධීක්ෂකවරයෙක්ගේ මාර්ගෝපදේශය යටතේ ඉහළ මට්ටමේ පර්යේෂණයක් පැවැත්වීම සහ නව දැනුම නිර්මාණය කරමින් කැපී පෙනෙන සහ මුල් අධ්‍යයන දායකත්වයක් දැක්වීමට අවශ්‍ය කරයි. අපේක්ෂකයා විසින් තක්සේරු කර, පිළිගත් පර්යේෂණ සොයා ගැනීම් අන්තර්ගත කළ නිබන්ධනයක් භාර දිය යුතුය.

එමෙන්ම පූර්ව සූදානම් කටයුතු ලෙස හෝ පර්යේෂණය සඳහා වටිනාකම් එකතු කිරීමක් ලෙස අපේක්ෂකයා විසින් පාඨමාලා වැඩ හැදෑරිය යුතු බවට නියම කළ හැකිය. කෙසේවුව ද, මෙම පාඨමාලා වැඩ සුදුසුකම සඳහා එකතු කරන ලකුණුවලට දායක කර නොගනී. පර්යේෂණය සම්පූර්ණයෙන්ම විෂය-පාදක හෝ බහුවිෂය විය යුතුය. සුදුසුකම් ලාභියාට නව දැනුම ගොඩනැඟීම කෙරෙහි වැදගත් දායකත්වයක් ඇති ස්වාධීන පිරිසිදු සහ/හෝ ව්‍යවහාරික පර්යේෂණයක් සැලසුම් කිරීමට සහ සිදු කිරීමට හැකියාව තිබිය යුතු වන අතර අදාළ විශේෂීකරණ ක්ෂේත්‍රය තුළ වෙනත් තැනැත්තන් විසින් සිදු කර

ඇති මුල් පර්යේෂණ අධීක්ෂණය කිරීමට, ඇගයීමට හැකි විය යුතුය. ඔහු/ ඇය අදාළ විෂය ක්ෂේත්‍රයේ ප්‍රවර්තන ගැටළු සම්බන්ධයෙන් විචක්ෂණ දැනුවත්භාවයක් ප්‍රදර්ශනය කළ යුතු වන අතර වෘත්තීය පරිචයට අදාළ ශිල්ප ක්‍රම භාවිතා කළ යුතුය.

**දර්ශනපති උපාධිය (MPhil)**

දර්ශනපති උපාධි අධ්‍යයනය සඳහා වසර දෙකක කාලයක් ගත වන අතර මෙම වැඩසටහන සඳහා මූලික වශයෙන්ම පර්යේෂණ ඇතුළත් වේ. අධීක්ෂණයකින් තොරව උසස් ගුණාත්මක මට්ටමේ මුල් පර්යේෂණ සිදු කිරීමේ හැකියාව ඇති පුද්ගලයෙක් බිහිකර ගැනීම මෙම සුදුසුකමේ පරමාර්ථය වේ. දර්ශනපති උපාධිය සඳහා අපේක්ෂකයෙක් විසින් ඊට සමාන හෝ ඉහළ සුදුසුකම් සපුරා ඇති තැනැත්තෙක්ගේ මාර්ගෝපදේශය යටතේ ඉහළ මට්ටමේ පර්යේෂණ සිදු කිරීමත් විශේෂිත විෂයක් හෝ ක්ෂේත්‍රයක් සඳහා වැදගත් දායකත්වයක් දැක්වීමත් අවශ්‍ය කරයි. පර්යේෂණය සම්පූර්ණයෙන්ම විෂය-පාදක හෝ බහුවිෂය පාදක විය හැකිය. අපේක්ෂකයා විසින් පර්යේෂණ සොයා ගැනීම් ඇතුළත් නිබන්ධනයක් භාර දිය යුතු වන අතර එය තක්සේරු කර පිළිගනු ලැබේ. එමෙන්ම පූර්ව සූදානම් කටයුතු ලෙස හෝ පර්යේෂණය සඳහා වටිනාකම් එකතු කිරීමක් ලෙස අපේක්ෂකයා විසින් පාඨමාලා වැඩ හැදෑරිය යුතු බවට නියම කළ හැකිය. කෙසේවුව ද, මෙම පාඨමාලා වැඩ සුදුසුකම සඳහා එකතු කරන ලකුණුවලට දායක කර නොගනී.

සුදුසුකම්ලාභියාට නව දැනුම ගොඩනැගීම කෙරෙහි කැපී පෙනෙන ලෙස දායක වන ස්වාධීන, පිරිසිදු සහ/හෝ ව්‍යවහාර පර්යේෂණ සිදු කිරීමටත්, SLQF මට්ටම්වල 10 වන මට්ටම දක්වා සුදුසුකම් ලැබීමට මඟපාදන විශේෂීකරණ ක්ෂේත්‍රයේ වෙනත් තැනැත්තන් විසින් සිදු කර ඇති මුල් පර්යේෂණ අධීක්ෂණය කිරීමට හා ඇගයීමට හැකි විය යුතුය. එමෙන්ම ඔහුට/ ඇයට විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධ සංකීර්ණ ගැටළු පිළිබඳව තීන්දු ගැනීමට හා විද්වත් සහ විද්වත් නොවන ප්‍රේක්ෂකයින් සඳහා සිය අදහස් සහ නිගමන සන්නිවේදනය කිරීමටත් හැකි විය යුතුය. ඔහු/ ඇය ගැටළු හසුරුවීමේ දී සහ විසඳීමේ දී ස්වයං-දිශානතිය සහ අව්‍යාජබව ප්‍රදර්ශනය කළ යුතු වන අතර කාර්යයන් වෘත්තීය මට්ටමකින් සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට හැකියාව තිබිය යුතුය. සුදුසුකම්ලාභියා විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඇති ප්‍රවර්තන ගැටළු පිළිබඳ විචක්ෂණ දැනුවත්භාවයක් පෙන්නුම් කළ යුතු වන අතර වෘත්තීය ව්‍යවහාරයට අදාළ ශිල්පක්‍රම යොදා ගත හැකි විය යුතුය.

**ශාස්ත්‍රපති වැඩසටහන් - පාඨමාලා වැඩ සහ පාඨමාලා වැඩ සහ පර්යේෂණ වැඩසටහන්.**

| අධ්‍යයන ක්ෂේත්‍රය | පිරිනමන වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| වාණිජ හා ව්‍යාපාර කළමනාකරණය | 07 |
| මානවශාස්ත්‍ර | 09 |
| සමාජීය විද්‍යා | 18 |
| විද්‍යා | 07 |
| වෛද්‍ය විද්‍යා | 01 |
| සෞඛ්‍ය හා සබැඳි බහුවිෂය අධ්‍යයන | 03 |
| පරිගණක | 01 |

***වාණිජ හා ව්‍යාපාර කළමනාකරණය***

- ව්‍යාපාර පිළිබඳ ශාස්ත්‍රපති (MBus) - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- ව්‍යාපාර පරිපාලනවේදී ශාස්ත්‍රපති (MBA) - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- වාණිජපති (MCom) - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- මානව සම්පත් හා කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති (MHRM)- වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ශාස්ත්‍රපති වැඩසටහන - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDHRM)-වසර 1
- අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDMKT) - වසර 1

***මානවශාස්ත්‍ර***

- බෞද්ධ අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- බෞද්ධ අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති - වසර 1 (පාඨමාලා වැඩ)
- ක්‍රිස්තියානි අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති - වසර 1 (පාඨමාලා වැඩ)
- නර්තනය පිළිබඳ ශාස්ත්‍රපති - වසර 2 (පාඨමාලා වැඩ)
- නාට්‍ය හා රංගකලාව පිළිබඳ ශාස්ත්‍රපති - වසර 1 (පාඨමාලා වැඩ)
- ලලිත කලා පිළිබඳ ශාස්ත්‍රපති - වසර 2 (පාඨමාලා වැඩ)
- වාග්විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- සංගීතය පිළිබඳ ශාස්ත්‍රපති - වසර 2 (පාඨමාලා වැඩ)
- සිංහල පිළිබඳ ශාස්ත්‍රපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)

**විද්‍යාව**

- ව්‍යවහාර ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ විද්‍යාපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- ආහාර හා පෝෂණය පිළිබඳ විද්‍යාපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- කාර්මික හා පාරිසරික රසායනික විද්‍යාව පිළිබඳ විද්‍යාපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- වගා ආරක්ෂාව හා පැල ජෛවතාක්ෂණය පිළිබඳ විද්‍යාපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- ජලජ ශාක හා සත්ත්ව විද්‍යාව හා ධීවර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDIT) - වසර 1

**සමාජීය විද්‍යා**

- පුරාවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති - වසර 1 (පාඨමාලා වැඩ)
- ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති - වසර 1 (පාඨමාලා වැඩ)
- ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රපති - වසර 1 (පාඨමාලා වැඩ)
- පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති - වසර 1 (පාඨමාලා වැඩ)
- ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රපති - වසර 1 (පාඨමාලා වැඩ)
- දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති - වසර 1 (පාඨමාලා වැඩ)
- දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති - වසර 1 (පාඨමාලා වැඩ)
- සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති - වසර 1 (පාඨමාලා වැඩ)
- භූගෝලවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති - වසර 1 (පාඨමාලා වැඩ)
- පුරාවිද්‍යාව පිළිබඳ විද්‍යාපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- භූගෝලය පිළිබඳ විද්‍යාපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- ඉතිහාසය පිළිබඳ විද්‍යාපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ විද්‍යාපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- ජන සන්නිවේදනය පිළිබඳ විද්‍යාපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- දර්ශනය පිළිබඳ විද්‍යාපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- දේශපාලන විද්‍යාව පිළිබඳ විද්‍යාපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)
- සමාජ විද්‍යාව පිළිබඳ විද්‍යාපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)

**වෛද්‍ය විද්‍යාව**

- මහජන සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති - වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)

**බහුවිෂය අධ්‍යයන**

- සෞඛ්‍ය සේවා කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති
- සෞඛ්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති
- සෞඛ්‍ය සංඛ්‍යානය පිළිබඳ ශාස්ත්‍රපති

***පරිගණක සහ තාක්ෂණය***

- අධ්‍යාපනය පිළිබඳ තොරතුරු තාක්ෂණ විද්‍යාපති උපාධිය – වසර 2 (පාඨමාලාව හා පර්යේෂණ වැඩ)

***පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මඟින් අන්තර්ජාතික අධ්‍යාපන මධ්‍යස්ථානවල පිරිනමන වැඩසටහන්***

- බෙන්හුයන් විශ්වවිද්‍යාලය, චීනය - බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය.
- මැලේසියානු බෞද්ධ ඇකඩමිය, මැලේසියාව - බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය.
- කේම්බ්‍රියන් අන්තර්ජාතික අධ්‍යයන මධ්‍යස්ථානය (CISC), බංගලදේශය - ව්‍යාපාර පරිපාලනවේදී වැඩසටහන.
- සීකිවු විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව සහ කැලණිය විශ්වවිද්‍යාලය - ඒකාබද්ධ උපාධි වැඩසටහන - ව්‍යාපාර විද්‍යාපති (ගිණුම්කරණය/ මූල්‍ය) සහ රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන.

***විදේශ සහයෝගීතා***

- ඩීකින් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව
- ෂින්ෂු විශ්වවිද්‍යාලය, ජපානය
- ඉන්ෆොමැටික්ස් සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන කියෝතෝ විද්‍යාලය, ජපානය

***බෙන්හුයන් විශ්වවිද්‍යාලය, චීනය සහ මැලේසියානු බෞද්ධ අකඩමිය – බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය***

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය චීනය සහ මැලේසියාවේ දී බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් පවත්වනු ලබයි.

**ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය වැඩසටහන - කේම්බ්‍රියන් අන්තර්ජාතික අධ්‍යයන මධ්‍යස්ථානය (CISC), බංගලාදේශය**

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි වැඩසටහන් සුවිශේෂී හවුල්කාර සමාගමක් වන කේම්බ්‍රියන් අන්තර්ජාතික අධ්‍යයන මධ්‍යස්ථානය (CISC) හරහා බංගලාදේශයට ලබාදීම පිණිස ගිවිසුමක් අත්සන් කරන ලදී. CISC බංගලාදේශයේ ප්‍රමුඛ පෞද්ගලික අධ්‍යාපන පහසුකම් සලසන්නෙක් වන BSB-කේම්බ්‍රියන් අධ්‍යාපන සමූහ ව්‍යාපාරයට අයත් වේ. CISC සහ කැලණිය විශ්වවිද්‍යාලය 2018 අධ්‍යයන වර්ෂය ආරම්භයේ සිට බංගලාදේශ ශිෂ්‍යයින් හට ව්‍යාපාර පරිපාලනවේදී ශාස්ත්‍රපති උපාධිය (MBA)පැවැත්වීම සඳහා එකඟතාවට එළැඹ ඇත. 2018 වසරේ දී ශිෂ්‍යයින් 18 දෙනෙක් බඳවා ගත් අතර 2019 වසරේ දී ශිෂ්‍යයින් 20 දෙනෙක් බඳවා ගන්නා ලදී.

**ඕස්ට්‍රේලියාවේ ඩීකින් විශ්වවිද්‍යාලය සහ කැලණිය විශ්වවිද්‍යාලය.**

ඕස්ට්‍රේලියාවේ ඩීකින් විශ්වවිද්‍යාලය සහ කැලණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධාත්මක ගිවිසුම අත්සන් කිරීමේ උත්සවය 2018 අප්‍රේල් මස 26වැනි දින පවත්වන ලදී. ග්ලෝබල් එන්ගේජ්මන්ට් ආයතනයේ උපකුලපති මහාචාර්ය ගැරී ස්මිත් සහ කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ඩී. එම්. සේමසිංහ මෙම අවබෝධාත්මක ගිවිසුමට අත්සන් කරන ලදී. මෙම ගිවිසුම ඕස්ට්‍රේලියාව සහ ශ්‍රී ලංකාව අතර අන්තර්ජාතික අධ්‍යාපනය සම්බන්ධයෙන් උපායමාර්ගික සබඳතා ගොඩනගා ගැනීම පිණිස ඩීකින් විශ්වවිද්‍යාලය සහ කැලණිය විශ්වවිද්‍යාලය අතර වූ ඒකාබද්ධ අපේක්ෂාවන් නිරූපණය කරයි. ඩීකින් විශ්වවිද්‍යාලය කැලණිය විශ්වවිද්‍යාලය සමඟ එක්ව ශ්‍රී ලංකාව තුළ දුරස්ථ ලෙස දර්ශනශූරී උපාධි පිරිනැමීමට බලාපොරොත්තු වන අතර කාර්ය මණ්ඩල, ශිෂ්‍ය හුවමාරු, අධ්‍යාපන සම්පත් හා ප්‍රකාශන, ඒකාබද්ධ පර්යේෂණ, ශික්ෂණ හා ඉගෙනුම්, සහ සහයෝගී ව්‍යාපෘති ආදිය මෙම නව හවුල්කාරත්වය හරහා උදා වනු ඇතැයි ද අපේක්ෂා කරනු ලැබේ.

***CQ* විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව සහ කැලණිය විශ්වවිද්‍යාලය.**

ඕස්ට්‍රේලියාවේ මධ්‍යම කුවීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලය (CQ University) සහ කැලණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධාත්මක ගිවිසුම 2018 ජූනි මස 4වැනි දින අත්සන් කරන ලදී. මධ්‍යම කුවීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ සභාපති මහාචාර්ය ස්කොට් බවුමන් සහ කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ඩී. එම්. සේමසිංහ මෙම අවබෝධාත්මක ගිවිසුමට අත්සන් කරන ලදී. මෙම ගිවිසුම ඕස්ට්‍රේලියාව සහ ශ්‍රී ලංකාව අතර අන්තර්ජාතික අධ්‍යාපනය සම්බන්ධයෙන් උපායමාර්ගික සබඳතා ගොඩනගා ගැනීම පිණිස මධ්‍යම කුවීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලය සහ කැලණිය විශ්වවිද්‍යාලය අතර වූ ඒකාබද්ධ අපේක්ෂාවන් නිරූපණය කරයි. කැලණිය විශ්වවිද්‍යාලය සහ කුවීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලය ඒකාබද්ධව ගිණුම්කරණ උපාධි වැඩසටහනක් පිරිනමනු ලැබේ. ඒ අනුව විශ්වවිද්‍යාලය මඟින් 2019 වසරේ දී ඕස්ට්‍රේලියාවේ මධ්‍යම කුවීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලය සමඟ එක්ව වෘත්තීය ගිණුම්කරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන ආරම්භ කරන ලදී.

***ඉන්ෆොමැටික්ස් සඳහා වූ කියෝතෝ උපාධි පාසැල් විද්‍යාලය, ජපානය සහ කැලණිය විශ්වවිද්‍යාලය.***

ඒකාබද්ධ උපාධි වැඩසටහන් පිරිනැමීම සඳහා ජපානයේ ඉන්ෆොමැටික්ස් සඳහා වූ කියෝතෝ උපාධි පාසැල් විද්‍යාලය සහ කැලණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධාත්මක ගිවිසුම 2019 මැයි මස 23වැනි දින උපකුලපතිතුගේ කාර්යාලයේ දී අතර අත්සන් කරන ලදී. අධ්‍යාපන මාදිලිය වෘත්තීමය ශෛලීය පාසැල්

ක්‍රමය මත පදනම් වන අතර එමඟින් ප්‍රායෝගික දැනුම අවධාරණය කරමින්, ජපන් භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ තොරතුරු සන්නිවේදනය යන විෂයන් සම්බන්ධයෙන් නිපුණතා ඇති උසස් ගුණාත්මක මානව සම්පත් ගොඩනැගීමට ඉලක්ක කරයි.

**පශ්චාත් උපාධි ශිෂ්‍යයින්ගේ පර්යේෂණ කුසලතා වර්ධනය කිරීම**

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය 2017 වසරේ දී පර්යේෂණ ක්‍රමවේද සහ විද්‍යාත්මක රචනාව පිළිබඳව සිය දැනුම හා කුසලතා වර්ධනය කර ගැනීමට උනන්දුවක් දක්වන ශිෂ්‍යයින් හට පශ්චාත් උපාධි අධ්‍යයන පිළිබඳ පර්යේෂණ කුසලතා වැඩිදියුණු කර ගැනීම සඳහා කෙටි කාලීන වැඩසටහනක් ආරම්භ කරන ලදී. 2017 වසරේ දී ශිෂ්‍යයින් 57 දෙනෙක් සහ 2018 වසරේ දී ශිෂ්‍යයින් 87 දෙනෙක් මෙම වැඩසටහනට සහභාගී විය.

**පරිගණක පද්ධතිය**

කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව තුළ හරිත ව්‍යවහාර සාර්ථකව යොදා ගත් පළමුවැනි විශ්වවිද්‍යාලය බවට පත්වීමෙන් ඇත. එමෙන්ම අපි 'කඩදාසි රහිත' සමාජයක් කරා ද ගමන් ආරම්භ කර ඇත. මෙම සංකල්ප අනුව යමින් පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මඟින් ශිෂ්‍ය පරිපාලනය සඳහා 2016 වසරේ දී සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය කළ කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කරන ලද අතර මේ සඳහා මාර්ගගත ප්‍රවේශය ද පද්ධතිය හරහාම ලබා දෙනු ලැබේ. සියලුම මාර්ගගත තොරතුරුවලට ස්මාර්ට් දුරකථන හෝ අයිපෑඩ් හරහා ප්‍රවේශ විය හැකිය.

**අන්තර්ජාතික පශ්චාත් උපාධි පර්යේෂණ සම්මන්ත්‍රණය (IPRC) 2019**

කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මඟින් සංවිධානය කරනු ලබන අන්තර්ජාතික පශ්චාත් උපාධි පර්යේෂණ සම්මන්ත්‍රණය 2019 දෙසැම්බර් මස 30 වැනි දින සමාජීය විද්‍යා පීඨ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. ''ඩිජිටල් පරිවර්තන හරහා බහුවිෂය පර්යේෂණ පවත්වා ගැනීම'' යන්න 2019 වසරේ දී පැවති සම්මන්ත්‍රණයේ තේමාව විය. 2016 වසරේ සිට මාර්ගගත සම්මන්ත්‍රණ කළමනාකරණ ක්‍රමවේදය යටතේ සම්මන්ත්‍රණය සංවිධානය කළ අතර එමඟින් ඉතා සුමට සංවිධානාත්මක ක්‍රියාවලියක් සහ ලියාපදිංචියේ දී සහ සමාලෝචනයේ දී වඩාත් කාර්යක්ෂම කළමනාකරණයක් සඳහා පහසුකම් සැලසීය. පිට පිට 19වැනි වරටත් සංවිධානය කළ මෙම අවස්ථාව වෘත්තිකයින්ට, අධ්‍යාපනඥයින්ට, ප්‍රතිපත්ති සම්පාදකයින්ට, පර්යේෂකයින්ට මෙන්ම පශ්චාත් උපාධි

ශිෂ්‍යයින්ට ඉහළ ගුණාත්මක පර්යේෂණ ඉදිරිපත් කිරීම මඟින් සිය අත්දැකීම් හා විශේෂඥතාවන් බෙදාහදා ගැනීමට සමත් තෝතැන්නක් විය.

**පශ්චාත් උපාධි අධ්‍යයන පීඨ වාරසඟරාව – 2019**

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ 07 වැනි වෙළුම වන වාරසඟරාව 2019 වසරේ දී සම්පූර්ණ ලිපි 17ක් ඇතුලත්ව ප්‍රකාශයට පත් කරන ලදී.

**වසරේ ලැබූ විශේෂ ජයග්‍රහණ**

- බංගලාදේශයේ කේම්බ්‍රියන් අන්තර්ජාතික අධ්‍යයන මධ්‍යස්ථානය (CISC) සහ කැලණිය විශ්වවිද්‍යාලය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම
- ඕස්ට්‍රේලියාවේ ඩීකින් විශ්වවිද්‍යාලය සහ කැලණිය විශ්වවිද්‍යාලය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම
- ජපානයේ ඉන්ෆෝමැටික්ස් පිළිබඳ පශ්චාත් උපාධි කියෝතෝ පාසැල සහ කැලණිය විශ්වවිද්‍යාලය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමට නියමිතය)
- පළමු වරට ස්මාර්ට් තාක්ෂණය යොදා ගනිමින් අධ්‍යක්ෂ රැස්වීමක් පැවැත්වීම ස්ථාපිත කරන ලදී
- පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය සඳහා නව වෙබ්අඩවියක් දියත් කරන ලදී
- සහකාර මූල්‍යාධිකාරී ධූරය සඳහා නව කාර්යාලයක් ස්ථාපිත කරන ලදී
- සූම් තාක්ෂණය ඔස්සේ වීඩියෝ පහසුකම් හරහා සම්මන්ත්‍රණ පැවැත්වීම - වර්තමානයේ දී ඉදිරිපත් කිරීම්/ වාචික ඉදිරිපත් කිරීම් සහ මාර්ගගත රැස්වීම් සඳහා භාවිතා කරනු ලැබේ

**මහාචාර්ය ජේඑම්ඩී ආරියරත්න**
පීඨාධිපති/ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

## 2.4. මානවශාස්ත්‍ර පීඨය

**දැක්ම**

මානවශාස්ත්‍ර ක්ෂේත්‍රය තුළ විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම

**මෙහෙවර**

භාෂා, කලා සහ ආගම පිළිබඳ ක්ෂේත්‍රවල අධ්‍යාපනය හා පර්යේෂණය හරහා මානව සම්පත ශක්තිමත් කිරීම.

**පීඨය පිළිබඳ කෙටි සමාලෝචනය**

මානවශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන සම්ප්‍රදාය සහ ඉතිහාසය විද්‍යාලංකාර පිරිවෙන දක්වා ඈතට දිවයයි. විද්‍යාලංකාර උසස් අධ්‍යාපන මධ්‍යස්ථානය වර්ෂ 1987 දී අති පූජ්‍ය ශ්‍රී ධර්මාලෝක ස්වාමීන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් ස්ථාපිත කරන ලද අතර පසු කාලීනව එය 195 වසරේ දී විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය ලෙස උසස් කරන ලදී. අති පූජනීය කිරිවත්තුඩුවේ ශ්‍රී පඤ්ඤාසාර ස්වාමීන් වහන්සේ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ පළමුවැනි උපකුලපති විය. විද්‍යාලංකාර පිරිවනේ පෙර තිබූ පීඨ වන භාෂා පීඨය, බෞද්ධ පීඨය සහ කලා පීඨය අද වන විට මානවශාස්ත්‍ර පීඨය යටතට ඇතුළත් කර ඇත.

**පීඨයේ පරමාර්ථ නම්***:*

- භාෂා, කලා සහ ආගමික අධ්‍යාපන විෂයන් සම්බන්ධයෙන් උසස්ම ප්‍රමිතියක් පවත්වා ගෙන යාම.
- අධ්‍යයන විෂයමාලාවේ සංවර්ධනයන් සිදු කිරීම හරහා ශිෂ්‍යයින් වෙනුවෙන් ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම.
- ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් හරහා ශිෂ්‍යයින්ට විදේශ විශ්වවිද්‍යාවල අධ්‍යයනය කිරීම සඳහා අවස්ථාව සැලසීම.
- ශිෂ්‍යයින් ඔවුන්ගේ වෘත්තීය ක්ෂේත්‍රය තුළ වෘත්තිකයින් ලෙස කටයුතු කිරීමට අවස්ථාව සලසමින් ආධුනිකත්ව වැඩසටහන් හරහා ශිෂ්‍යයින්ට ප්‍රායෝගික අත්දැකීම් ලබාදීම.
- පර්යේෂණ න්‍යායපත්‍ර හරහා දැනුම බෙදාහැරීම සහ මානවශාස්ත්‍ර ක්ෂේත්‍රයට අදාළ ගැටළු ගවේෂණය කිරීම හා විසඳීම.
- ශිෂ්‍ය කේන්ද්‍රීය සහ ප්‍රතිඵල පාදක ශික්ෂණ හා ඉගෙනුම් ක්‍රම ඇතුළු නවීන අධ්‍යාපන ක්‍රමවේද භාවිතා කිරීම.
- පීඨයේ යටිතලපහසුකම් වැඩිදියුණු කිරීම සහ ශිෂ්‍ය හිතකර පරිසරයක් නිර්මාණය කිරීම.
- ශික්ෂණය සහ ඉගෙනුම වඩාත් රසවත් කිරීම සඳහා නවීන තාක්ෂණික පහසුකම්වලින් යුත් ස්මාර්ට් පන්ති කාමර ස්ථාපිත කිරීම.

**පීඨයේ උපාධි වැඩසටහන් පිළිබඳ හැඳින්වීම**

මානවශාස්ත්‍ර පීඨයට ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) සහ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි පාඨමාලා පිරිනමනු ලබන අධ්‍යයන අංශ නමයක් ඇතුළත් වේ. එම අධ්‍යයන අංශ සහ ඒවායින් පිරිනමන ශාස්ත්‍රවේදී උපාධි පහත ලැයිස්තුගත කර ඇත.

*2-2 වගුව: මානවශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන අංශ සහ අධ්‍යයන අංශ පිරිනමන අදාළ විෂයන්*

<table>
<tr><th colspan="2">අධ්‍යයන අංශය</th><th>විෂයන්</th></tr>
<tr><td colspan="2">සිංහල අධ්‍යයන අංශය</td><td>සිංහල, සාහිත්‍ය විචාරය</td></tr>
<tr><td colspan="2">ඉංග්‍රීසි අධ්‍යයන අංශය</td><td>ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය</td></tr>
<tr><td colspan="2">පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය</td><td>පාලි, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ දර්ශනය</td></tr>
<tr><td colspan="2">සංස්කෘත හා පෙරදිග අධ්‍යයන අංශය</td><td>සංස්කෘති, වාස්තු විද්‍යා</td></tr>
<tr><td colspan="2">හින්දි අධ්‍යයන අංශය</td><td>හින්දි</td></tr>
<tr><td colspan="2">නූතන භාෂා අධ්‍යයන අංශය</td><td>ප්‍රංශ, ජර්මානු, රුසියානු, ජපන්, චීන, කොරියානු</td></tr>
<tr><td colspan="2">වාග් විද්‍යා අධ්‍යයන අංශය</td><td>වාග්විද්‍යාව, පරිවර්තන ක්‍රම, දෙමළ, දෙවැනි භාෂාවක් ලෙස දෙමළ</td></tr>
<tr><td colspan="2">බටහිර සම්භාව්‍ය සංස්කෘතිය සහ ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය</td><td>බටහිර සම්භාව්‍ය සංස්කෘතිය, ක්‍රිස්තියානි සංස්කෘතිය</td></tr>
<tr><td colspan="2">DELT (ඉංග්‍රීසි භාෂා ශික්ෂණ අධ්‍යයන අංශය)</td><td>දෙවැනි භාෂාවක් ලෙස ඉංග්‍රීසි ශික්ෂණය</td></tr>
<tr><td rowspan="2">ලලිත කලා අධ්‍යයන අංශය</td><td>නාට්‍ය හා රංගකලාව, රූප කලා (ඡායාරූපකරණය, රූපවාහිනිය සහ සිනමා)</td><td>නාට්‍ය හා රංගකලාව, රූප කලා (ඡායාරූපකරණය, රූපවාහිනිය සහ සිනමා)</td></tr>
<tr><td>දෘශ්‍ය කලා (කලා, පරිගණක නිර්මාණය), රංග කලා (සංගීතය, නර්තනය)</td><td>දෘශ්‍ය කලා (කලා, පරිගණක නිර්මාණය), රංග කලා (සංගීතය, නර්තනය)</td></tr>
</table>

**පර්යේෂණ වැදගත් සිදුවීම් සහ පර්යේෂණ සම්මන්ත්‍රණ**

- "මානවශාස්ත්‍ර (ප්‍රති) ඇගයීම: මානවශාස්ත්‍ර වටිනාකම් සහ මානවශාස්ත්‍රවල වටිනාකම්" යන තේමාව යටතේ මානවශාස්ත්‍ර පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණය 2018 වර්ෂයේ පර්යේෂණ කටයුතු පිළිබඳ ප්‍රධාන අංගය වේ. මෙම සම්මන්ත්‍රණය 2019 මාර්තු මස 14 සහ 15 වන දිනවල පවත්වන ලදී.
- පීඨයේ ප්‍රථම උපාධි අපේක්ෂකයින්ගේ පර්යේෂණ පරිසංවාදය 2019 වසර තුළ අධ්‍යයන වර්ෂයේ වැදගත් ඉසව්වක් වූ අතර එක් දින සම්මන්ත්‍රණය 2019 දෙසැම්බර් මස 19වැනි දින පවත්වන ලදී. මෙය මානවශාස්ත්‍ර පීඨයේ උපාධි අපේක්ෂකයින්ට සිය මුල් පර්යේෂණ ව්‍යාපෘති ඉදිරිපත් කිරීම සඳහා ලැබුනු කදිම අවස්ථාවක් විය.
- සංස්කෘත හා පෙරදිග අධ්‍යයන අංශය මඟින් 2019 නොවැම්බර් මස 07 වැනි දින 4වැනි සංස්කෘත හා පෙරදිග අධ්‍යයන පිළිබඳ සම්මන්ත්‍රණය සංවිධානය කරන ලදී.

**වසරේ ලැබූ විශේෂ ජයග්‍රහණ**

- මානව ශාස්ත්‍ර පීඨය AHEAD ව්‍යාපෘතිය යටතේ ELTA-ELSE පර්යේෂණ ප්‍රදානය දිනා ගන්නා ලදී.
- පීඨයේ AHEAD ව්‍යාපෘති යෝජනාව ලිවීම සම්බන්ධයෙන "උපකුලපතිතුමාගේ සම්මානය" දිනා ගන්නා ලදී.
- දෙරටේ අධ්‍යයන සහයෝගීතාව හා ශිෂ්‍ය හුවමාරුව වෙනුවෙන් ජපානයේ ෂින්ෂු විශ්වවිද්‍යාලය සමඟ අවබෝධාත්මක ගිවිසුමක් සාර්ථකව අත්සන් කරන ලදී.

**අනාගත අපේක්ෂාවන්**

පීඨය වෙත බඳවා ගන්නා විදෙස් ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නංවා ගැනීමේ ඉලක්කය ඇතිව තාක්ෂණික අතින් ඉහළ පහසුකම් ඇති ස්මාර්ට් පන්ති කාමර සහිත මහල් 12ක ගොඩනැගිල්ල ඉදිකිරීම සහ ශිෂ්‍යයින් වෙනුවෙන් යටිතලපහසුකම් ගොඩනැගීම සඳහා පීඨය සැලසුම් කරයි.

**පරිවර්තනය සහ වැදගත් සන්ධිස්ථාන**

පීඨය පහත දැක්වෙන ජයග්‍රහණ අත් කර ගැනීමට අපේක්ෂා කරයි:

- ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් යටතේ ශිෂ්‍යයින්ට විදේශ විශ්වවිද්‍යාලවල අධ්‍යයන කිරීමට අවස්ථාව ලැබෙනු පිණිස විදේශ විශ්වවිද්‍යාල සමග ඇති සහයෝගය ශක්තිමත් කිරීම.
- පීඨය අන්තර්ජාතික මට්ටමක් දක්වා ඉහළ නැංවීම.

**මහාචාර්ය ආර්එම්පීඑෆ් රත්නායක**
පීඨාධිපති/ මානවශාස්ත්‍ර පීඨය

## 2.5. වෛද්‍ය පීඨය

### දළ විශ්ලේෂණය

වෛද්‍ය පීඨය රාගම, ඉඩකඩ සහිත, අක්කර 35ක භූමි භාගයක පිහිටා ඇත. 1991 සැප්තැම්බර් මස එම පීඨයේ අධ්‍යයන කටයුතු ආරම්භ විය. 2019 වසරේ දී 24වැනි වෛද්‍ය ශිෂ්‍ය කණ්ඩායම සහ 7වැනි විද්‍යාවේදී (කථන හා ශ්‍රවණ විද්‍යා) උපාධි ශිෂ්‍ය කණ්ඩායම පීඨයෙන් උපාධි හිමිකර ගත්හ. වෛද්‍ය උපාධි වැඩසටහන සඳහා 30වැනි සහ 31වැනි ශිෂ්‍ය කණ්ඩායම් සහ විද්‍යාවේදී (කථන හා ශ්‍රවණ විද්‍යා) උපාධි වැඩසටහන සඳහා 12වැනි ශිෂ්‍ය කණ්ඩායමත් බඳවා ගන්නා ලදී. මහජන සෞඛ්‍ය (වසංගතවේදය) පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන සහ වෛද්‍ය විද්‍යාව පිළිබඳ දර්ශනපති හා දර්ශනශූරී දක්වා වූ පර්යේෂණ උපාධි ද පශ්චාත් උපාධි වැඩසටහන්වලට ඇතුළත් වේ. මෙයට අමතරව පීඨය මඟින් දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයාපන කේන්ද්‍රය සමඟ එක්ව වෘත්තීය චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ භෞතිචිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලෙස බාහිර උපාධි වැඩසටහන් දෙකක් ද පිරිනමනු ලැබේ.

2019 දෙසැම්බර් වනවිට පීඨයට ප්‍රථම උපාධි ශිෂ්‍යයන් 1325ක් ඇතුළත් වී සිටි අතර ප්‍රධාන වශයෙන් දකුණු ආසියානු රටවලින් බඳවා ගත් විදේශ සිසුන් 45ක් ද වෛද්‍ය සිසුන්ට ඇතුළත් විය. 130ක ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයකින් යුත් පීඨයේ මොවුන්ට අමතරව 40ක පමණ තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලයක් ද අනුබද්ධ ශික්ෂණ රෝහල්වල සේවය කරන විශේෂඥ වෛද්‍යවරු ඇතුළු බාහිර කථාකාචාර්යවරු 60කට වැඩි සංඛ්‍යාවක් ද සිටිති.

පීඨයේ පර්යේෂණ කටයුතු ඉතා ඉහළ මට්ටමක පවතින අතර ශ්‍රී ලංකාවේ වෛද්‍ය පීඨ අතර වැඩිම දායකත්වයක් දක්වන පීඨය ද වේ. 2019 නොවැම්බර් මස පැවති විද්‍යාත්මක ප්‍රකාශන සඳහා වූ ජනාධිපති සම්මාන උළලේ දී 2018 වසරේ දී සිදු කළ විද්‍යාත්මක ප්‍රකාශන වෙනුවෙන් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසි නම දෙනෙක් සම්මාන දිනා ගන්නා ලදී.

**දැක්ම**

වෛද්‍ය විද්‍යාව පිළිබඳ දැනුම උත්පාදනය කිරීමට හා බෙදා හැරීමට ආධාර කිරීම මඟින් විශිෂ්ටත්ව හා ඍජු සංස්කෘතියක් තුළ උසස් අධ්‍යාපනය පිළිබඳ අන්තර්ජාතික වශයෙන් පිළිගත් ආයතනයක් වීමට පීඨය අපේක්ෂා කරයි.

**මෙහෙවර**

වෛද්‍ය පීඨය,

- වෛද්‍ය සිසුන්ට, පශ්චාත් උපාධි වෛද්‍යවරුන්ට, ආශ්‍රිත සෞඛ්‍ය රැකවරණ වෘත්තීයවේදීන්ට සහ මහජනයාට අධ්‍යාපනය ලබා දෙයි;
- මනුෂ්‍යයන්ට වැළඳෙන රෝගාබාධ වැළැක්වීමට, රෝග නිශ්චය කිරීමට හා ප්‍රතිකාර කිරීමට රෝගීන් ඉලක්ක කර ගත් වෛද්‍ය රැකවරණය සපයයි; සහ
- විපරම, මුල් පිරීම, සමානාත්මතාවය හා සමාජීය වගකීම යනාදී ජීවගුණ පෝෂණය කරන උසස් තත්ත්වයේ අධ්‍යාපනික පරිසරයක් තුළ මූලික, ව්‍යවහාරික හා සායනික පර්යේෂණ පවත්වයි.

පීඨයේ උපාධිධාරීන්ට ගෝලීයකරණය වූ සෞඛ්‍ය රැකවරණ පරිසරයක් තුළ තනි පුද්ගලයින් හා අදහස් දරන නායකයින් ලෙස සිය ප්‍රජාවට, රටට හා ලෝකයට සාර්ථකව සේවය කිරීම පිණිස අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප සතු වන ඇත.

වෛද්‍ය පීඨයේ දී ඉගැන්වීමට, ශිෂ්‍යයන් පුහුණු කිරීමට හා විද්‍යාත්මක විමසුම සඳහා උද්යෝගය ඇති ශාස්ත්‍රීය ප්‍රජාවක් මඟින් දැනුම ලබා දෙනු ලැබේ. ඉගෙනුම හා පර්යේෂණ සඳහා අනර්ඝ පරිසරයක් ලබා දීම මඟින් අපි ඉහළම මට්ටමේ ශාස්ත්‍රීය ගුණය දිරිමත් කරන්නෙමු.

**පීඨය පිරිනමන සුදුසුකම්**

වර්තමානයේ දී පීඨය පිරිනමන සුදුසුකම් පහත පරිදි වේ:

**ප්‍රථම උපාධි**:

- වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය
- විද්‍යාවේදී උපාධිය (කථන හා ශ්‍රවණ විද්‍යා)

**පශ්චාත් උපාධි**

- දර්ශනශූරී (PhD)
- වෛද්‍ය ආචාර්ය උපාධිය (DM)
- දර්ශනපති (MPhil)
- මහජන සෞඛ්‍ය පිළිබඳ දර්ශනපති (MPH)

වෛද්‍ය පීඨය:

- සායනික ඇගයීම සහ රෝගීන් කළමනාකරණය
- සන්නිවේදනය
- මහජන සෞඛ්‍ය හා සෞඛ්‍ය පද්ධති සහ
- තොරතුරු කළමනාකරණය

පිළිබඳ නිපුණතා ඇති **වෘත්තිකයෙක්**

- ඖෂධ පිළිබඳ විද්‍යාත්මක පදනම,
- විචාරාත්මක චින්තනය හා පර්යේෂණ

පිළිබඳ නිපුණතා ඇති **විද්‍යාඥයෙක්**

- වෘත්තීය වටිනාකම්, ආකල්ප සහ ආචාරධර්ම

පිළිබඳ නිපුණතා ඇති **වෘත්තිකයෙක්**

- බිහි කර ගැනීමට ඉලක්ක කරයි.

වෛද්‍යවේදී අධ්‍යයන වැඩසටහන ඉන්ද්‍රීය පද්ධති පාදක, සංකලිත විෂයමාලාවකින් සැදුම්ලත් වසර 5ක අධ්‍යයන වැඩසටහනකි. ඒ සඳහා පහත දක්වා ඇති පරිදි අදියර 3කින් යුත් අධ්‍යයන පාඨමාලාවක් සහ වෘත්තියට බඳවා ගැනීමේ විභාගයක් ඇතුළත් වේ:

- වෛද්‍ය උපාධිය සඳහා පළමු විභාගය
- වෛද්‍ය උපාධිය සඳහා දෙවැනි විභාගය
- වෛද්‍ය උපාධිය සඳහා අවසන් විභාගය

**කථන හා ශ්‍රවණ විද්‍යා පිළිබඳ විද්‍යාවේදී උපාධි වැඩසටහන**

වෛද්‍ය පීඨය මඟින් පිරිනමන කථන හා ශ්‍රවණ විද්‍යා පිළිබඳ විද්‍යාවේදී උපාධි වැඩසටහන ශ්‍රී ලංකාවේ (කථන හා භාෂා චිකිත්සාව හෝ ශ්‍රව්‍ය පිළිබඳ විශේෂීකරණය වෙමින්) කථනය හා ශ්‍රවණ විද්‍යා පිළිබඳ විද්‍යාවේදී උපාධිය දක්වා මඟපාදන විශ්විද්‍යාලයක් මඟින් අනුමත කර ඇති එකම වෘත්තීය පුහුණු වැඩසටහන වේ. කථන හා ශ්‍රවණ විද්‍යා පිළිබඳ විද්‍යාවේදී උපාධිය වසර හතරක අධ්‍යයන වැඩසටහනකි. විෂයමාලාව පාඨමාලා ඒකක ක්‍රමය මත පදනම් වේ.

අයාති (සංස්කෘත භාෂාවෙන් 'බලාපොරොත්තුව') ලෙස නම් කර ඇති පුහුණු මධ්‍යස්ථානය විවිධ ආබාධ තත්ත්වයන්ගෙන් පෙළෙන රෝගීන්ට උපකාර කරනු වස් 2019 වසරේ දී පිහිටුවන ලදී. මධ්‍යස්ථානය ආයතී භාරය මඟින් අනුග්‍රහය ලබන අතර කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය මඟින් තාක්ෂණික ප්‍රවීණතාව සපයයි.

ශ්‍රී ලංකා හමුදාව මඟින් මෙම නවීන තාක්ෂණයෙන් යුත් ගොඩනැගිල්ල ඉදිකර 2019 ජූලි මස 18වැනි දින කැලණිය විශ්වවිද්‍යාලයට භාර දෙන ලදී. එතැන් සිට කාර්ය මණ්ඩලය සහ ශ්‍රවණවේදීන්, අධ්‍යාපන චිකිත්සකයින්, වෘත්තීය චිකිත්සකයින්, ළමා රෝග විශේෂඥ වෛද්‍යවරු, භෞතචිකිත්සකයන්, මනෝවිද්‍යාඥයින්, කථන හා භාෂා චිකිත්සකයන් සහ සහායක සේවා නිලධාරීන් පහසුකම් සපයනු ලැබේ.

**අනාගත අපේක්ෂාවන්:**

2019/ 2020 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍යයින් 50 දෙනෙක් ඇතුළත් වන වෘත්තීය චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය දක්වා උසස් නව උපාධි වැඩසටහනක් ආරම්භ කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

**මහාචාර්ය පීඑස් විජේසිංහ**
පීඨාධිපති/ වෛද්‍ය පීඨය

## 2.6. විද්‍යා පීඨය

**මෙහෙවර**

කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ ඉදිරි දැක්ම වන්නේ ජාතික සංවර්ධනය සඳහා මෙන්ම පොදු මහජනතාවගේ සුභසාධනය සඳහා වැදගත් දායකත්වයක් සැපයිය හැකි ඉහළ අභිප්‍රේරණයකින් යුත් උපාධිධාරීන් සහ පශ්චාත්-උපාධිධාරීන් බිහි කිරීමත්, ස්වභාවික සම්පත් තිරසර භාවිතය හා සංරක්ෂණය පිණිස වඩාත් හොඳ අවබෝධයක් ඇති කිරීමට විවිධ විද්‍යාත්මක ක්ෂේත්‍රවල පර්යේෂණ සිදු කිරීම හා උපදෙස් දීමත් උපදේශන කටයුතුවල නිරත වීමත් වේ.

***පීඨය හැඳින්වීම***

කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය 1959 වසරේ විද්‍යාලංකාර විශ්වවිද්‍යාල පිහිටුවීමේ දී පැවති පීඨ පහෙන් එකකි. වර්තමානයේ දී කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය අධ්‍යයන අංශ අටකින් සමන්විත වේ; ඒවා නම් උද්භිද විද්‍යා අධ්‍යයන අංශය, රසායන විද්‍යා අධ්‍යයන අංශය, කාර්මික කළමනාකරණය, ගණිත ශාස්ත්‍රය, ක්ෂුද්‍රජීව විද්‍යාව, භෞතික විද්‍යාව, සංඛ්‍යානය හා පරිගණක විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව හා පාරිසරික කළමනාකරණ යන අධ්‍යයන අංශ වේ.

**පීඨය පිළිබඳ හැඳින්වීම**

විද්‍යා පීඨය දැන් වසර තුනක විද්‍යාවේදී උපාධි වැඩසටහන් තුනක්, වසර හතරක විශේෂ උපාධි වැඩසටහන් හතරක් පිරිනමනු ලබයි. විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය [BSc], පරිසර සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය (ENCM), භෞතික විද්‍යාව හා ඉලෙක්ට්‍රොනික උපාධිය (PHEL) විද්‍යාවේදී උපාධි වැඩසටහන් වේ. විද්‍යාවේදී (විශේෂ) උපාධිය, පරිසර සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය (ENCM), කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය (MIT) සහ මෘදුකාංග ඉංජිනේරු ශිල්පය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (SENG) ගෞරව උපාධි වැඩසටහන් වේ.

පීඨයේ 2017/ 2018 අධ්‍යයන වර්ෂය සඳහා වාර්ෂික ශිෂ්‍ය බඳවා ගැනීම ශිෂ්‍යයින් 660කි. වර්තමානයේ දී පීඨය ප්‍රථම උපාධි අපේක්ෂකයින් 2080ක් සඳහා සේවය සපයයි. පීඨයට අනුබද්ධ අධ්‍යයන කාර්ය මණ්ඩලය සාමාජිකයින් 130ක්, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල සාමාජිකයින් 01ක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සාමාජිකයින් 98ක් ද වේ. විද්‍යා පීඨය ජෛව විද්‍යා සහ භෞතික විද්‍යා විෂය ධාරා

සඳහා ශිෂ්‍යයින් පිළිවෙලින් ශිෂ්‍යයින් 185ක් සහ 300ක් බැගින් බඳවා ගනී. එමෙන්ම පීඨය කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය (MIT) සඳහා ශිෂ්‍යයින් 100ක්, පරිසර සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය (ENCM) සඳහා ශිෂ්‍යයින් 60ක් සහ මෘදුකාංග ඉංජිනේරු ශිල්පය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (SENG) සහ භෞතික විද්‍යාව හා ඉලෙක්ට්‍රොනික උපාධිය (PHEL) සඳහා ශිෂ්‍යයින් 50 බැගින් ඇතුළත් කර ගනු ලැබේ.

භෞතික විද්‍යා හා ජීව විද්‍යා විෂය ධාරාවල ශිෂ්‍යයින්ට මානව ශාස්ත්‍ර පීඨය, සමාජීය විද්‍යා සහ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨවලින් අතිරේක විෂයන් තෝරා ගත හැකිය. වර්තමානයේ දී පීඨය මඟින් විද්‍යාපති උපාධි වැඩසටහන් 4ක් සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා 1ක් ද පවත්වනු ලැබේ. පීඨයේ අධ්‍යයන වැඩසටහන් මොඩියුල අන්තර්ගත, අධ්‍යයන වර්ෂයක් සඳහා අධ්‍යයන වාර දෙකක්, අධ්‍යයන වාර අවසානයේ විභාගයක් සහ අඛණ්ඩ ඇගයීම් ඇතුළත් සම්මාන පාදක ක්‍රමයක් වන 'පාඨමාලා ඒකක ක්‍රමයක්' මත ක්‍රියාත්මක වේ. එමඟින් විෂයන් තෝරා ගැනීමේ දී හැකි උපරිම නම්‍යතාවක් ලබා දෙන විවිධ පාඨමාලා ඒකක සංකලනයක් පිරිනමයි.

**වර්තමාන ප්‍රගතිය**

AHEAD මෙහෙයුම් (ලෝක බැංකුවේ අරමුදල් සපයන ව්‍යාපෘතියකි) යටතේ 2019 වර්ෂය තුළ දී විද්‍යා පීඨයට පහත දැක්වෙන ප්‍රදාන ලබා ගැනීමට හැකි විය:

1. ELTA – ELSE පීඨ යෝජනාව – ලංකා රුපියල් මිලියන 100
2. සංවර්ධනය කේන්ද්‍රීය පර්යේෂණය – ලංකා රුපියල් මිලියන 40
3. ELTA – ELSE අධ්‍යයන අංශ යෝජනා
   අ) කාර්මික කළමනාකරණ අධ්‍යයන අංශය – ලංකා රුපියල් මිලියන 15
   ආ) ශාක සහ අණුක ජීවවිද්‍යා අධ්‍යයන අංශය – ලංකා රුපියල් මිලියන 15
4. ප්‍රතිඵල ක්ෂේත්‍රය I බඳවාගැනීම සඳහා – කාර්මික කළමනාකරණ අධ්‍යයන අංශය ලංකා රුපියල් මිලියන 50
5. පර්යේෂණ නවෝත්පාදන සහ වාණිජකරණය (RIC)
   අ) රසායන විද්‍යා අධ්‍යයන අංශය – ලංකා රුපියල් මිලියන 40
   ආ) භෞතික විද්‍යා සහ ඉලෙක්ට්‍රොනික විද්‍යා අධ්‍යයන අංශය ලංකා රුපියල් මිලියන 40

විෂයන්වල විවිධාංගීකරණය හේතුවෙන් පීඨයේ අධ්‍යයන අංශ දෙකක් 2019 වසර තුළ දී පහත දැක්වෙන පරිදි නැවත නම් කරන ලදී:

1. උද්භිද විද්‍යා අධ්‍යයන අංශය ශාක හා අණුක ජෛවවිද්‍යා අධ්‍යයන අංශය ලෙස නම් කරන ලදී.
2. භෞතික විද්‍යා අධ්‍යයන අංශය භෞතික විද්‍යා සහ ඉලෙක්ට්‍රොනික විද්‍යා අධ්‍යයන අංශය ලෙස නම් කරන ලදී.

විද්‍යා පීඨය 2019 නොවැම්බර් මස 27 වැනි දින සිට 29 වැනි දින දක්වා ප්‍රදර්ශන කුටි එකොළහක් පවත්වා ගෙන යමින් කැලණිය විශ්වවිද්‍යාලයේ 60 වැනි සංවත්සර සැමරුමට වැදගත් දායකත්වයක් දක්වන ලදී.

විද්‍යා පීඨයේ මහල් හයක ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් අදියරේ පවතින අතර කාර්මික කළමනාකරණ අධ්‍යයන පීඨය මගින් කාර්මික තාක්ෂණ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන පැවැත්වීම සඳහා භාවිතා කරනු ඇත. නව දේශන ශාලා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ද සිදුකරමින් පවතින අතර එමගින් විද්‍යා පීඨයේ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සලසනු ඇත.

විද්‍යා පීඨය යටතේ පහත දැක්වෙන මධ්‍යස්ථාන සහ ඒකක ස්ථාපිත කර ඇත;

- අළුත්වැඩියා සහ උපකරණ සම්පාදන ඒකකය මේ වන විට භෞතික විද්‍යා අධ්‍යයන අංශය මගින් පවත්වා ගෙන යනු ලැබේ. මෙම ඒකකය විද්‍යාගාර උපකරණ, ආම්පන්න, මෙවලම් ආදියේ අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු සිදු කරනු ලැබේ.
- රසායන විද්‍යා අධ්‍යයන පීඨයේ වීදුරු පිඹීමේ මධ්‍යස්ථානය විවිධ වීදුරු භාජන නිෂ්පාදනය හා අළුත්වැඩියාව සිදු කරමින් රාජ්‍ය හා පෞද්ගලික අංශවලට සුවිශේෂී සේවාවක් ඉටු කරයි.
- පර්යේෂණ සේවා මධ්‍යස්ථානයඃ RSC විශ්වවිද්‍යාලය මගින් HETC Window 4 ව්‍යාපෘතිය යටතේ මෑතක දී ස්ථාපිත කළ ඒකකයකි. එය විද්‍යා පීඨයේ පර්යේෂණ හා ආශ්‍රිත කටයුතු සඳහා පහසුකම් සැපයීම හා ඒවා ප්‍රවර්ධනය සඳහා පිහිටුවා ඇත.
- කුහුඹු පර්යේෂණ, සඳහා වූ කලාපීය මධ්‍යස්ථානය 2016 වසරේ දී අධ්‍යයන අංශය තුළ පිහිටුවන ලද අතර 2016 වර්ෂයේ සිට එමගින් කුහුඹුවන් නියැදි කිරීමේ ක්‍රම සහ හඳුනා ගැනීම පිළිබඳ අන්තර්ජාතික පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. එහි කුහුඹුවන් පදිංචි ස්ථාන, පවුල් සහ සුවිශේෂී හැසිරීම් පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.
- සූර්ය විසඳුම් මධ්‍යස්ථානය (SSC) 2016 වසරේ පෙබරවාරි මස ස්ථාපිත කරන ලද්දේ කැලණිය විශ්වවිද්‍යාලයේ හරිත සංකල්පය ශක්තිමත් කිරීමේ පරමාර්ථය ඇතිවය. මෙම මධ්‍යස්ථානය මගින් සියලුම අංගෝපාංග ඇතුළු සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන රෝද පුටුවක් සහ ප්‍රධාන ආපනශාලාව සඳහා සූර්ය බලය ආධාරයෙන් ක්‍රියාත්මක වන බොයිලේරුවක් නිර්මාණය කර ඇත. වර්තමානයේ දී මෙම මධ්‍යස්ථානය සූර්ය බලය සියලුම ජනකොට්ඨාස සඳහා පහසුවෙන් මිල දී ගත හැකි වන පරිදි අඩු පිරිවැය ඇති, කුඩා පරිමාණයේ බලශක්ති විසඳුමක් නිර්මාණය කර ගැනීම කෙරෙහි ඉලක්ක කර ඇත.
- මධ්‍යම උපකරණ විද්‍යාගාරය පීඨය තුළ පර්යේෂණ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසයි. එය 2012 වසරේ ජුනි මාසයේ දී HETC QIG Window 3 වැඩසටහනේ කටයුත්තක් ලෙස පිහිටුවන ලදී. වර්තමානය වන විට මෙම විද්‍යාගාරය සතුව රුපියල් මිලියන 20කට අධික වටිනාකමකින් යුත් උපකරණ ඇත.

**වසර තුළ ලැබූ විශේෂ ජයග්‍රහණ**

කැලණිය විශ්වවිද්‍යාල ඉතිහාසයේ පළමු වරට භෞතික විද්‍යා හා ඉලෙක්ට්‍රොනික විද්‍යා අධ්‍යයන අංශය "ප්‍රතිරෝද සහ උද්ගාමී භාර සමඟ සම්බන්ධිත පාලිත රෙගියුලේටරය" යන නවීන නිපැයුම සඳහා බලපත්‍ර ලබා ගැනීම සඳහා OREL කොපරේෂන් (පුද්ගලික) සමාගම සමඟ හවුල්වෙමින් වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී. මෙම නව නිපැයුම භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි අපේක්ෂකයෙක් විසින් ඔහුගේ අවසන් වසරේ ප්‍රථම උපාධි පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා නිර්මාණය කරන ලද්දකි.

විද්‍යා පීඨය මඟින් 2019 ඔක්තෝබර් මස 25 වැනි දින "තාක්ෂණ නවෝත්පාදනː තාක්ෂණික ව්‍යවසායකයින්ගේ ඊළඟ පරපුර දිරිමත් කිරීම"යන තේමාව යටතේ ශුද්ධ හා ව්‍යවහාර විද්‍යා පිළිබඳ අන්තර්ජාතික පර්යේෂණ පරිසංවාදයක් සංවිධානය කරන ලදී.

**අනාගත අපේක්ෂාවන්**

විද්‍යා පීඨය ඉදිරියේ දී පහත දැක්වෙන උපාධි වැඩසටහන් හඳුන්වාදීමට නියමිතය.

1. ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය
2. පරිගණක විද්‍යාව පිළිබඳ ඉලෙක්ට්‍රොනික හා පරිගණක විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය
3. ඉලෙක්ට්‍රොනික පිළිබඳ ඉලෙක්ට්‍රොනික හා පරිගණක විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය
4. ඉලෙක්ට්‍රොනික හා පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය
5. පරිගණක විද්‍යාව පිළිබඳ ඉලෙක්ට්‍රොනික හා පරිගණක විද්‍යා විද්‍යාවේදී උපාධිය
6. ඉලෙක්ට්‍රොනික පිළිබඳ ඉලෙක්ට්‍රොනික හා පරිගණක විද්‍යා විද්‍යාවේදී උපාධිය
7. දත්ත විද්‍යාව හා විශ්ලේෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය
8. 3 plus 1 උපාධි වැඩසටහන – විද්‍යාවේදී ගෞරව උපාධිය
9. මෘදුකාංග ඉංජිනේරු ශිල්පය පිළිබඳ විද්‍යාවේදී උපාධිය – බාහිර උපාධිය
10. තාරකාවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව
11. පරිගණක විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව
12. තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව

ශිෂ්‍යයින්ගේ සහ කාර්ය මණ්ඩලයේ කැපවීම සහ උනන්දුව හේතුවෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය අද වන විට තෘතීය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශිෂ්ට කේන්ද්‍රයක් බවට පත්ව ඇත. නිදහස් චින්තනය, නවෝපකරණ සහ නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ පරිසරයක් පීඨය තුළ බිහි වී ඇත. විද්‍යා පීඨය හරහා ජාතියට බිහි වන උපාධිධාරීන් මානව සන්හතියේ ප්‍රගතිය සඳහා වැදගත් දායකත්වයක් සපයනු නොඅනුමානය.

මෙම ධාරිතාව සහ මෙහෙවර අනුව යමින් විද්‍යා පීඨය රටේ ආර්ථිකය මෙහෙයවීම, සිවිල් සමාජයට සහ රජයට සහායවීම සහ මනුෂ්‍ය වර්ගයාගේ සුභසිද්ධිය වෙනුවෙන් අත්‍යවශ්‍ය තීරණ ගැනීම යනාදී කර්තව්‍යයන් සඳහා විද්වතුන් සහ වෘත්තිකයින් සූදානම් කරවීම සහ නිපැයීම සඳහා අද්විතීය සේවාවක් ඉටු කරමින් ඇත.

**මහාචාර්ය බීඑම් ජයවර්ධන මිය**
පීඨාධිපති/ විද්‍යා පීඨය

## 2.7. සමාජීය විද්‍යා පීඨය

### පීඨය පිළිබඳ හැඳින්වීම

සමාජීය විද්‍යා පීඨය අධ්‍යයන අංශ දොළහකින් සමන්විත වන අතර ඒ නම් පුරාවිද්‍යා, ආර්ථික විද්‍යා, භූගෝලවිද්‍යා, ඉතිහාසය, අන්තර්ජාතික අධ්‍යයන, පුස්තකාල හා විඥාපන විද්‍යා, ජනසන්නිවේදනය, දර්ශනය, දේශපාලන විද්‍යාව, සමාජ සංඛ්‍යානය, සමාජවිද්‍යා හා ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන යන අධ්‍යයන අංශ වේ. පීඨය මඟින් ශාස්ත්‍රවේදී උපාධිය සහ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය සඳහා විෂයයන් 18ක් පිරිනමයි. ඉහළ සුදුසුකම්ලත් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් එක් එක් විෂය සඳහා සිය දැනුම බෙදා දෙන අතර පීඨය මඟින් එක් එක් විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කීර්තිමත් විද්වතුන් ආරාධිත කථිකාචාර්යවරු ලෙස ආරාධනා කරයි. සෑම විටම ස්වාධීන ඉගෙනුම්වල නිරතවීම සඳහා සෑමවිටම ශිෂ්‍යයින්ව උනන්දු කරවයි. සෑම අධ්‍යයන අංශයක්ම සිය පීඨයේ ශිෂ්‍යයින්ගේ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම, නිපුණතා සහ නිර්මාණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ පරමාර්ථය ඇතිව එහි විෂයමාලාව, ශික්ෂණ හා ඉගෙනුම් ක්‍රමවේද සකස් කර ගනී. එමෙන්ම පාඨමාලාව මඟින් සමාජ විද්‍යාවන් සම්බන්ධයෙන් අධ්‍යයන හා පර්යේෂණ සිදු කිරීම පිළිබඳව අන්තර්විෂය හා බහුවිෂය ප්‍රවේශ ප්‍රවර්ධනය කරයි. ඉගෙනුම් සහ පර්යේෂණවල නියැලීම සම්බන්ධයෙන් වන විට, ශිෂ්‍යයින් සඳහා එක් එක් අධ්‍යයන අංශය තුළ ඉඩප්‍රස්ථා සහ පහසුකම් රාශියක් ලබා දෙයි. තව ද, පීඨය තුළ පුස්කොළ අත්පොත් අධ්‍යයන සහ පර්යේෂණ පුස්තකාලය, පරිගණක හා තොරතුරු තාක්ෂණ විද්‍යාගාරය, සමාජ විද්‍යා සඳහා වූ පර්යේෂණ කේන්ද්‍රය (RCSS), පීඨ පර්යේෂණ පුස්තකාලය සහ ශ්‍රවණාගාරය වැනි වෙනස් ආයතන, ඒකක සහ අංශ ශිෂ්‍යයින් සඳහා විවිධ මට්ටම්වල ඉගෙනුම් ක්‍රියාවලි සම්පාදනය කරයි.

### පීඨයේ දැක්ම

ස්වාධීන චින්තනය, විචක්ෂණ විශ්ලේෂණය, සමාජ වගකීම පිළිබඳ හැඟීම, සංස්කෘතික විවිධත්වය සහ ජනවාර්ගික වටිනාකම් සඳහා ගෞරවය පෝෂණය කරමින් විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ සහ පොදුවේ ආසියානු කලාපයේ සංවර්ධනය සඳහා කැපවීම ඇතිව අන්තර්-විෂය සහයෝගීතාව හරහා විශිෂ්ටත්වය පවත්වා ගැනීම..

### පීඨයේ මෙහෙවර

ශික්ෂණය, පර්යේෂණය, නවෝත්පාදනය සහ බුද්ධිමය නායකත්වය හරහා ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික, දේශපාලන, සංස්කෘතික සහ අධ්‍යාපනික සංවර්ධනය උසස් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

**පීඨයේ උපාධි වැඩසටහන් පිළිබඳ කෙටි හැඳින්වීම**

පීඨය මඟින් ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටම්වල අධ්‍යයන වැඩසටහන් පවත්වනු ලැබේ. ශාස්ත්‍රවේදී සහ ශාස්ත්‍රවේදී (ගෞරව) වැඩසටහන් ප්‍රථම උපාධි මට්ටමේ දී පවත්වනු ලබන අතර ශාස්ත්‍රපති (පාඨමාලා වැඩ සමඟ) (MA) සහ විද්‍යාපති (පාඨමාලා වැඩ සහ පර්යේෂණ සමඟ) (MSSc) උපාධි සෑම අධ්‍යයන අංශයක් මඟින්ම පශ්චාත් උපාධි මට්ටමේ දී පවත්වනු ලැබේ. මෙයට අමතරව, පීඨයේ ඇතැම් අධ්‍යයන අංශ මඟින් පශ්චාත් උපාධි ඩිප්ලෝමා කිහිපයක් ද පිරිනමනු ලැබේ. තව ද අධ්‍යයන අංශ වැඩි සංඛ්‍යාවක් විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මඟින් පිරිනමන සමාජ විද්‍යාවන්ට අදාළ දර්ශනපති සහ දර්ශනශූරී උපාධි කටයුතු අධීක්ෂණය කිරීමේ කටයුතු ද සිදු කරනු ලබයි.

**වර්තමාන ප්‍රගතිය**

සමාජීය විද්‍යා පීඨය, පීඨයක් ලෙස මෙන්ම තනි අධ්‍යයන අංශයක් ලෙස ජාතික සහ අන්තර්ජාතික මට්ටම්වල සම්මන්ත්‍රණ, පර්යේෂණ පරිසංවාද, සමුළු සහ පර්යේෂණ ව්‍යාපෘති පවත්වනු ලබයි. තව ද ග්‍රන්ථ එළිදැක්වීම, සංවත්සරික  හා පර්යේෂණ ප්‍රකාශන, අධ්‍යයන සම්මන්ත්‍රණ, වැඩමුළු සහ ආරාධිත දේශන ආදිය ද පීඨයේ අධ්‍යයන අංශ මඟින් සංවිධානය කරනු ලැබේ. කෙසේවුව ද, මේ වන විට කොවිඩ් 19 වසංගතය වැළැක්වීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ගන්නා ලද පියවරක් ලෙස විශ්වවිද්‍යාලය ශිෂ්‍යයින් සඳහා වසා දැමීම හේතුවෙන් පීඨයේ වැඩකටයුතු ද තාවකාලිකව නවත්වා ඇත. එමෙන්ම සියලුම අධ්‍යයන අංශ පාහේ ප්‍රථම උපාධි මට්ටමේ පාඨමාලා ඒකක සඳහා මාර්ගගත ශික්ෂණ වැඩසටහන් සාර්ථකව පවත්වනු ලැබේ.

**වසර තුළ අත්කර ගත් විශේෂ ජයග්‍රහණ**

2019/ 2020 අධ්‍යයන වර්ෂය තුළ දී පුරාවිද්‍යා අධ්‍යයන අංශය සහ චීනයේ ෂැන්හයි කෞතුකාගාරය මඟින් යාපනය අර්ධද්වීපයේ වසර පහක (2019-2013) කැණීම් ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර 2019 දෙසැම්බර් මාසයේ දී අවසන් විය. තව ද, අධ්‍යයන අංශය මඟින් චීනයේ සිචුවාන් විශ්වවිද්‍යාලය සමඟ එක්ව මන්තායි ඓතිහාසික මුහුදු වරායේ ද පුරාවිද්‍යා කැණීමක් ආරම්භ කර ඇත.

තව ද සමාජීය විද්‍යා පීඨයේ පර්යේෂණ කණ්ඩායමක් විසින් AHEAD (උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය) මෙහෙයුමේ DOR HEMS ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 10ක් වටිනා කීර්තිමත් පර්යේෂණ ප්‍රදානයක් දිනා ගැනීමට සමත්විය. "ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ සමාජ ආරක්ෂාවේ බලපෑම: ප්‍රත්‍යක්ෂමූලක විශ්ලේෂණයක්" යන්න මෙම පර්යේෂණයේ මාතෘකාව වේ.

**අනාගත අපේක්ෂාවන්**

පීඨයේ සමස්ත ඉලක්කය වන්නේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල අතුරින් ඉහළම ශ්‍රේණියේ සමාජ විද්‍යා හෝ කලා පීඨයක් බවට පත්වීම වේ. මෙම ඉලක්කය අත්කර ගැනීම සඳහා අවශ්‍ය පීඨයේ මානව සම්පතේ, පර්යේෂණ ධාරිතාව සහ යටිතලපහසුකම් සංවර්ධනය සහ වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව හඳුනා ගෙන ඇත. තව ද, අධ්‍යයන ක්‍රියාකාරකම් සහ ඉගෙනුම් ක්‍රියාවලි ගොඩනැගීම සඳහා විෂයමාලා සහ විෂය බාහිර ක්‍රියාකාරකම් සකස් කිරීම සහ සම්මිශ්‍රණය කිරීම ඉතා වැදගත් වන බවට ද හඳුනා ගෙන ඇත. එමෙන්ම ශිෂ්‍යයින්ගේ මෘදු කුසලතා ගොඩනැගීම අතරතුර ඔවුන්ගේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිපුණතා සහ ඉංග්‍රීසි භාෂා දැනුම ඉහළ නැංවීමේ අවශ්‍යතාව ද සපුරා ලිය යුතු වැදගත් අවශ්‍යතාවන් වේ.

තව ද, පීඨය පර්යේෂණ කටයුතු පුළුල් කිරීමට මෙන්ම ජාතියට සුභසිද්ධිය සලසනු පිණිස පර්යේෂණ කේන්ද්‍රීය උපාධිධාරීන් බිහි කිරීමේ ඉලක්කය ඇතිව අධ්‍යයන කාර්ය මණ්ඩලය මෙන්ම ශිෂ්‍යයින් ද හවුල් කර ගන්නා වඩාත් පුළුල් හා ප්‍රායෝගික පර්යේෂණ සංස්කෘතියක් සඳහා මුලපිරීමට අපේක්ෂා කරයි. තිරසර සංවර්ධන ඉලක්ක සමග පෙළගැස්සුනු ජාතික හා අන්තර්ජාතික ප්‍රමිතීන් සහ සම්මත මත පදනම් වූ ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි වැඩසටහන් සහ කාර්ය මණ්ඩල සංවර්ධනය පිළිබඳ විෂයමාලා ගොඩනැගීම වැනි ප්‍රධාන මූලාරම්භයන් කිහිපයක් ද සැලසුම් කර ඇත. සහයෝගීතා ව්‍යාපාර සම්බන්ධයෙන් සැලකීමේ දී කර්මාන්තය හා විදේශ විශ්වවිද්‍යාල සමග කටයුතු කිරීම සහ උනන්දුවක් දක්වන පාර්ශ්වයන් සමග සාකච්ඡා පවත්වා ගෙන යාම සඳහා වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

**මහාචාර්ය එම් එම් ගුණතිලක**
**පීඨාධිපති/ සමාජීය විද්‍යා පීඨය**

# 3. ශිෂ්‍ය තොරතුරු

2019 වසරේ දී විශ්වවිද්‍යාලය ප්‍රථම උපාධි වැඩසටහන් සඳහා ශිෂ්‍යයින් 3,381 දෙනෙක්, බාහිර ප්‍රථම උපාධි වැඩසටහන් සඳහා ශිෂ්‍යයින් 4,602 දෙනෙක් සහ පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා ශිෂ්‍යයින් 883 දෙනෙක් බඳවා ගෙන ඇත. 2019 වසර අවසානය වන විට විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධි ශිෂ්‍යයින් 12,107 දෙනෙක් සහ පශ්චාත් උපාධි ශිෂ්‍යයින් 1,984 දෙනෙක් අධ්‍යාපනය ලබමින් සිටි අතර බාහිර ප්‍රථම උපාධි වැඩසටහන්වල අධ්‍යයන කටයුතුවල නියැලි ශිෂ්‍යයින් සංඛ්‍යාව 101,705ක් විය.




*"විදුලකර පුනරාවලෝකන" අධ්‍යාපනික ප්‍රදර්ශනය 2019 නොවැම්බර් මස 27වැනි දින විශ්වවිද්‍යාල පරිශ්‍රයේ දී පවත්වන ලදී*

## 3.1. නව බඳවාගැනීම 2017/18 – අභ්‍යන්තර ප්‍රථම උපාධි වැඩසටහන්

2017/18 අධ්‍යයන වර්ෂයේ දී ප්‍රථම උපාධි වැඩසටහන් සඳහා දේශීය ශිෂ්‍යයින් 3,377දෙනෙක් සහ විදේශ ශිෂ්‍යයින් 4 දෙනෙක් බඳවා ගෙන ඇත. ශිෂ්‍යයින් බහුතරය ශිෂ්‍යාවන් වන අතර ඔවුන් සමස්ත ශිෂ්‍යයින් 3,377දෙනා අතුරින් 68%ක් නිරූපණය කරයි. 3-1 වගුව සහ 3-1 රූපසටහන මඟින් පීඨ අනුව ශිෂ්‍යයින් බෙදීයාම නිරූපණය කරන අතර 3-2 රූපසටහන මඟින් ස්ත්‍රී-පුරුෂභාවය අනුව ශිෂ්‍යයින් බෙදීයාම නිරූපණය කරයි.

*3-1 වගුව: පීඨ අනුව නව බඳවාගැනීම*

| පීඨය | බඳවා ගැනීම |
|---|---|
| වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය | 731 |
| පරිගණක හා තාක්ෂණ පීඨය | 207 |
| මානවශාස්ත්‍ර පීඨය | 774 |
| වෛද්‍ය පීඨය | 219 |
| විද්‍යා පීඨය | 674 |
| සමාජීය විද්‍යා පීඨය | 776 |
| එකතුව | 3381 |




*3-2 රූපසටහන: ස්ත්‍රී-පුරුෂභාවය අනුව නව බඳවාගැනීම*




*3-1 රූපසටහන: පීඨය අනුව නව බඳවා ගැනීම*

### අ. දේශීය ප්‍රවේශය

පීඨ, උපාධි වැඩසටහන් අනුව 2017/18 වසරේ නවක ශිෂ්‍යයින්, අනුරූපී බඳවා ගැනීම් විධිවිධාන සහ එක් එක් පාඨමාලාව හදාරන තථ්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව පහත දැක්වෙන 3-2 වගුවෙන් නිරූපණය වේ.

*3-2 වගුව: උපාධි වැඩසටහන් සඳහා ඇතුළුවන නවකයින් - දේශීය ප්‍රවේශය*

| පීඨය | උපාධි වැඩසටහන | බඳවාගැනීමේ වසර | එකඟ වූ ඇතුළුකර ගැනීම | හදාරන සංඛ්‍යාව |
|---|---|---|---|---|
| වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය | වාණිජ | 2017/18 | 200 | 195 |
| | මූල්‍ය ඉංජිනේරු ශිල්පය | | 50 | 49 |
| | කළමනාකරණය | | 500 | 487 |
| පරිගණක තාක්ෂණ පීඨය | ඉංජිනේරු තාක්ෂණය | | 75 | 85 |
| | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | | 75 | 73 |
| | පරිගණක විද්‍යාව | | 50 | 49 |
| මානවශාස්ත්‍ර පීඨය | පරිවර්තන අධ්‍යයන | | 25 | 26 |
| | චිත්‍රපට හා රූපවාහිනී අධ්‍යයන | | 50 | 50 |
| | දෙවැනි භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම | | 50 | 28 |
| | හින්දු | | 15 | 9 |
| | රුසියානු භාෂාව | | 20 | 10 |
| | ජර්මන් භාෂාව | | 20 | 18 |
| | ඉංග්‍රීසි භාෂාව | | 25 | 21 |
| | සාහිත්‍ය විචාරය | | 20 | 15 |
| | බටහිර සම්භාව්‍ය සංස්කෘතිය | | 10 | 7 |
| | ක්‍රිස්තියානි සංස්කෘතිය | | 10 | 7 |
| | ප්‍රංශ භාෂාව | | 15 | 11 |
| | සංස්කෘත | | 20 | 16 |
| | පාලි | | 20 | 18 |
| වෛද්‍ය පීඨය | වෛද්‍ය විද්‍යාව | | 165 | 171 |
| | කථන හා ශ්‍රවණ විද්‍යාව | | 50 | 44 |
| විද්‍යා පීඨය | ජීවවිද්‍යාව | | 185 | 169 |
- කැලණිය විශ්වවිද්‍යාලයේ කඩදාසි කසළ කළමනාකරණය විධිමත් කිරීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන විධිමත් කිරීම
- කඩදාසි ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය
- තොරතුරු තාක්ෂණය සහ ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය භාවිතා කිරීම ඉහළ නැංවීම

## 9.8. දේශගුණික ක්‍රියාකාරකම්




කැලණිය විශ්වවිද්‍යාලය තිරසාර සංවර්ධන ඉලක්කවල' විස්තර කර ඇති 'දේශගුණික ක්‍රියාකාරකම්' සම්බන්ධයෙන් පියවර කිහිපයක්ම ගනු ලබන අතර තිරසාර විසඳුම් සඳහා කේන්ද්‍රය CSS මඟින් ක්‍රියාත්මක කරන ක්‍රියාකාරකම් පහත දැක්වේ. මෙම වැඩසටහන් ඉහදිරි වසර 5ක කාලය සඳහා ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

- විශ්වවිද්‍යාලයේ වගා කර ඇති මුළු වෘක්ෂලතා සහ හරිත තාප්ප ප්‍රමාණය 10%කින් ඉහළ නැංවීම
- පැළ තවාන පුළුල් කිරීම
- (දළුගම සහ රාගම පරිශ්‍රවල) වන සතුන් සඳහා වාසස්ථාන වැඩි කිරීම

## 9.9. මිහිමත ජීවිතය

තිරසාර විසඳුම් සඳහා කේන්ද්‍රය මඟින් (CSS) "මිහිමත ජීවය" වැඩිදියුණු කිරීම සඳහා 2018 ජුනි මස 05වැනි දින ලෝක පාරිසික දිනය සැමරීම නිමිත්තෙන් ප්‍රජාව සඳහා පැළ බෙදාදීමේ වැඩසටහනක් දියත් කළ අතර ඔවුන්ගේ ක්‍රියාකාරකම් තුළින් ඉහත සඳහන් කර ඇති 13වැනි ඉලක්කය වන දේශගුණික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දිගු කාලීන ධනාත්මක බලපෑමක් සිදු වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. තව ද, සත්ව ගහනය සංරක්ෂණය කිරීම සඳහා විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පාංශු ඛාදනය අවම කිරීම සඳහා පියවර ගනු ලැබේ.

## 9.10. ඉලක්ක සඳහා හවුල්කාරීත්වය

කැලණිය විශ්වවිද්‍යාලය තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම පිණිස 'හවුල්කාරත්වයන්' ඇති කර ගන්නා අතර මෑතක දී පුත්තලම දිස්ත්‍රික්කයේ කරුවලගස්වැව ප්‍රදේශයේ හඳුනා ගත් හෙක්ටයාර 150ක වනාන්තර ප්‍රදේශයක් සංවර්ධනය කිරීම සඳහා වන දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම කටයුත්ත දතිරසාර විසඳුම් සඳහා කේන්ද්‍රය මඟින් සම්බන්ධීකරණය කරන ලදී. එමෙන්ම විශ්වවිද්‍යාලයේ හරිත ගහනය වැඩි කිරීම සඳහා වට මේස සාකච්ඡා පැවැත්වීමට ද සැලසුම් කර ඇත.

# දෙවැනි කොටස

# මූල්‍ය ප්‍රකාශන තොරතුරු සහ විගණන තොරතුරු - 2019

# 10. මූල්‍ය ප්‍රකාශන තොරතුරු

කැලණිය විශ්වවිද්‍යාලයේ 2019 වසර සඳහා වූ මූල්‍ය තොරතුරු සහ අවසාන ගිණුම් මෙම කොටසේ දැක්වේ.



## 10.1 මූල්‍ය ප්‍රකාශන

**කැලණිය විශ්වවිද්‍යාලය 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| ආදායම | සටහන | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| **රජයේ ප්‍රදාන** | | | |
| රජයේ ප්‍රදාන- පුනරාවර්තන වියදම් සඳහා | 2 | 3,775,000,000 | 3,030,000,000 |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන වියදම් | | 32,805,036 | 95,959,833 |
| අභ්‍යන්තර ආදායම | 3 | 1,665,273,405 | 1,497,728,006 |
| රජයේ ප්‍රදාන හා ආධාර/ප්‍රත්‍යාගණන සංචිත ක්‍රමක්ෂය | | 768,811,881 | 523,626,209 |
| මහපොළ සඳහා ප්‍රදාන | | 117,816,450 | 251,662,000 |
| ශිෂ්‍යාධාර සඳහා ප්‍රදාන | | 61,371,100 | 36,224,900 |
| **මුළු ආදායම** | | **6,421,077,872** | **5,435,200,948** |
| **වියදම්** | | | |
| පෞද්ගලික පාරිතෝෂික | 4 | (3,489,497,380) | (2,692,109,737) |
| ගමන් වියදම් | 5 | (8,006,006) | (5,388,708) |
| සැපයුම් | 6 | (107,636,756) | (93,990,579) |
| නඩත්තු වියදම් | 7 | (24,592,110) | (37,919,479) |
| කොන්ත්‍රාත් සේවා | 8 | (454,086,529) | (417,849,395) |
| වෙනත් පුනරාවර්තන | 9 | (152,615,353) | (209,762,459) |
| පාරිතෝෂික වෙන් කිරීම් | | (132,856,976) | (44,852,387) |
| ගාස්තු අය කරන පාඨමාලා/ විශේෂ සේවාවලට වියදම් | | (225,810,014) | (208,471,736) |
| සංවර්ධන අරමුදල සඳහා වියදම් | 10 | (302,532,626) | (173,875,114) |
| පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් වියදම් | | (32,805,036) | (95,959,833) |
| ස්ථාවර වත්කම් අපහරන අලාභය | | (365,000) | |
| ක්ෂයවීම් | | (610,220,892) | (546,614,209) |
| අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමක්ෂය | | (10,368,215) | (6,526,063) |
| වියදම් - ශිෂ්‍යාධාර | | (61,371,100) | (36,224,900) |
| වියදම් - මහපොළ ශිෂ්‍යත්ව | | (117,816,450) | (251,662,000) |
| **මුළු වියදම්** | | **(5,730,580,444)** | **(4,821,206,598)** |
| **වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය)** | | **690,497,428** | **613,994,350** |

## කැලණිය විශ්වවිද්‍යාලය
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| වත්කම් | සටහන | 2019.12.31 දිනට රු. | 2018.12.31 දිනට රු. |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | **11** | 11,360,550,957 | 10,504,254,299 |
| පුස්තකාල පොත් සහ ලෝගු | **12** | 37,734,789 | 49,226,155 |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | **13** | 1,482,068,586 | 1,545,387,842 |
| අස්පෘශ්‍ය වත්කම් | **14** | 29,074,292 | 39,415,007 |
| මූල්‍ය වත්කම් | **15** | 3,725,353,831 | 3,625,644,543 |
| | | **16,634,782,455** | **15,763,927,846** |
| **ජංගම වත්කම්** | | | |
| බඩු ලේඛනය | **16** | 41,238,457 | 30,930,694 |
| විවිධ ණයගැතියෝ සහ ලැබිය යුතු දෑ | **17** | 329,290,191 | 257,872,853 |
| ප්‍රවර්තන මූල්‍ය වත්කම් | | | |
| කාර්ය මණ්ඩලයට අත්තිකාරම් | **18** | 1,147,147 | 1,649,437 |
| අත්තිකාරම් හා පෙර ගෙවීම් | **19** | 171,576,970 | 190,414,629 |
| මුදල් හා මුදල් සමාන දෑ | **20** | 157,782,065 | 254,964,378 |
| | | **701,034,830** | **735,831,991** |
| **මුළු වත්කම්** | | **17,335,817,285** | **16,499,759,836** |
| **සාමාන්‍ය කොටස් හා බැරකම්** | | | |
| **සමකොටස්** | | | |
| වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන | **21** | 5,479,252,287 | 5,510,729,329 |
| වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | **22** | 131,464,984 | 243,898,936 |
| අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිත ගොඩනැගිලි ව්‍යාපෘති අරමුදල | **23** | 17,272,548 | 234,115,705 |
| වත්කම් ප්‍රතිඇගයුම් සංචිතය | | 7,517,362,872 | 6,857,144,861 |
| පොදු සංචිතය | | 307,461,794 | 510,361,655 |
| | | **13,452,814,485** | **13,356,250,486** |
| **සංචිත හා සීමා කළ අරමුදල්** | | | |
| අභ්‍යන්තර සීමා කළ අරමුදල | **24** | 1,108,541,084 | 936,122,217 |
| පරිත්‍යාග අරමුදල් | **25** | 20,222,773 | 18,137,447 |
| පර්යේෂණ ප්‍රදාන | **26** | 133,161,640 | 127,076,403 |
| අත්තිකාරම් ලෙස ලැබුනු ආදායම | **27** | 1,000,248,086 | 966,925,078 |
| | | **2,262,173,583** | **2,048,261,145** |

| | සටහන | 2019.12.31 දිනට රු. | 2018.12.31 දිනට රු. |
|---|---|---|---|
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | **28** | 1,267,115,037 | 500,778,893 |
| | | **1,267,115,037** | **500,778,893** |
| **ජංගම බැරකම්** | | | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | **29** | 154,551,491 | 147,772,516 |
| උපචිත වියදම් සහ වෙනත් ගෙවීම් | **30** | 199,162,690 | 446,969,798 |
| | | **353,714,180** | **594,469,314** |
| **මුළු සමකොටස් සහ බැරකම්** | | **17,335,817,285** | **16,499,759,836** |

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කළ රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූල සකස්කර ඉදිරිපත් කර ඇත.

යූ ටී එම් අයි ඩී තෙන්නකෝන්
මූල්‍යාධිකාරී

පාලක සභාව වෙනුවෙන් සහ සඳහා අත්සන් කරනු ලැබ මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා විශ්වවිද්‍යාල පාලක සභාව වගකීම දරනු ලබයි.

මහාචාර්ය ඩී. එම්. සේමසිංහ
උපකුලපති

මහාචාර්ය එල්. සෙනෙවිරත්න
පාලක සභා සාමාජික

මහාචාර්ය ආරියරත්න ජයමහ
පාලක සභා සාමාජික

කැළණිය,
2020 පෙබරවාරි 28 වැනි දින

## කැලණිය විශ්වවිද්‍යාලය

## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමකොටස්වල සිදු වූ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය

| | **වියදම් කළ ප්‍රාග්ධනය** | **වියදම් නොකළ ප්‍රාග්ධනය** | **අමාත්‍යමණ්ඩලය අනුමත කළ ගොඩනැගිලි ව්‍යාපෘතිය** | **ප්‍රත්‍යාගණන අතිරික්තය** | **රඳවාගත් ඉපැයීම්** | **සංචිත හා සීමාකළ අරමුදල්** | **එකතුව** |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **2018 ජනවාරි 01 දිනට ශේෂය** | 4,950,437,607 | 440,426,491 | 249,685,162 | 1,121,260,134 | 17,225,116 | 1,981,378,241 | 8,760,412,751 |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(හිඟය) | | | | | 613,994,350 | | 613,994,350 |
| මාරු කිරීම්/ දළ සංචලන | 560,291,722 | (196,527,555) | (40,569,456) | 5,735,884,727 | (10,126,821) | (38,848,086) | 6,010,104,531 |
| වෛද්‍ය උපාධිය සඳහා මාරු කළ අරමුදල් | | | | | (21,184,571) | 21,184,571 | - |
| අරමුදල් මාරුකිරීම් | | | 25,000,000 | | 50,000,000 | (75,000,000) | - |
| ගාස්තු අය කරන පාඨමාලාවලින් මාරු කළ අරමුදල් | | | | | (142,264,489) | 142,264,489 | - |
| පුස්තකාල අරමුදල් සඳහා මාරු කළ අරමුදල් | | | | | (17,281,930) | 17,281,930 | - |
| ගොඩනැගිලි කුලිය සඳහා පෙර වසරේ ගැලපීම | | | | | 20,000,000 | | 20,000,000 |
| **2018 දෙසැම්බර් 31දිනට ශේෂය** | **5,510,729,329** | **243,898,936** | **234,115,706** | **6,857,144,861** | **510,361,655** | **2,048,261,145** | **15,404,511,632** |
| | | | | | | | |
| | **වියදම් කළ ප්‍රාග්ධනය** | **වියදම් නොකළ ප්‍රාග්ධනය** | **අමාත්‍යමණ්ඩලය අනුමත කළගොඩනැගිලි ව්‍යාපෘතිය** | **ප්‍රත්‍යාගණන අතිරික්තය** | **රඳවාගත් ඉපැයීම්** | **සංචිත හා සීමාකළ අරමුදල්** | **එකතුව** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **2019 ජනවාරි 01 දිනට ශේෂය** | **5,510,729,329** | **243,898,936** | **234,115,706** | **6,857,144,861** | **510,361,655** | **2,048,261,145** | **15,404,511,632** |
| වසර සඳහා අතිරික්තය/(හිඟය) | | | | | 690,497,428 | | 690,497,428 |
| මාරු කිරීම්/ දළ සංචලන | (31,477,042.00) | (112,433,952) | (216,843,158) | 660,218,011 | 219,693 | 6,781,084 | 306,464,636 |
| වෛද්‍ය උපාධිය සඳහා අරමුදල් මාරු කිරීම | | | | | (37,725,892) | 37,725,892 | - |
| අධ්‍යයන පර්යේෂණවලින් මාරු කළ අරමුදල් | | | | | 16,533,410 | (16,533,410) | - |
| ගාස්තු අය කරන පාඨමාලාවලින් මාරු කළ අරමුදල් | | | | | (120,470,706) | 120,470,706 | - |
| CDCEවලින් මාරු කළ අරමුදල් | | | | | (56,317,963) | 56,317,963 | - |
| පුස්තකාල අරමුදල් සඳහා මාරු කළ අරමුදල් | | | | | (9,150,204) | 9,150,204 | - |
| PV-DBO පිළිබඳ ජීවගණක (ලාභය)/අලාභය | | | | | (686,485,628) | | - |
| **2019 දෙසැම්බර් 31දිනට ශේෂය** | **5,479,252,287** | **131,464,984** | **17,272,548** | **7,517,362,872** | **307,461,794** | **2,262,173,583** | **16,401,473,697** |

## කැලණිය විශ්වවිද්‍යාලය
## 2019 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2019 දෙසැම්බර් 31වැනි දිනට රු. | 2018 දෙසැම්බර් 31වැනි දිනට රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහ** | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය (හිඟය) | | 690,497,428 | 613,994,350 |
| **ගැලපීම්** | | | |
| ක්ෂයවීම් | | 610,220,892 | 546,614,209 |
| ආයෝජනවලින් පොළිය | | (430,928,787) | (323,056,243) |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | 132,856,976 | 44,852,387 |
| ආණ්ඩුවේ ප්‍රදාන හා ප්‍රදාන ක්‍රමක්ෂය | | (768,811,881) | (523,626,209) |
| අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමක්ෂය | | 10,368,215 | 6,526,063 |
| ස්ථාවර වත්කම් අපහරණය පිළිබඳ අලාභය | | 365,000 | - |
| රජයේ ප්‍රදානය- පුනරුත්ථාපනය නඩත්තු කිරීම | | (32,805,036) | - |
| විශ්වවිද්‍යාල අරමුදල් සඳහා ආදායම වෙන්කිරීම/මූල්‍ය නොවන ගැලපීම් | | (223,664,765) | (4,674) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | | **(11,901,956)** | **(365,299,883)** |
| **කාරක ප්‍රාග්ධනයේ වැඩිවීම/ (අඩුවීම)** | | | |
| බඩු ලේඛනවල අඩුවීම (වැඩිවීම) | | (10,307,763) | 9,442,048 |
| විවිධ ණයකරුවන් හා ලැබිය යුතු දේවල අඩුවීම (වැඩිවීම) | | 194,028,995 | (189,063,229) |
| කාර්යමණ්ඩලයට ණය හා අත්තිකාරම්වල අඩුවීම (වැඩිවීම) | | 4,883,973 | - |
| අත්තිකාරම් හා පෙර ගෙවීම්වල අඩුවීම (වැඩිවීම) | | 18,837,659 | 147,027,902 |
| පෙර ගෙවීම් හා තැම්පතුවල අඩුවීම (වැඩිවීම) | | - | 1,353,877 |
| උපචිත හා වෙනත් ගෙවිය යුතු වියදම්වල අඩුවීම (වැඩිවීම) | | (247,534,108) | 260,367,831 |
| නැවත ගෙවිය යුතු තැන්පතුවල අඩුවීම (වැඩිවීම) | | 6,778,975 | 20,764,968 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පසු මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | | **(45,214,227)** | **615,193,280** |
| පාරිතෝෂික ගෙවීම් | | (53,006,460) | (39,480,908) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | | **(98,220,687)** | **575,712,372** |
| **ආයෝජන කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහ** | | | |
| දේපොළ පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | | (280,348,029) | (409,787,930) |
| දේපොළ පිරියත හා උපකරණවලින් අලෙවි ආදායම | | 955,000 | - |
| ආයෝජන පොළිය | | 165,482,453 | 323,056,243 |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | | (293,621,454) | (619,103,880) |
| අස්පෘෂ්‍ය වත්කම් | | (27,500) | (25,237,894) |
| ආයෝජන | | (104,090,971) | (584,087,275) |
| සීමා කළ අරමුදල් හා ප්‍රදාන | | (5,713,134) | 74,084,623 |
| **ආයෝජන කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | | **(517,363,634)** | **(1,241,076,113)** |
| **මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහය** | | | |

| | | | |
|---|---|---|---|
| ආණ්ඩුවේ ප්‍රදානය - ප්‍රාග්ධන | | 443,500,000 | 649,040,167 |
| වෙනත් විශේෂ ප්‍රදාන - ප්‍රාග්ධන | | - | 50,000,000 |
| බාහිර අරමුදල් උපයෝජනය | | 74,902,010 | 36,281,622 |
| **මුදල් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **518,402,010** | **735,321,789** |
| | | | |
| මුදල් හෝ මුදල් සමාන දේවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | | (97,182,313) | 69,958,049 |
| වර්ෂය මුල දී මුදල් හා මුදල් සමාන දේ | **20** | 254,964,378 | 185,006,329 |
| **වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දේ** | **20** | **157,782,065** | **254,964,378** |

# කැලණිය විශ්වවිද්‍යාලය

## 2019 මූල්‍ය ප්‍රකාශන සඳහා වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

## 1. ආයතනික තොරතුරු

### 1.1 වාර්තාකරන ආස්ථිතිය

කැලණිය විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරන පනත මගින් සංස්ථාගත කර ඇති අතර කැළණිය, දළුගම පිහිටා ඇත. විශ්වවිද්‍යාලය උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. 2019 නොවැම්බර් මස 27වැනි දිනට පෙර විශ්වවිද්‍යාලය නගර සැලසුම්කරණය, ජල සම්පාදනය හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය.

### 1.2 මෙහෙයුම් ස්වභාවය සහ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන කටයුතු

ජාතික විශ්වවිද්‍යාලයක් වන මෙය ප්‍රධාන වශයෙන් රජයේ අරමුදල් මඟින් මෙහෙයවනු ලබයි.

විශ්වවිද්‍යාලය වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය, මානවශාස්ත්‍ර පීඨය, සමාජීය විද්‍යා පීඨය, විද්‍යා පීඨය, වෛද්‍ය පීඨය, පරිගණක හා තාක්ෂණ පීඨය සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය යන පීඨ හතකින් සමන්විත වේ.

තිරසර සංවර්ධනය උදෙසා දැනුම බිහි කිරීමේ සහ බෙදාහැරීමේ විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම එහි

දැක්ම වේ. ශික්ෂණය, ඉගෙනුම හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම විශ්වවිද්‍යාලයේ මූලික කටයුතු වේ.

විශ්වවිද්‍යාලයේ අරමුණු පහත දැක්වෙන පරිදි වේ:

i. උසස් ගුණාත්මක හා නම්‍යශීලී ශික්ෂණ හා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම
ii. විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික ඉලක්ක සපුරා ගැනීම පිණිස උසස් ගුණාත්මක පීඨ සහ කාර්ය මණ්ඩලයක් ගොඩනැගීම
iii. ගෝලීය ප්‍රමිතියෙන් යුත් බහු-විෂය පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කිරීම
iv. ආර්ථික හා සාමාජීය සබඳතා නිරතවීම් පුළුල් කිරීම මඟින් විශ්වවිද්‍යාලයේ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම
v. ඵලදායී හා කාර්යක්ෂම පරිපාලනයක් හා මූල්‍ය කළමනාකරණයක් හරහා විශිෂ්ට පාලන ක්‍රමයක් ගොඩනැගීම

### 1.3 මූල්‍ය ප්‍රකාශන සඳහා බලයදීමේ දිනය

පාලක සභාවේ සාමාජිකයින් මඟින් 2020.02.28 වැනි දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය දෙන ලදී.

### 1.4 මූල්‍ය ප්‍රකාශනවල වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීමත්, වංචාව හෝ දෝෂය හේතුකර ගෙන සැලකිය යුතු වැරදිවලින් තොර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අවශ්‍ය බවට කළමනාකාරීත්වය තීරණය කරන අභ්‍යන්තර පාලන සම්බන්ධයෙන් ද කළමනාකාරීත්වය වගකීම දරයි.

මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතය පහත දැක්වෙන පරිදි වේ.

i. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය
ii. මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය
iii. ශුද්ධ වත්කම්/ සමකොටස්වල සිදු වූ වෙනස පිළිබඳ ප්‍රකාශනය
iv. මුදල් ප්‍රවාහන ප්‍රකාශනය
v. අයවැය සහ තථ්‍ය අගයන් සැසඳීම් ප්‍රකාශනය
vi. සටහන්, වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති සහ වෙනත් පැහැදිලි කිරීමේ සටහන්

### 1.5 මූල්‍ය කාලපරිච්ඡේදය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාලපරිච්ඡේදය 2019 ජනවාරි 01වැනි දින සිට 2019 දෙසැම්බර් 31වැනි දින දක්වා මාස දොළහක කාලපරිච්ඡේදය නිරූපණය කරයි.

## 2. සකස් කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශනය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශන, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය, සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් යනාදියෙන් මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2/2018 දරන මූල්‍ය චක්‍රලේඛ ලිපියෙන් අනුකූල කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්වල I, II, සහ III දරන වෙළුම්වලට අනුකූලව මෙම ප්‍රකාශන සකස් කර ඇත. අදාළ කර ගනු ලබන ගිණුම් ප්‍රතිපත්ති පූර්ව වර්ෂයේ භාවිතා කළ ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූල වේ. යොදා ගත් ගිණුම්කරණ ප්‍රමිතීන් පෙර මූල්‍ය වර්ෂයේ දී භාවිතා කළ ප්‍රමිතීන්ට අනුකූල වේ. කෙසේවුව ද, රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් යොදා ගැනීමට නොමැති අවස්ථාවල දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ද භාවිතා කර ඇත.

### 2.2 තක්සේරු කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇති අතර අඛණ්ඩ යොදා ගනු ලැබේ. සාධාරණ වටිනාකමට අනුව මනිනු ලබන දේපළ, පිරියත හා උපකරණ සහ ජීවගණ වටිනාකම් ක්‍රමය මත පදනම්ව මනිනු ලබන විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා හැරුණු කොට මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නොමැත. විශේෂිත ප්‍රතිපත්ති පසුව එළැඹෙන සටහන්වල පැහැදිලි කර ඇත.

### 2.3 අඛණ්ඩභාවය

විශ්වවිද්‍යාලය කෙරී ගෙන යන පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. පාලක සභාව මඟින් පූර්වේක්ෂණය කළ හැකි අනාගතයේ දී කෙරී ගෙන යන්නක් ලෙස විශ්වවිද්‍යාලයේ අඛණ්ඩභාවයේ හැකියාව පිළිබඳව තක්සේරුවක් සිදු කර ඇත. තව ද, කෙරී ගෙන යන්නක් ලෙස විශ්වවිද්‍යාලයේ හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු සැකයක් මතු කළ හැකි වැදගත් කිසිවක් පිළිබඳව සනාථන සභාව දැනුවත් නොවන අතර ඔවුන් විශ්වවිද්‍යාලය ද්‍රවශීල කිරීමට හෝ එහි මෙහෙයුම් නැවැත්වීම අදහස් කරනු නොලැබේ. එබැවින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩභාවය පදනම මත දිගමට සකස් කර තිබේ.

### 2.4 ගිණුම්කරණය පිළිබඳ උපචිත පදනම

මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනය පිළිබඳ තොරතුරු හැරුණු කොට මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණය පිළිබඳ උපචිත පදනම අනුගමනය කරමින් සකස් කර ඇත.

### 2.5 කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් වර්ගය

විශ්වවිද්‍යාලය විසින් භාවිතා කරනු ලබන සහ ඉදිරිපත් කරනු ලබන ව්‍යවහාර මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

### 2.6 වැදගත්භාවය සහ සමූහනය

සමාන අයිතමවල සෑම වැදගත් පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ කාර්යයන් ඇති අයිතම වැදගත් නොවන්නේ නම් මිස වෙනම ඉදිරිපත් කර ඇත.

### 2.7 තුලනාත්මක තොරතුරු

මෙයට පෙර මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ අදාළ වන පරිදි ප්‍රමාණාත්මක, විස්තරාත්මක තොරතුරු ඇතුළු තුලනාත්මක තොරතුරු හෙළිදරව් කර ඇත. වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සහ ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම් සමග තුලනය කිරීම සඳහා පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

### 2.8 වටැයිම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්වල අවසර දී ඇති පරිදි වෙනත් ආකාරයකට දක්වා ඇති විට හැරුණු කොට ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්න රුපියලට වටයා ඇත.

### 2.9 අනුලම්බ ගැනීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්වල අවසර දී හෝ ඒ අනුව අවශ්‍ය කරන්නේ නම් මිස වත්කම් හා වගකීම් හෝ ආදායම හා වියදම් අනුලම්භ කර නොමැත.

### 2.10 වාර්තා කරන කාලපරිච්ඡේදයට පසු සිදුවීම්

වාර්තා කරන දිනයට පසුව එළැඹෙන සියලුම වැදගත් සිදුවීම් සලකා බලන ලදුව අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනවල නිසි ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

### 2.11 විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සහ ශේෂයන්

ගනුදෙනුවල දිනට පවතින හුවමාරු වටිනාකම භාවිතා කරමින් හෝ අයිතම ප්‍රති මිනුම් වටිනාම අනුව විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු කෘත්‍ය ව්‍යවහාර මුදල් ඒකකයට පරිවර්තනය කර ඇත. එවැනි ගනුදෙනු නිරවුල් කිරීමේ සහ විදේශ මුදල්වලින් දක්වා ඇති මූල්‍ය වත්කම් හා වගකීම් වසර අවසානයේ ඇති හුවමාරු අනුපාතිකයට සිදු කරන ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස සිදු වන විදේශ ව්‍යවහාර මුදල් ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 3.1 වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

### 3.1.1 දේපළ, පිරියත සහ උපකරණ

විශ්වවිද්‍යාලය සේවා සැපයීමේ දී හෝ පරිපාලන කාර්යයන් සඳහා සහ වසරකට වැඩි කාලයක් භාවිතා කිරීමට අපේක්ෂා කරමින් භාවිතා කරනු ලබන හා දරනු ලබන හෝ එහි හිමිකාරත්වය ඇති වත්කම් සඳහා වගකීමේ දී "දේපළ, පිරියත සහ උපකරණ" සම්බන්ධයෙන් ඇතිශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් අංක 07හි අවශ්‍යතාවන් අදාළ කරයි.දේපළ, පිරියත සහ උපකරණ සඳහා ඉඩම්, ගොඩනැගිලි හා වැඩිදියුණු කිරීම්, ගෘහ භාණ්ඩ හා උපකරණ, රසායනාගාර හා ශික්ෂණ උපකරණ, මෝටර් රථ, ජලය හා විදුලිය සම්පාදන යෝජනාක්‍රම, පුස්තකාල පොත් හා වාරසඟරා, ලෝගු, යන්ත්‍රෝපකරණ හා වෙනත් වත්කම් ඇතුළත් වේ.

#### 3.1.1.1 පිළිගැනීමේ පදනම

වත්කම්වල අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන්නේ නම් සහ වත්කමේ පිරිවැය විශ්වාසනීයව මැනිය හැක්කේ නම් දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගනී.

#### 3.1.1.2 මුල් හඳුනා ගැනීම

දේපළ, පිරියත සහ උපකරණමූලික හඳුනා ගැනීමෙන් පසුව වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් තත්ත්වයට පත් කිරීමට, ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා දරූ කිසියම් ආනුශංගික වියදම් ඇතිව මිල දී ගැනීමේ දී දරූ පිරිවැය ඇතුළුව පිරිවැයට මූලිකවම හඳුනා ගන්නා අතර දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත අපචයවීම් අලාභ සඳහා අඩු කිරීම් සිදු කිරීමෙන් පසු දරන ලද පිරිවැයට මනිනු ලැබේ.

### 3.1.1.3 පසු කාලීන පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණයක අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය එකී කොටසේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන්නේ නම් සහ එහි පිරිවැය විශ්වාසනීයව මැනිය හැක්කේ නම් අයිතමයේ ධාරණ අගයට හඳුනා ගනු ලැබේ. පහත දක්වා ඇති හඳුනා නොගැනීමේ ප්‍රතිපත්තියට අනුව ප්‍රතිස්ථාපිත කොටසේ ධාරණ අගය හඳුනා නොගනී.

දේපළ, පිරියත සහ උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව සඳහා වන පිරිවැය දැරූ පරිදි මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇත.

### 3.1.1.4 හඳුනා නොගැනීම

දේපළ, පිරියත සහ උපකරණයක අයිතමයක ධාරණ අගය එය බැහැර කරන විට හෝ එහි භාවිතාවෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හඳුනා නොගනී. (ශුද්ධ බැහැර කිරීමේ අදායම සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කළ) හඳුනා නොගැනීම පිළිබඳ කිසියම් ලාභයක් හෝ අලාභයක් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී. ලාභ ආදායම ලෙස වර්ගීකරණය නොකරයි.

### 3.1.1.5 ක්ෂයවීම්

වත්කම් ඇස්තමේන්තුගත ප්‍රයෝජනයට ගත හැකි ආයුකාලය මත එම වත්කම්වල පිරිවැය කපා හැරීම සඳහා වාර්ෂිකව පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් සරල රේඛීය පදනම මත මූල්‍ය ප්‍රතිඵල ප්‍රකාශනයට ක්ෂයවීම් ඇතුළත් කොට ඇත. වත්කමක් භාවිතය සඳහා ඇති අවස්ථාවේ සිට වත්කමේ ක්ෂයවීම ආරම්භ වන අතර වත්කම අලෙවිකිරීම සඳහා දරා ඇති ලෙස වර්ගීකරණය කර ඇති දිනය සහ වත්කම හඳුනා නොගන්නා දිනය යන දින අතුරින් කලින් එළැඹෙන දිනයේ දී අවසන් වේ.

ප්‍රවර්තන සහ තුලනාත්මක කාලපරිච්ඡේද සඳහා ඇස්තමේන්තු කළ ප්‍රයෝජනයට ගත හැකි ආයුකාලයන් පහත දැක්වෙන පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි හා වැඩිදියුණු කිරීම් | වසර 20 |
| ගෘහභාණ්ඩ හා උපකරණ | වසර 10 |
| රසායනාගාරය හා ශික්ෂණ උපකරණ | වසර 5 |
| මෝටර් රථ වාහන | වසර 5 |
| ජලය හා විදුලිය සැපයුම් යෝජනා ක්‍රමය | වසර 10 |
| පුස්තකාල පොත් හා වාරසඟරා | වසර 5 |
| ලෝගු | වසර 5 |
| යන්ත්‍රසූත්‍ර | වසර 5 |
| වෙනත් වත්කම් | වසර 5 |

වත්කමේ ධාරණ අගය එහි ඇස්තමේන්තු කළ ආපසු ලබා ගත හැකි අගයට වඩා වැඩි වන්නේ නම්, වත්කමේ ධාරණ අගය වහාම එහි ආපසු ලබා ගත හැකි අගයට ලියා ගන්නා බැවින් වත්කමේ අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනයට ගත හැකි ආයුකාලය, යෝග්‍ය වන්නේ නම්, සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේ දීම සමාලෝචනය කර, ගලපනු ලැබේ.

බැහැර කිරීම් පිළිබඳ ලාභය සහ අලාභය ධාරණ අගයෙන් ලබන මුදල සැසඳීම මඟින් තීරණය කරනු ලබන අතර ලාභය (අලාභය) විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනවල හඳුනා ගනී.

### 3.1.1.6 හඳුනා ගැනීමෙන් පසුව මැනීම

- **පිරිවැය ආකෘතිය**

ඉඩම් පන්ති හැරුණු කොට සියලුම දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගැනීමෙන් පසුව සමුච්චිත ක්ෂයවීම අඩු කර එහි පිරිවැයට හඳුනා ගනී. ඉඩම් එහි පිරිවැයට ගණනය කරනු ලැබේ.

- **ප්‍රත්‍යාගණන ආකෘතිය**

මූලික හඳුනා ගැනීමෙන් පසුව සාධාරණ වටිනාකම විශ්වාසදායක ලෙස මැනිය හැකි පහත දක්වා ඇති දේපළ, පිරියත සහ උපකරණ පන්ති ප්‍රත්‍යාගණන අගයන් සඳහා ඉදිරියට රැගෙන යා ඇති අතර ප්‍රත්‍යාගණන දිනයට ඇති සාධාරණ වටිනාකමින් කිසියම් පසු කාලීන සමුච්චිත ක්ෂයවීම් සහ පසු කාලීන සමුච්චිත අපචයවීම් අලාභ අඩු කර ගණනය කරනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘෂ්‍ය වත්කම්වල කිසියම් අපචයවීමක් පිළිබඳ පෙන්නුම් කිරීමක් තිබෙන්නේ දැයි තීරණය කිරීම පිණිස සෑම වාර්තා කරන දිනයකදීම එකී දේපළ, පිරියත සහ උපකරණයේ සහ අස්පෘෂ්‍ය වත්කමේ ධාරණ වටිනාකම සමාලෝචනය කරනු ලබන අතර එවැනි කිසියම් අපචයවීමක් පිළිබඳ පෙන්නුම් කිරීමක් තිබෙන්නේ නම් එවිට වත්කමේ ආපසු අය කර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමේ ධාරණ අගය එහි ආපසු අය කර ගත හැකි අගයට වඩා වැඩි වන්නේ නම්, අපචයවීම් අලාභය හඳුනා ගනී. අපචයවීම් අලාභ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගනී.

- **වත්කම් ප්‍රත්‍යාගණන විස්තර පහත දැක්වෙන පරිදි වේ.**

| වත්කම | ප්‍රත්‍යාගණන දිනය | ප්‍රත්‍යාගණනය සිදු කළආයතනය | වත්කමේ ශුද්ධ පොත් වටිනාකම | වත්කමේ ප්‍රත්‍යාගණන අගය | ප්‍රත්‍යාගණන අතිරික්තය |
|---|---|---|---|---|---|
| ඉඩම් | 31.12.2018 | තක්සේරු දෙපාර්තමේන්තුව | 1,054,294,812 | 4,204,580,000 | 3,150,285,188 |
| ඉඩම් | 01.01.2019 | -එම- | - | 700,210,000 | 700,210,000 |
| ගොඩනැගිලි | 31.12.2018 | -එම- | 2,888,476,733 | 5,375,839,000 | 2,487,362,267 |
| ගොඩනැගිලි | 01.01.2019 | -එම- | - | 118,599,000 | 118,599,000 |
| ලෝගු | 31.12.2018 | -එම- | 884,446 | 12,020,320 | 11,135,874 |
| මෝටර් රථ | 01.01.2018 | -එම- | 27,838,603 | 114,940,000 | 87,101,397 |
| **එකතුව** | | | | | **6,554,693,726.00** |
| **ක්‍රමක්ෂය 2019** | | | | | **(135,602,989.00)** |
| **ප්‍රත්‍යාගණන අගය 2019/2018** | | | | | **6,419,090,737.00** |
| **2018.01.01 දිනට ප්‍රත්‍යාගණන අතිරික්ත ශේෂය** | | | | | **1,121,260,134.26** |
| **2019.02.31 දිනට ප්‍රත්‍යාගණන අතිරික්ත ශේෂය** | | | | | **7,540,350,871.26** |

විශ්වවිද්‍යාලය මඟින් වත්කම් භාවිතා කරන බැවින් ප්‍රත්‍යාගණන අතිරික්තය සමානුපාතිකව පොදු සංචිතයට මාරු කළ හැකිය. එවැනි අවස්ථාවක දී, මාරු කළ අතිරික්තයේ අගය, වත්කම්වල ප්‍රත්‍යාගණනය කළ වටිනාකම පදනම් කර ගත් ක්ෂයවීම සහ වත්කම්වල මුල් පිරිවැය පදනම් කර ගත් ක්ෂයවීම අතර වෙනස වේ.

### 3.1.2 ආයෝජන

ආයෝජන යන්නෙන් ස්ථාවර තැන්පතුවල ආයෝජනය සහ ඉතුරුම් ගිණුම්වල ආයෝජනය නිරූපණය වේ. මෙම ආයෝජන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් 09ට අනුකූලව ගිණුම් කර ඇත. ස්ථාවර තැන්පතුවල සහ ඉතුරුම් ගිණුම්වල අයෝජනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් 09ට අනුකූලව ක්‍රමක්ෂ පිරිවැයට

වර්ගීකරණය කර ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් 09 හි නියම අනුව ඒවා මූලිකව සාධාරණ වටිනාකමට මනිනු ලබන අතර පසුව ඵලදායී අයෝජන අනුපාතය භාවිතා කරමින් සාධාරණ වටිනාකමින් ක්‍රමක්ෂ පිරිවැය අඩු කර මනිනු ලැබේ.

### 3.1.3 කාර්ය මණ්ඩල ණය

ආපදා ණය, පරිගණක ණය, ප්‍රකාශන ණය, වාහන ණය සහ වෙනත් කාර්ය මණ්ඩල ණය කාර්ය මණ්ඩල ණයට ඇතුළත් වේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් 09ට අනුව ක්‍රමක්ෂ පිරිවැයට ගණනය කළ මූල්‍ය වත්කම් ලෙස කාර්ය මණ්ඩල ණය වර්ගීකරණය කර ඇත. ඕනෑම කාර්ය මණ්ඩල ණයක ඇති අපවය අලාභය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් 09 හි දක්වා ඇති පරිදි අපේක්ෂිත අලාභ ක්‍රමය මත හඳුනා ගනී.

### 3.1.4 ප්‍රාග්ධන කෙරී ගෙන යන වැඩ

වාර්තා කරන දිනය වන විට නිමා නොකළ PPE මත සිදු කළ ප්‍රාග්ධන වියදම් ප්‍රාග්ධන කෙරී ගෙන යන වැඩවලට පෙන්නුම් කරන අතර ප්‍රාග්ධන කෙරී ගෙන යන වැඩ මත දැරූ පිරිවැය දේපළ, පිරියත හා උපකරණ භාවිතා කිරීමට ඇති අවස්ථාවල දී ඒවාට මාරු කරනු ලැබේ.

### 3.1.5 අස්පෘෂ්‍ය වත්කම්

පරිගණක මෘදුකාංග සහ මාර්ග ගත වාරසඟරා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරයට ගලා ඒම සහ වත්කමේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි විට අස්පෘෂ්‍ය වත්කමක් ලෙස හඳුනා ගෙන ඇත. අත්කර ගත් අස්පෘෂ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත අපවය අලාභ අඩු කිරීමෙන් පසුව පිරිවැයට ප්‍රකාශ කරනු ලැබේ. මෙම පිරිවැය ඒවායේ ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලයට ක්‍රමක්ෂය කරනු ලැබේ. මෙම පිරිවැය වසර 5ක කාලපරිච්ඡේදයක් තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

### 3.1.6 ජංගම වත්කම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වර්ගීකරණය කර ඇති ජංගම වත්කම් යනු විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ හඳුනා ගැනීමට හෝ පරිභෝජනය කිරීමට අපේක්ෂා කරන, වාර්තා කරන දිනයෙන් මාස දොළහකට පසුව හඳුනා ගැනීමට හෝ පරිභෝජනය කිරීමට අපේක්ෂා කරන මුදල් හෝ මුදල් සමාන ද වේ.

### 3.1.7 බඩු ලේඛන

බඩු ලේඛන පිරිවැයට දක්වනු ලබන අතර පළමුව එන පළමුව යන පදනමට තීරණය කරනු ලැබේ. බඩු ලේඛනවලට මූලිකවම ලිපි ද්‍රව්‍ය සහ අමතර කොටස් ඇතුළත් වේ. බඩු ලේඛන පරිභෝජනය සඳහා වන අතර ප්‍රතිඅලෙවිය සඳහා නොවේ.

### 3.1.7 මුදල් හා මුදල් සමාන දේ

මුදල් හා මුදල් සමාන දේ යනු අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි සහ වටිනාකම අතින් වෙනස්වීමේ වැදගත් වෙනසකට භාජනය නොවන කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවක් ඇති ආයෝජන ලෙස අර්ථ දක්වා ඇත. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ කාර්යය සඳහා මුදල් හා මුදල් සමාන දෑ යන්නට අතැති මුදල් සහ බැංකුවල ඇති තැන්පතු ඇතුළත් වේ. අත්කර ගැනීමේ දිනයේ සිට මාස හයක් හෝ ඊට අඩු කල්පිරීමේ කෙටි කාලයක ආයෝජන ද මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය මත සකස් කරනු ලැබේ.

## 3.2 ප්‍රාග්ධන වියදම් සඳහා රාජ්‍ය ප්‍රදාන වෙනුවෙන් ගිණුම්ගත කිරීම

### 3.2.1 පුනරාවර්තන ප්‍රදාන

පුනරාවර්තන ප්‍රදාන මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ මුදල් පදනම මත හඳුනා ගනී. පුනරුත්ථාපනය පිළිබඳ පිරිවැය සහ ඉදිකිරීම් සහ නව වැඩ සඳහා වූ ප්‍රාග්ධනය අවශ්‍ය අවස්ථාවල දී කෙරී ගෙන යන වැඩ හෝ ප්‍රාග්ධන වත්කම් ලෙස හඳුනා ගනී.

### 3.2.2 බාහිර ප්‍රදානවලින් ප්‍රාග්ධන වියදම සඳහා දායකවීම

උත්පාදිත අරමුදල් හෝ විවිධ ව්‍යාපෘති අරමුදල්වලින් මිල දී ගත් දේපළ, පිරියත හා උපකරණවල වටිනාකම " බාහිර ප්‍රදානවලින් ප්‍රාග්ධන වියදම සඳහා දායකවීම" ලෙස පෙන්වා ඇත.

### 3.2.3 ප්‍රාග්ධන ප්‍රදාන

### 3.2.4 අභ්‍යන්තරව සීමා කළ අරමුදල්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් නොමැතිවීම හේතුවෙන් ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 20 අනුව ප්‍රාග්ධන වියදම් සඳහා වූ රජයේ ප්‍රදාන මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත. ගිණුම්කරණ ප්‍රමිති අංක 20 අනුව ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ විලම්භිත ආදායම ලෙස හඳුනා ගෙන ඇති අතර වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

විශේෂිත කාර්යයන් සඳහා වෙන් කළ අරමුදල් අභ්‍යන්තරව සීමා කළ අරමුදල්වලට ඇතුළත් වේ. පීඨ සංවර්ධන අරමුදල්වලින් වසර අවසානයේ නොගෙවූ ශුද්ධ ශේෂය සමග පීඨ/ අධ්‍යයන අංශවල සමුච්චිත තත්ත්වය නිරූපණය වේ.

### 3.2.5 උපපාදන අරමුදල

විශ්වවිද්‍යාලයට ලැබුනු සීමා කළ ප්‍රදාන උපපාදන අරමුදලට ඇතුළත් වන අතර දානපතීන් පිහිටුවන ලද විවිධ කාර්යයන්ට අනුකූලව උපපාදන අරමුදල්වලින් උත්පාදිත ආයෝජන ආදායම භාවිතා කරනු ලැබේ.

### 3.3 සේවක ප්‍රතිලාභ

සේවකයින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් දායකත්වය (UPF), සේවක භාරකාර අරමුදල (ETF), විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සඳහා සුදුසුකම් ලබයි. දායකත්වය අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසි අනුව සිදු වේ. කැලණිය විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් දායකත්වය, සේවක භාරකාර අරමුදල, විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සඳහා මූලික වැටුප මත ස්ථාවර දායකත්ව සමග ජීවන වියදම් දීමනාව, අධ්‍යයන දීමනා, මාසික වන්දි දීමනා ගෙවනු ලබන අතර වැඩිදුර මුදල් ගෙවීම සඳහා කිසිදු නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීම් නොමැත. මෙම බැඳීම සේවක ප්‍රතිලාභ පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් 19 හි විස්තර කර ඇති නිශ්චිත දායකත්ව සැලැස්මට ඇතුළත් වේ. දායකත්ව සැලැස්ම අර්ථදක්වීම සඳහා වූ බැඳීම අදාළ සේවාව සපයනු ලබන විට ලාභ හෝ අලාභවල හඳුනා ගනී.

### නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු නිශ්චිත දායක මුදල් සැලසුම්වලට අමතරව ඇති පශ්චාත් සේවානියුක්ති සැලසුම් වේ. කැලණිය විශ්වවිද්‍යාලය 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂිත ගෙවීමට වගකීම දරයි.

### 3.4 බැරකම් හා ප්‍රතිපාදන

### ජංගම වගකීම්

ජංගම වගකීම් පොත් වටිනාකමට දක්වයි.

### ප්‍රතිපාදන

විශ්වවිද්‍යාලයට අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස බැඳීමක් නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය කරන (නෛතික සහ සම්ප්‍රයුක්ත) බැඳීම් ඇති විට සහ බැඳීමේ අගය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විට ප්‍රතිපාදන හඳුනා ගනී.

### 3.4.1 නිශ්චිත ප්‍රතිලාභ බැදීම්

1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත අනුව සේවකයින් සඳහා නිශ්චිත ප්‍රතිලාභ බැදීමක් සඳහා වගකීමක් ඇති වේ. එවැනි නිශ්චිත ප්‍රතිලාභ බැදීමක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් 19හි විෂය පථයට ඇතුල් වන පශ්චාත්-සේවානියුක්ති ප්‍රතිලාභ බැදීමක් වේ. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇති වගකීම වාර්තා කරන දිනය වන විට නිශ්චිත ප්‍රතිලාභ බැදීමේ වර්තමාන වටිනාකම වේ. සුදුසුකම් ඇති ජීවගණකයෙක් විසින් ප්‍රක්ෂිප්ත ඒකක ක්‍රමය (PUC) භාවිතා කරමින් වාර්ෂිකව ගණනය කිරීම සිදු කරයි. ආයුගණක ආදායම සහ අලාභ ඇතුළත් වන නිශ්චිත ප්‍රතිලාභ බැදීමේ ප්‍රති-මිනුම මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ වහාම හඳුනා ගනී. විශ්වවිද්‍යාලය වසර ඇතුළත සේවකයින් ලබා දෙන සේවාවට අදාළ නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ ඉහළ යාම (ප්‍රවර්තන සේවා පිරිවැය) පොළී වියදම් ඇතුළුව ලාභ හෝ අලාභ සමඟ හඳුනා ගනී. රජයේ බැඳුම්කරවල ආදායම සලකා බලමින් වට්ටම් අනුපාතිකය සකස් කර ඇත.

### ගිණුම්කරන ඇස්තමේන්තුව

වට්ටම් අනුපාත, වත්කම් පිළිබඳ ආදායමේ අපේක්ෂිත අනුපාත, අනාගත වැටුප් වැඩිවීම සහ මරණ අනුපාතය පිළිබඳව උපකල්පන සිදු කිරීම ජීවගණක තක්සේරු කිරීමට ඇතුළත් වන අතර බැදීමක දිගු කාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවට භාජනය වේ.

### 3.4.2 අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම්

අසම්භාව්‍ය බැරකම් අතීත සිදුවීමක් වැඩසටහනේ පාලනයෙන් බැහැර අනපේක්ෂිත අනාගත අවස්ථා එකක් හෝ වැඩි සංඛ්‍යාවක් සිදුවීමෙන් හෝ සිදු නොවීමෙන් මතුවන බැදීමක් හෝ බැදීම නිරවුල් කිරීම සඳහා සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි බවට නිශ්චිත නොවීම හේතුවෙන් හඳුනා නොගන්නා වර්තමාන බැදීමක් වේ.

එමෙන්ම විශ්වාසදායක ලෙස මැනිය නොහැකි වගකීමක් ඇති අතිශය දුලභ අවස්ථාවලදී ද අසම්භාව්‍ය බැරකමක් පැන නැගිය හැකිය. අනපේක්ෂිත තත්ත්වය අසම්භාව්‍ය බැරකමක් හඳුනා නොගන්නා නමුත් මූල්‍ය ප්‍රකාශනවල එහි පැවැත්ම හෙළිදරව් කරයි.

අසම්භාව්‍ය වත්කමක් යනු විශ්වවිද්‍යාලයේ පාලනයෙන් බැහැර අවිනිශ්චිත අවස්ථා එකක් හෝ වැඩි සංඛ්‍යාවක් සිදුවීම හෝ සිදු නොවීම මගින් පැවැත්ම සහතික වන අතීත සිදුවීමකින් මතුවිය හැකි වත්කමකි. විශ්වවිද්‍යාලය අසම්භාව්‍ය වත්කමක් හඳුනා නොගන්නා නමුත් ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම සිදු විය හැකි නමුත් සැබවින්ම අවිනිශ්චිත අවස්ථාවල දී එහි පැවැත්ම හෙළිදරව් කරයි.

### 3.4.3 ආදායම හඳුනා ගැනීම

#### 3.4.3.1 ගාස්තු අය කරන පාඨමාලා ආදායම

ගාස්තු අය කරන පාඨමාලා සහ වෙනත් කටයුතුවලින් ලැබෙන ආදායම පාඨමාලාවේ සහ උපාධියේ කාලපරිච්ඡේදය පුරාවට උපචිත පදනම මත හඳුනා ගනී.

#### 3.4.3.2 මූල්‍ය ආදායම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් නොමැතිවීම හේතුවෙන් ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි ප්‍රමිති අංක 09 අනුව එලදායී පොළී අනුපාත ක්‍රමය භාවිතා කරමින් උපචිත පදනම මත පොළි ආදායම හඳුනා ගනී.

### 3.4.4 වියදම හඳුනා ගැනීම

විශ්වවිද්‍යාලයේ සියලුම කටයුතු සිදු කිරීමේ දී දරන ලද වියදම් උපචිත පදනම මත හඳුනා ගන්නා අතර මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කරයි.

### 3.4.5 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් අංක 02 අනුව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් සකස් කර ඇති අතර ඒ අනුව මෙහෙයුම් කටයුතුවල, මූල්‍ය කටයුතුවල සහ ආයෝජන කටයුතුවල දළ මූල්‍ය ලැබීම් සහ දළ මූල්‍ය ගෙවීම් හඳුනා ගෙන ඇත. මුදල් හා මුදල් සමාන දෑ යන්නට කෙටි කාලීන, දන්නා පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි සහ වටිනාකම අතින් වෙනස්වීමේ වැදගත් වෙනසකට භාජනය නොවන කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවක් ඇති ආයෝජන ඇතුළත් වේ.

## 2019 දෙසැම්බර් මස 31වැනි දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| **පුනරාවර්තන වියදම් සඳහා ආණ්ඩුවේ ප්‍රදාන** | | | **සටහන 2** |
|---|---|---|---|
| **විස්තරය** | | **2019.12.31 වැනි දිනට (රු.)** | **2018.12.31 වැනි දිනට (රු.)** |
| පෞද්ගලික වැටුප් | | 3,377,000,000 | 2,694,000,000 |
| වෙනත් පුනරාවර්තන | | 398,000,000 | 336,000,000 |
| **එකතුව** | | **3,775,000,000** | **3,030,000,000** |
| | | | |

| **අභ්‍යන්තර ආදායම** | | | **සටහන 3** |
|---|---|---|---|
| **විස්තරය** | **උප-ලේඛන අංකය** | **2019.12.31 වැනි දිනට (රු.)** | **2018.12.31 වැනි දිනට (රු.)** |
| | | | |
| පන්ති හා වෙනත් ගාස්තු | 3-1 | 80,383,048 | 54,562,140 |
| ආයෝජනවලින් පොළිය | 3-2 | 436,762,392 | 328,670,791 |
| වෙනත් අභ්‍යන්තර ආදායම | 3-3 | 98,862,406 | 100,260,813 |
| බාහිර විභාගවලින් ආදායම | 3-4 | 400,431,610 | 489,616,601 |
| ගාස්තු අය කරන පාඨමාලාවලින්/ විශේෂ සේවාවලින් ආදායම | | 346,280,720 | 350,736,225 |
| සංවර්ධන අරමුදලෙන් මාරු කිරීම් | | 302,532,626 | 173,875,114 |
| විශ්වවිද්‍යාල දායකත්ව සම්මන්ත්‍රණ ගාස්තු | | 20,603 | 6,323 |
| **එකතුව** | | **1,665,273,405** | **1,497,728,006** |
| | | | |
| **පන්ති හා වෙනත් ගාස්තු** | | | **සටහන 3-1** |
| **විස්තරය** | | **2019.12.31 වැනි දිනට (රු.)** | **2018.12.31 වැනි දිනට (රු.)** |
| ලියාපදිංචි ගාස්තු (ප්‍රථම උපාධි - දේශීය) | | 10,141,491 | 7,418,750 |
| ලියාපදිංචි ගාස්තු (පශ්චාත්-උපාධි) | | 2,545,000 | 2,325,750 |
| පන්ති ගාස්තු (ප්‍රථම උපාධි) | | 546,517 | 2,295,538 |
| පන්ති ගාස්තු (ප්‍රථම උපාධි - විදේශ) | | 44,383,403 | 24,923,025 |
| පන්ති ගාස්තු (පශ්චාත්-උපාධි) | | 17,192,974 | 12,999,904 |
| විභාග ගාස්තු (ප්‍රථම උපාධි) | | 5,460,894 | 4,569,252 |
| විභාග ගාස්තු (පශ්චාත්-උපාධි) | | 112,770 | 29,920 |
| **එකතුව** | | **80,383,048** | **54,562,139** |
| | | | |
| **පොළී ආදායම** | | | **සටහන 3-2** |
| **විස්තරය** | | **2019.12.31 වැනි දිනට (රු.)** | **2018.12.31 වැනි දිනට (රු.)** |
| ආයෝජනවලින් පොළිය | | | |
| දළ පොළිය | | 430,928,787 | 327,303,727 |
| රඳවා ගැනීමේ බදු | | - | (4,247,483) |
| **ශුද්ධ පොළිය** | | 430,928,787 | 323,056,243 |
| ණය පොළිය | | 5,833,606 | 5,614,547 |
| | | 5,833,606 | 5,614,547 |
| **මුළු පොළී ආදායම** | | **436,762,392** | **328,670,791** |

| වෙනත් අභ්‍යන්තර ආදායම | | | සටහන 3-3 |
|---|---|---|---|
| විස්තරය | උප-ලේඛන අංකය | 2019.12.31 වැනි දිනට (රු.) | 2018.12.31 වැනි දිනට (රු.) |
| දේපළවලින් ලැබෙන කුලිය | | 3,161,313 | 36,277,929 |
| පැරණි ගබඩා අලෙවිය | | 332,405 | 427,880 |
| නිෂ්පාදන අලෙවිය | | 174,079 | 52,365 |
| ප්‍රකාශන අලෙවිය | | 301,690 | 106,200 |
| පුස්තකාල දඩ | | 936,507 | 386,115 |
| වෛද්‍ය ගාස්තු | | 14,750 | 7,900 |
| අනුබද්ධ කටයුතු - නේවාසිකාගාර | | 2,775,053 | 6,654,431 |
| විවිධ ආදායම | (3-3)-1 | 91,166,609 | 56,347,994 |
| **එකතුව** | | **98,862,406** | **100,260,813** |

| විවිධ ආදායම | | | සටහන 3-3-1 |
|---|---|---|---|
| විස්තරය | | 2019.12.31 වැනි දිනට (රු.) | 2018.12.31 වැනි දිනට (රු.) |
| සහතිකපත්‍ර ගාස්තුව | | 1,976,820 | 1,926,880 |
| ලෝගු සඳහා දඩ | | 53,350 | 49,675 |
| ඡායාපිටපත් ගැනීමේ ගාස්තු | | 368 | - |
| ලෝගු කුලියට දීම | | 401,500 | 409,150 |
| වාහන කුළිය | | 16,720 | 47,580 |
| සැපයුම්කරුවන්ගෙන් ලියාපදිංචි ගාස්තු | | 355,700 | 314,400 |
| උපාධි ප්‍රදානෝත්සව ගාස්තු | | 18,896,000 | 19,629,000 |
| පශ්චාත් උපාධි පුස්තකාල ආදායම | | 120,000 | 115,000 |
| ඉල්ලුම්පත් සහ වෙනත් ගාස්තු | | 8,411,166 | 7,008,377 |
| අර්ථසාධක අරමුදල් ගාස්තු | | 2,589,539 | 3,867,235 |
| පුස්තකාල කාඩ්පත් හා හැඳුනුම්පත් | | 90,550 | 110,275 |
| දන්ත සායන ගාස්තු | | 34,800 | 15,700 |
| වෙනත් විවිධ ආදායම් | | 58,220,096 | 22,854,723 |
| **එකතුව** | | **91,166,609** | **56,347,995** |

| බාහිර විභාගවලින් ආදායම | | | සටහන 3-4 |
|---|---|---|---|
| විස්තරය | | 2019.12.31 වැනි දිනට (රු.) | 2018.12.31 වැනි දිනට (රු.) |
| ලියාපදිංචි ගාස්තු | | 40,521,500 | 83,152,600 |
| විභාග ගාස්තු | | 20,514,100 | 143,965,200 |
| විෂයමාලා ගාස්තු | | 2,250 | 3,000 |
| පසුගිය ප්‍රශ්නපත්‍ර ගාස්තු | | - | 320 |
| සහතිකපත්‍ර ගාස්තු | | 508,160 | 1,741,790 |
| තැපැල් ගාස්තු | | 87,200 | 197,140 |
| උපාධි ප්‍රදානෝත්සව ආදායම | | 14,902,000 | 10,933,890 |
| සම්මන්ත්‍රණ ආදායම | | 22,390,000 | 80,595,200 |
| වෙනත් පාඨමාලා ආදායම | | 300,804,120 | 168,902,211 |
| සහතික තහවුරුකිරීමේ ගාස්තු | | 78,380 | 44,000 |
| හැඳුනුම්පත් ගාස්තු | | 84,700 | 61,100 |
| විවිධ ආදායම් | | 12,000 | 20,150 |
| අධ්‍යයන මාර්ගෝපදේශ ගාස්තු | | 527,200 | - |
| **එකතුව** | | **400,431,610** | **489,616,601** |

| **පෞද්ගලික වැටුප්** | | | **සටහන 4** |
|---|---|---|---|
| (අ) අධ්‍යයන | | | |
| විස්තරය | | 2019.12.31 වැනි දිනට (රු.) | 2018.12.31 වැනි දිනට (රු.) |
| වැටුප් හා වේතන | | 782,602,451 | 639,723,352 |
| අර්ථසාධක අරමුදල | | 182,801,402 | 140,831,911 |
| විශ්‍රාම වැටුප් | | 88,401,878 | 64,645,606 |
| සේවක භාරකාර අරමුදල | | 54,241,290 | 41,086,771 |
| වැඩ බැලීම සඳහා ගෙවීම් | | 129,593 | - |
| ජීවන වියදම් දීමනාව | | 86,450,535 | 78,911,842 |
| අධ්‍යයන දීමනා | | 957,254,784 | 654,869,181 |
| විශේෂ දීමනාව 20% | | 125,340,181 | 3,012,271 |
| පර්යේෂණ දීමනාව | | 213,579,644 | 145,684,969 |
| අන්තර්කාල දීමනාව | | - | 1,354,767 |
| බාහිර කථිකාචාර්යවරුන්ගේ ගාස්තු | | 24,849,209 | 47,143,233 |
| වෙනත් දීමනා | | 23,643,915 | 110,205,398 |
| **එකතුව** | | **2,539,294,882** | **1,927,469,302** |
| | | | |
| (ආ) අනධ්‍යයන | | | |
| විස්තරය | | 2019.12.31 වැනි දිනට (රු.) | 2018.12.31 වැනි දිනට (රු.) |
| වැටුප් හා වේතන | | 418,434,987 | 337,168,601 |
| අර්ථසාධක අරමුදල | | 62,236,670 | 49,268,540 |
| විශ්‍රාම වැටුප් | | 37,868,661 | 27,806,711 |
| සේවක භාරකාර අරමුදල | | 20,030,173 | 15,430,489 |
| වැඩ බැලීම සඳහා ගෙවීම් | | 605,795 | 930,906 |
| අතිකාල දීමනා | | 46,832,805 | 45,658,104 |
| නිවාඩු ගෙවීම් | | 1,642,509 | 1,396,838 |
| ජීවන වියදම් දීමනාව | | 84,191,317 | 75,746,669 |
| 20%ක විශේෂ දීමනාව | | 78,902,340 | 53,489,095 |
| පර්යේෂණ දීමනාව | | 10,610,914 | 5,690,015 |
| 20%ක අතිරේක මාසික දීමනාව | | 171,452,212 | 114,033,491 |
| අන්තර්කාල දීමනාව | | - | 1,100 |
| වෙනත් දීමනා | | 17,394,112 | 38,019,876 |
| | | 950,202,497 | 764,640,435 |
| | | | |
| **(අ) සහ (ආ) එකතුව** | | **3,489,497,380** | **2,692,109,737** |
| | | | |
| **ගමන් වියදම්** | | | **සටහන 5** |
| විස්තරය | | 2019.12.31 වැනි දිනට (රු.) | 2018.12.31 වැනි දිනට (රු.) |
| දේශීය | | 948,466 | 802,179 |
| විදේශීය | | 7,057,541 | 4,586,529 |
| **එකතුව** | | **8,006,006** | **5,388,708** |
| | | | |
| **සැපයුම්** | | | **සටහන 6** |
| විස්තරය | | 2019.12.31 වැනි දිනට (රු.) | 2018.12.31 වැනි දිනට (රු.) |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතාවන් | | 49,267,016 | 37,634,962 |
| ඉන්ධන හා ලිහිස්සි ද්‍රව්‍ය | | 11,296,772 | 9,819,583 |
| නිල ඇඳුම් හා මැහුම් ගාස්තු | | 3,364,199 | 3,488,145 |
| කාර්මික හා විද්‍යුත් භාණ්ඩ | | 588,495 | 3,205,649 |
| රසායනික හා වීදුරු භාණ්ඩ | | 8,027,111 | 14,583,496 |
| වෛද්‍ය සැපයීම් | | 887,669 | 1,697,427 |
| වෙනත් සැපයීම් | | 34,205,493 | 23,561,316 |
| **එකතුව** | | **107,636,756** | **93,990,579** |

| | | | |
|---|---|---|---|
| | | | **සටහන 7** |
| **නඩත්තු වියදම්** | 10 | | |
| **විස්තරය** | | 2019.12.31 වැනි දිනට (රු.) | 2018.12.31 වැනි දිනට (රු.) |
| වාහන | | 10,411,100 | 6,124,729 |
| පිරියත, යන්ත හා කාර්යාල උපකරණ | | 13,891,083 | 31,307,793 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | | 180,727 | 133,288 |
| ගෘහභාණ්ඩ | | 109,200 | 326,225 |
| වෙනත් | | - | 27,445 |
| **එකතුව** | | **24,592,110** | **37,919,479** |
| | | | |
| **කොන්ත්‍රාත් සේවා** | **11** | | **සටහන 8** |
| **විස්තරය** | | 2019.12.31 වැනි දිනට (රු.) | 2018.12.31 වැනි දිනට (රු.) |
| ප්‍රවාහනය | | 53,230 | 23,168 |
| විදුලි සන්දේශ | | 70,037,714 | 67,250,851 |
| තැපැල් ගාස්තු | | 5,758,910 | 4,181,976 |
| විදුලිය | | 107,073,232 | 101,716,776 |
| ආරක්ෂක සේවා | | 55,916,340 | 49,256,592 |
| ජලය | | 33,233,360 | 33,590,707 |
| පිරිසිදු කිරීමේ සේවා | | 73,978,934 | 74,970,538 |
| නිවාස කුළී ගෙවීම් හා කුළී ගාස්තු | | 41,310,806 | 11,765,026 |
| පළාත් පාලන ආයතනවලට වරිපණම් හා බදු | | 15,877,433 | 23,304,226 |
| මුද්‍රණ දැන්වීම්/ප්‍රචාර ආදී | | 37,331,003 | 42,423,443 |
| ක්‍රීඩා කටයුතු | | - | 3,125 |
| වෙනත් | | 13,515,568 | 9,362,966 |
| **එකතුව** | | **454,086,529** | **417,849,395** |
| | | | **සටහන 9** |
| **වෙනත් පුනරාවර්තන** | | | |
| **විස්තරය** | | 2019.12.31 වැනි දිනට (රු.) | 2018.12.31 වැනි දිනට (රු.) |
| විශ්වවිද්‍යාල ගුරුවරුන් සඳහා ගමන් ප්‍රදාන | | - | 5,000 |
| විශේෂ සේවාවන්- සභා හා කමිටු | | 6,377,632 | 3,956,080 |
| විශේෂ සේවාවන්-වෘත්තීය හා වෙනත් ගාස්තු | | 95,380 | 154,650 |
| වැඩමුළු, සම්මන්ත්‍රණ | | 7,665,498 | 6,731,432 |
| අධ්‍යයන පර්යේෂණ | | 2,059,216 | 4,073,330 |
| කාර්යමණ්ඩල සංවර්ධනය | | 1,548,941 | 2,760,287 |
| වෙනත් සංවිධානවලට ප්‍රදාන | | 1,447,261 | 64,951,940 |
| නිවාඩු අවසරපත් වාර ප්‍රවේශපත්‍ර | | 2,244,115 | 1,269,215 |
| සංග්‍රහ වියදම් | | 3,242,697 | 3,320,083 |
| බැංකු ගාස්තු | | 257 | 1,868 |
| සම්මාන හා වන්දි මුදල් | | 250,092 | 177,500 |
| දායකමුදල් හා සාමාජික ගාස්තු | | 3,597,472 | 1,888,797 |
| උපාධි ප්‍රදානෝත්සවය | | 22,973,834 | 22,346,988 |
| විභාගය | | 91,924,602 | 88,477,446 |
| වෙනත්- පුවත්පත්, වාර සඟරා ආදී | | 2,347,771 | 2,446,890 |
| ක්ෂේත්‍ර චාරිකා | | 6,693,439 | 7,068,073 |
| ශිෂ්‍ය සංවර්ධන මූලාරම්භය | | 147,147 | 137,860 |
| **එකතුව** | | **152,615,353** | **209,762,459** |

| | | | |
|---|---|---|---|
| | | | **සටහන 10** |
| **සංවර්ධන අරමුදල මත වියදම** | | | |
| **විස්තරය** | | 2019.12.31 වැනි දිනට (රු.) | 2018.12.31 වැනි දිනට (රු.) |
| පුද්ගලික පඩිනඩි | | 49,355,292 | 56,585,088 |
| ගමන් වියදම් | | 37,386,279 | 44,950,831 |
| සැපයුම් | | 20,085,157 | 13,772,503 |
| නඩත්තු වියදම් | | 31,492,590 | 7,558,336 |
| කොන්ත්‍රාත් සේවා | | 4,157,963 | 7,356,175 |
| වෙනත් පුනරාවර්තන | | 160,055,344 | 43,652,183 |
| **එකතුව** | | **302,532,626** | **173,875,114** |
| | | | |

# කැලණිය විශ්වවිද්‍යාලය

## දේපළ-පිරියත හා උපකරණ

**සටහන 11**

| විස්තරය | ඉඩම් රු. | ගොඩනැගිලි හා වැඩිදියුණු කිරීම් රු. | ගෘහභාණ්ඩ හා උපකරණ රු. | විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ රු. | මෝටර් රථ රු. | ජලය හා විදුලිය සැපයුම් යෝජනාක්‍රමය රු. | යන්ත්‍රසූත්‍ර රු. | වෙනත් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2019 ජනවාරි මාසයට පිරිවැය/ ප්‍රත්‍යාගණන ශේෂය | 4,204,580,000 | 5,375,839,000 | 1,847,722,350 | 431,406,210 | 114,940,000 | 61,235,634 | 43,537,929 | 327,173,252 | 12,406,434,375 |
| එකතුකිරීම් - අත්කර ගැනීම් | | 83,705,950 | 143,722,571 | 9,670,351 | | 9,696,430 | 928,137 | 21,636,792 | 269,360,231 |
| ප්‍රත්‍යාගණනය | 700,210,000 | 118,599,000 | | | | | | | 818,809,000 |
| වර්ෂය තුළ දී ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ | | 356,940,710 | | | | | | | 356,940,710 |
| ඉවත හෙළීම | | | | | (1,650,000) | | | | (1,650,000) |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **4,904,790,000** | **5,935,084,660** | **1,991,444,921** | **441,076,561** | **113,290,000** | **70,932,064** | **44,466,066** | **348,810,043** | **12,674,144,606** |
| **2019 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂය ශේෂය** | | | 1,221,686,062 | 347,569,029 | 22,988,000 | 47,690,433 | 41,722,120 | 220,524,435 | 1,902,180,079 |
| වර්ෂය සඳහා ක්ෂයවීම් | | 276,814,074 | 199,545,501 | 36,672,851 | 22,658,000 | 2,418,857 | 2,141,007 | 47,242,992 | 587,493,282 |
| වත්කම් ඉවතහෙළීම සඳහා ක්ෂයවීම් | | | | | (330,000) | | | | (330,000) |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **276,814,074** | **1,421,231,563** | **384,241,880** | **45,316,000** | **50,109,290** | **43,863,127** | **267,767,427** | **2,489,343,362** |
| **2018 දෙසැම්බර් 31 දිනට ශුද්ධ කාරක අගය** | **4,204,580,000** | **5,375,839,000** | **626,036,288** | **83,837,181** | **91,952,000** | **13,545,201** | **1,815,809** | **106,648,817** | **10,504,254,299** |
| **2019 දෙසැම්බර් 31 දිනට ශුද්ධ කාරක අගය** | **4,904,790,000** | **5,658,270,586** | **570,213,358** | **56,834,681** | **(67,974,000)** | **20,822,774** | **602,939** | **81,042,616** | **11,360,550,957** |

| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 57,704,850 |
| මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල | 60,111,600 |
| ශිෂ්‍යාධාර ප්‍රදාන | 61,371,100 |
| ***ප්‍රාග්ධන ප්‍රදාන*** | |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම | 74,943,147 |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | 123,890,842 |
| ඉදිකිරීම් ව්‍යාපෘති | 229,411,177 |
| මානව ප්‍රාග්ධනය සංවර්ධන ව්‍යාපෘතිය | 12,659,828 |
| පර්යේෂණය හා සංවර්ධනය | 2,595,006 |
| **උත්පාදිත ආදායම** | |
| ස්වයං-මූල්‍යකරණ කටයුතු | 215,461,852 |
| **එකතුව** | **4,613,149,402** |

## 10.3 ප්‍රාග්ධන වියදම - 2019

*10-3 වගුව: ප්‍රාග්ධන වියදම - 2019*

| ප්‍රාග්ධන වියදම | | රජයේ ප්‍රදානය (රු:) | උත්පාදිත ආදායම (රු:) | වෙනත් ප්‍රදාන (රු:) | මුළු විදයම (රු:) |
|---|---|---|---|---|---|
| ඉදිකිරීම් ව්‍යාපෘති | | 286,804,122 | 47,633,508.40 | 25,016,185 | 359,453,816 |
| දේපළ අත්පත් කර ගැනීම | | 123,890,842 | 140,495,101.71 | 9,812,689 | 274,198,633 |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම | | 17,550,202 | - | - | 17,550,202 |
| මානව ප්‍රාග්ධනය සංවර්ධන ව්‍යාපෘතිය | ICT සංවර්ධනය | 2,550,000 | - | - | 2,550,000 |
| | අනෙක් සියලුම ව්‍යාපෘති | 10,109,828 | - | - | 10,109,828 |
| පර්යේෂණ ශක්තිමත් කිරීම | | 2,595,006 | - | - | 2,595,006 |
| **එකතුව** | | **443,500,000** | **188,128,610** | **34,828,874** | **666,457,485** |

## 10.4 පුනරාවර්තන වියදම - 2019

*10-4 වගුව: පුනරාවර්තන වියදම - 2019*

| වැය විෂය / වැඩසටහන | පුද්ගලික පාරිතෝෂික – අධ්‍යයන (රු.) | පුද්ගලික පාරිතෝෂික - අනධ්‍යයන (රු.) | ගමන් වියදම් (රු.) | සැපයුම් (රු.) | සැපයුම් නඩත්තු වියදම් (රු.) | ගිවිසුම්ගත සේවා (රු.) | මහපොළ සහ ශිෂ්‍යාධාර (රු.) | වෙනත් පුනරාවර්තන වියදම් (රු.) | මුළු එකතුව (Rs.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන 01- සාමාන්‍ය පරිපාලනය | 19,212,625 | 266,758,117 | 1,229,518 | 20,878,071 | 10,435,805 | 100,428,404 | - | 6,971,892 | 425,914,432 |
| වැඩසටහන 02- අධ්‍යයන | | | | | | | | | |
| වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය | 509,887,589 | 48,818,870 | 1,006,966 | 6,205,865 | 252,760 | 14,372,408 | 40,047,150 | 12,345,748 | 632,431,837 |
| මානව ශාස්ත්‍ර පීඨය | 596,546,341 | 54,334,845 | 1,122,680 | 4,687,006 | 1,513,854 | 1,844,396 | 96,303,700 | 7,853,776 | 764,206,597 |
| සමාජ විද්‍යා පීඨය | 590,596,287 | 59,624,071 | 980,591 | 6,642,015 | 1,284,213 | 1,413,075 | | 17,468,135 | 678,008,389 |
| වෛද්‍ය පීඨය | 683,411,283 | 223,036,386 | 1,970,494 | 12,931,658 | 2,195,536 | 70,627,597 | 7,384,600 | 9,346,848 | 1,010,904,400 |
| පරිගණක හා තාක්ෂණ පීඨය | 85,607,196 | 12,273,333 | 49,876 | 1,226,185 | 64,533 | 39,024,528 | 6,579,050 | 2,645,466 | 147,470,167 |
| විද්‍යා පීඨය | 700,500,243 | 132,197,638 | 1,375,592 | 12,061,438 | 3,250,671 | 1,647,889 | 28,864,050 | 13,362,110 | 893,259,631 |
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | 571,006 | 13,573,155 | 7,550 | 1,597,852 | 136,516 | 6,186,310 | - | 11,398,801 | 33,471,190 |
| පරීක්ෂණ | - | 15,703,549 | 17,075 | 1,602,336 | 182,013 | 21,977,047 | - | 4,274,224 | 43,756,245 |
| වැඩසටහන 03- ශික්ෂණ සම්පත් | | | | | | | | | |
| පුස්තකාල සේවා | 38,536,785 | 69,843,555 | 46,179 | 2,068,769 | 245,648 | 2,464,404 | - | 245,921 | 113,451,262 |
| වැඩසටහන 04- සුභසාධන සේවා | 2,669,938 | 65,910,763 | 168,210 | 2,995,076 | 210,072 | 46,174,468 | - | 4,441,651 | 122,150,033 |
| වැඩසටහන 05 – නඩත්තුව | - | 75,749,822 | 6,200 | 21,333,964 | 268,364 | 51,724,873 | - | 156,090 | 149,239,313 |
| වැඩසටහන 07 - දීර්ඝ කිරීමේ සේවා | | | | | | | | | |
| බාහිර පරීක්ෂණ | - | 33,408,181 | 25,075 | 5,812,273 | 2,035,382 | 23,452,443 | - | 118,047,021 | 182,780,375 |
| වැඩසටහන 08 – අනුබද්ධ කටයුතු | | | | | | | | | |
| නේවාසිකාගාර | - | 10,068,406 | - | 1,576,276 | 3,442,408 | 72,748,688 | - | 696,980 | 88,532,757 |
| උත්පාදිත ආදායමෙන් වියදම | 115,518,357 | 16,380,147 | 18,755,500 | 2,981,885 | - | 14,829,133 | - | 46,996,831 | 215,461,853 |
| **මුළු එකතුව** | **3,343,057,649** | **1,097,680,839** | **26,761,507** | **104,600,670** | **24,592,110** | **468,915,661** | **179,178,550** | **256,251,495** | **5,501,038,481** |

# 11 විගණකාධිපතිගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } HED/E/UOK/1/2019/10    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2020 අගෝස්තු 13 දින

17 AUG 2020

261
19 AUG 2020

උපකුලපති
කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

SAIA
FWA  Pl.

Actg. V.C
18.08.2020

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් :- 01. ලේකම්- අධ්‍යාපන අමාත්‍යාංශය
02. සභාපති- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
03. ලේකම්- මුදල් අමාත්‍යාංශය

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/E/UOK/1/2019/10   ඔබේ අංකය / உமது இல. / Your No.   දිනය / திகதி / Date 2020 අගෝස්තු 13 දින

උපකුලපති
කැලණිය විශ්වවිද්‍යාලය

**කැලණිය විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

කැලණිය විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි ඡේද 49 අනුව දේපල පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත් වන දේපල පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, අගය රු.127,033,367 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. එසේම මෙම ප්‍රත්‍යාගණනය නොකළ ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ද ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ දී ඉඩම් හා ගොඩනැගිලි ඉවත් කිරීමක් සිදු කර නොතිබිය දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 55 ඡේදය අනුව ප්‍රත්‍යාගණන අතිරික්ත ගිණුමෙන් රු.135,602,989 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට නිවැරදි නොවන ආකාරයට ගලපා තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා ප්‍රත්‍යාගණන සංචිතය පිළිවෙලින් එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා අඩුවෙන් දැක්වුණි.

(ඇ) බාහිර ආයතනයකට ලබා දී තිබුණ තක්සේරු කළ ඉඩම්වල වටිනාකම රු.159,970,745 ක් වූ අගය ගිණුම්වලින් ඉවත් නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු සමස්ත ඉඩම්වල වටිනාකම ඉහත අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2018 වර්ෂයේ දී වාහන වලට අදාල රු. 22,988,000 ක ක්‍රමක්ෂය ප්‍රත්‍යාගණන ගිණුමෙන් දෝෂ සහගත ලෙස අඩු කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රත්‍යාගණන ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) කැලණිය විශ්වවිද්‍යාල භූමියේ පිහිටා ඇති මහජන බැංකු ගොඩනැගිල්ල වෙනුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2018 වර්ෂයේදී ලැබී තිබූ රු.2,900,000 ක බදු ආදායම ඉකුත් වර්ෂයේ ආදායමක් ලෙස ගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 අනුව අස්ථිත්වයක ස්ථාවර වත්කම් එම වත්කම් වල ස්වභාවය හා මෙහෙයුම් කටයුතු සඳහා යොදාගනු ලබන ආකාරය අනුව වර්ගීකරණය කර එක් එක් වත්කම් පන්තියේ ඵලදායී ජීවිත කාලය අනුව ක්ෂය කිරීමට කටයුතු කළ යුතුය. එසේ වුවත් විශ්වවිද්‍යාලයේ ලී බඩු හා උපකරණ හා විද්‍යුත් උපාංග ඒවායේ ස්වභාවය හා ඵලදායී ජීවිත කාලය පිළිබඳ නොසලකා ලී බඩු හා උපකරණ ලෙස එකම වත්කම් පන්තිය යටතේ වර්ගීකරණය කර තිබුණි. එසේම විද්‍යුත් උපාංග ක්ෂය කිරීමේ ප්‍රතිශතය වර්ෂයකට සියයට 20 බැගින් සිදු කරනු ලබන බව මූල්‍ය ප්‍රකාශන වල

2

අනාවරණය නොකර පිරිවැය රු. මිලියන 1,477 ක් වූ එම වත්කම් සියයට 20 බැගින් ක්ෂය කර තිබුණි.

(උ) රජයේ ප්‍රදාන වලට අදාළ හා උපයන ලද ආදායම් ගිණුම්වල සිදු කර තිබුණු රු. මිලියන 5,642 ක ජ'නල් වවුචර් 419 ක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඌ) බැංකු ජංගම ගිණුමක 2016 හා 2017 වර්ෂවල සිට පැවත එන හඳුනා නොගත් සෘජු බැර කිරීම් වටිනාකම රු.525,000 ක් හඳුනාගෙන ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. එසේම ජංගම ගිණුම් දෙකකට අදාලව 2019 වර්ෂය තුළ හඳුනා නොගත් රු.4,356,795 ක්වූ සෘජු බැරකිරීම් 60 ක් හඳුනා ගැනීමකින් තොරව විවිධ ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලයඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා හට ලබා ගැනීමට නොහැකි වූ අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් ඇති බව නිශ්චය කිරීමට මා හට නොහැකි විය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

NATIONAL AUDIT OFFICE

5

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති/ විධානවලට යොමුව | විස්තරය |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 371 | අත්තිකාරම් එය දෙන ලද කාර්යය නිමකළ විගස පියවීමට කටයුතු කළ යුතු වුවත් අවස්ථා 14 කදී ලබා දී තිබුණු රු.1,238,950 ක අත්තිකාරම් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පියවා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 | 2016 නොවැම්බර් 03 දින සිට 2019 ජූනි 28 දින දක්වා කාලපරිච්ඡේදය තුළ අවලංගු කරන ලද රු.1,636,179 ක් වටිනා චෙක්පත් 287 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 571 | විවිධ කාර්යයන් සඳහා විශ්වවිද්‍යාලයේ තැන්පත්කළ වර්ෂ 2 ක් ඉක්මවා තිබූ රු.64,179,618 ක්වූ විවිධ තැන්පතු හා වසර පහකට වඩා වැඩි කාලයක් ගතවූ රු.11,312,500 ක්වූ පුස්තකාල තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) 2019 දෙසැම්බර් 31 දිනට අරමුදල් ගිණුම් 04 ක තිබුණු එකතුව රු. 1,628,462 ක් වසර 02 ට වඩා වැඩි කාලයක් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි. එසේම පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ විදේශ සිසුන් වෙනුවෙන් නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා 2011 හා 2013 වර්ෂ වල ලැබී තිබුණු එකතුව රු. 6,450,752 ක ප්‍රදාන මුදල් අදාළ අරමුණු සඳහා යොදවා ගැනීමකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි. තවද One Asia Foundation වැඩසටහන වෙනුවෙන් ලද ප්‍රදානයෙන් ඉතිරි රු.205,589 ක් වසර දෙකකට වඩා වැඩි කාලයක සිට ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලද රු.4,149,700 ක් හා ජාත්‍යන්තර සමුළු හා වැඩමුළු සඳහා ලබාගත් මුදලින් ඉතිරි වී තිබුණු රු. 6,907,764 ක් සමාලෝචිත වර්ෂය තුළදී ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) 2019 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශිෂ්‍යත්ව අරමුදල් 10 ක හා තෑගි අරමුදල් 11 ක මුළු එකතුව රු. 6,720,965 ක් වූ ආයෝජන වලින් 2019 දෙසැම්බර් 31 දින දක්වා ලැබී තිබුණු රු. 7,730,800 ක පොලී ආදායම අදාල අරමුණු සඳහා යොදා ගැනීමෙන් තොරව ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) අදාල අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලයේ ආචාර්යවරු වෙනුවෙන් ගෙවන ලද රු. 694,603 ක (ඇමරිකන් ඩොලර් 3840) අනියම් දීමනා විගණිත දිනය වූ 2020 ජූනි 22 දින දක්වාම අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) නාට්‍ය හා ප්‍රතිබිම්බ කලා ඒකකයේ චිත්‍රාගාරය සඳහා 2017 ජනවාරි 27 දින මිලදීගත් රු. 9,929,568 ක් වටිනා කැමරා, රූපවාහිනී හා පරිගණක යන්ත්‍ර ද, 2016 වර්ෂයේදී ලැබී තිබූ පිරිවැය රු. 4,124,830 ක්වූ කැමරා 5 ක් හා පරිගණක යන්ත්‍ර 7 ක් එම වර්ෂවල සිට විගණිත දිනය වූ 2020 ජූනි 26 දින දක්වාම නිෂ්කාර්යව පැවතුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වත්කම් යටතේ දක්වා තිබුණු සේවක ණය ශේෂය තුළ වසර එකේ සිට වසර 4 කට වඩා වැඩි ණය ශේෂය රු. 82,561,766 ක් වූ අතර වසර පහකට වැඩි ණය ශේෂ රු. 652,784 ක් විය. අඩමාණ ණය ලෙස රු.43,652 ක් පමණක් වෙන් කර තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඊ) විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරුන්ගේ පැමිණීම හා පිටවීම නිවැරදිව තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී රු.24,[illegible]ක් ගෙවා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ පීඨ 06 හි අනුමත හා තත්‍ය අධ්‍යයන කාර්යමණ්ඩලය පිළිවෙලින් 728 හා 636 ක් විය. ඒ අනුව පුරප්පාඩු 142ක් පැවතිය දී ආචාර්යවරු 148 දෙනෙකු සප්ත වාර්ෂික හා අධ්‍යයන නිවාඩු ලබාගෙන තිබීමෙන් ශිෂ්‍යයින් 12028 දෙනෙකු වෙත අධ්‍යාපනය ලබා දීම සඳහා කථිකාචාර්යවරු 494 දෙනෙකු පමණක් සේවයේ යොදවා තිබුණි. ඒ අනුව ශිෂ්‍යයින්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමට ප්‍රමාණවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සේවයේ නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඌ) විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා වූ ආචාරධර්ම පද්ධතියට අනුව ශිෂ්‍යයින් සංවර්ධනය කිරීම හා ඉගැන්වීම මූලික අරමුණ බැවින් සියලුම ආචාර්යවරුන් නිරන්තරයෙන් පර්යේෂණ කටයුතු සිදුකල යුතු වුවද එම පර්යේෂණ ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබූ එකතුව රු. 8,096,327 ක්වූ අරමුදල් 29 ක මුදල් වසරකට වඩා වැඩි කාලයක් උපයෝජනය කර නොතිබුණි.

(එ) පශ්චාත් හා ආචාර්ය උපාධි සඳහා 2011 වර්ෂයේ සිට විදේශගතවූ ආචාර්යවරුන් 22 දෙනෙකු නැවත සේවයට වාර්තා නොකිරීම නිසා බැඳුම්කර ගිවිසුම් කඩකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.97,259,926 ක් අයවිය යුතුව පැවතුණි. එමෙන්ම පළපුරුදු හා සුදුසුකම් ඇති ආචාර්යවරුන් විදේශගත වී නැවත නොපැමිණීම නිසා එම දැනුම විශ්වවිද්‍යාලයට ලබා ගැනීමේ අවස්ථාව ද අහිමි වී තිබුණි.

(ඒ) වත්කම් වල ආරක්ෂාව හා පාලනය ශක්තිමත් වන පරිදි 2007 වර්ෂයෙන් පසු ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා සම්පූර්ණ වැටුප් හා දීමනා සහිතව අධ්‍යයන නිවාඩු හා ප්‍රාග්ධන ප්‍රදාන ලබා දී විදේශගත වූ ආචාර්යවරුන් 5 දෙනෙකු එම සුදුසුකම් සපුරා ගැනීමෙන් තොරව සේවයට පැමිණීම හේතුවෙන් ආචාර්යවරයාගේ දැනුම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ මූලික අරමුණු ඉටු වී නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

8

## 12. විගණන කමිටු වාර්තාව

විගණන කමිටුවේ සංයුතිය

පාලක සභාවට වගකිව යුතු උප කමිටුවක් ලෙස ස්ථාපිත විශ්වවිද්‍යාලයේ විගණන කමිටුව විධායක නොවන සභා සාමාජිකයින් තිදෙනෙක්ගෙන් සමන්විත වේ 2019 .වසරේ දී පහත සඳහන් සමාජිකයින් විගණන කමිටු කාර්යයන්හි නිරත වූහ .

| සාමාජික | වසරේ දී කමිටුවට සහභාගීවීම **2019**<br>සහභාගීව /සහභාගීවීම)ීම නියමිත( |
|---|---|
| 1. ප්‍රීති පෙරේරා මහතා (සභාපති) | 4/4 |
| 2. එච්වරකාටුල්ල මහතා .එන් .එම්. | 4/4 |
| 3. ඩොනට් නන්දසිංහ මහතා | 4/4 |

ජාතික විගණන කාර්යාලයේ සාමාජිකයින්ට ද නිරීක්ෂකයින් ලෙස සහභාගීවීම සඳහා ආරාධනා කරන ලදී .

රැස්වීම්

පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක පී 31/.ඩී.ඊ.අනුව වසරකට සිව් වතාවක් කමිටුව රැස්විය යුතුය . සලකා බලන ලද වර්ෂය තුළ කමිටුව සිව් වතාවක් රැස්වූ අතර මෙම රැස්වීම්වල දී අභ්‍යන්තර හා දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා කමිටුවේ .බාහිර විගණන වාර්තා සාකච්ඡාවට ගන්නා ලදී වාර්තාවිශ්වවිද්‍යාල පාලක සභාවට ලබා දෙන ලදී .

ප්‍රධාන වගකීම්

විගණන කමිටුවේ ප්‍රධාන පරමාර්ථය වන්නේ විශ්වවිද්‍යාලයේ මූල්‍ය හා ඒ ආශ්‍රිත කළමනාකරණ කටයුතු ඵලදායී ලෙස කර ගෙන යාම සඳහා පාලක සභාවට සහාය වීමයි.

ප්‍රධාන වගකීම් නම්,

1. මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වාර්තාකරණය සහ ,විගණන ක්‍රියාවලියේ අඛණ්ඩතාව සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම
2. විශ්වවිද්‍යාලයේ මූල්‍ය සහ ඒ ආශ්‍රිත කටයුතුවලට අදාළ ඕනෑම කරුණක් පරීක්ෂා කිරීම
3. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සහ වැඩසටහන අනුමත කිරීම
4. අභ්‍යන්තර විගණන සැලැස්ම හා වැඩසටහන අධීක්ෂණය කිරීම
5. බාහිර හා අභ්‍යන්තර විගණන වාර්තා විමර්ශනය කිරීම සහ නිර්දේශයන්ට සම්බන්ධව පසුවිපරම් කටයුතු සිදු කිරීම
6. අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායී ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම
7. පිරිවැය කාර්යක්ෂමතාව සහ නාස්තිකාර වියදම් නැති කිරීම සඳහා කාර්යසාධනය නිරන්තරයෙන්ම සමාලෝචනය කිරීම
8. ආඥාපනත්රීති සහ චක්‍රලේඛ ආදියට අනුකූලවීම තහවුරු කිරීම ,රෙගුලාසි ,

වසර තුළ ක්‍රියාකාරකම්

විමර්ශනයට ලක් කළ වසර තුළ කමිටුව පහත සඳහන් ක්‍රියාකාරකම්වල නිරත විය.

**1.** අභ්‍යන්තර විගණන සැලසුම් සහ වැඩසටහන් අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම

වසර සඳහා වූ අභ්‍යන 2019්තර විගණන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන වැඩසටහන කමිටුව අනුමත කරන ලදීවිමසුම්වල ක්‍රියාකාරීත්වය සහ අභ්‍යන්තර විගණන ,කමිටුව අභ්‍යන්තර විගණනයේ ඵලදායීතාව . .අංශයේ ක්‍රියාකාරීත්වය සමාලෝචනය සහ අධීක්ෂණය කිරීම

**2.** නීති සහ රෙගුලාසි සමඟ අනුකූලතාවය

බාහිර සහ අභ්‍යන්තර විගණකවරු විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම සමාලෝචනය කරන ලදීවිශ්වවිද්‍යාලයේ වාර්ෂික ගිණුම් වාර්තා පිළියෙල කිරීම හා . විශ්‍රාම අරමුදල් නිදහස් කිරීම සහ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම ,පාරිතෝෂික ගෙවීම ,ඉදිරිපත් කිරීම යනාදී ව්‍යවස්ථානුකූල ගෙවීම් නිරවුල් කිරීම පිළිබඳව තවදුරටත් කමිටුව විසින් පසුවිපරම් කරන ලදී .

**3.** ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් අඛණ්ඩව සමාලෝචනය සහ අධීක්ෂණය

කමිටුව මඟින් බැඳුම්කර කඩ කරන ලද කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් ආපසු අය කිරීම් ක්‍රියාවලිය අඛණ්ඩව සමාලෝචනය සහ අධීක්ෂණය කරන ලදීඑක් පුද්ගලයෙක්ගෙන් ,එහි ප්‍රතිඵලයක් ලෙස . 20.4 මිලියන .සම්පූර්ණ බැඳුම්කර මුදල ආපසු අය කර ගැනීමට හැකි වූ අතර සමාලෝචිත වර්ෂය තුළ දී රැක මුදලක් අය කර ගැනීමට හැකියාව ලැබුනි 2019 .වර්ෂය ආරම්භයේ දී බැඳුම්කර කඩ කළ තැනැත්තන් 17 වර්ෂය තුළ දී එක් තැනැත්තෙක්ගෙන් මුළු බැඳුම්කර වටිනාකම ආපසු අය කර ගැනීමට .දෙනෙක් විය පුද්ගලයින් අට දෙනෙක් අය විය යුතු මුදල් වාරික වශයෙන් ගෙවමින් සිටින අත .හැකියාව ලැබුනිර තවත් තිදෙනෙක්ගෙන් අදාළ මුදල් අය කර ගැනීම සඳහා දැනටමත් නීතිමය පියවර ගෙන ඇතඑක් . තැනැත්තෙක්ගේ බැඳුම්කර වටිනාකම එහි නිරවද්‍යතාව සඳහා විගණනය කරමින් පවතින අතර බැඳුම්කර මුදල් ගෙවිය යුතු තැනැත්තන් අට දෙනෙක් සඳහා වාරික නිසි කාලයට ගෙවන ලෙස දැනුම් දෙමින් සිහිකැඳවීම් ලිපි යවා ඇත .

**4.** අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම සහ ශක්තිමත් කිරීම

ස්ථාවර වත්කම් පාලනය ,පුස්තකාල පොත් බැහැර දීම ,කොන්ත්‍රාත් කටයුතු සඳහා වියදම් ක්‍රමවත් කිරීම , ,නොපිය වූ අත්තිකාරම් අය කර ගැනීම ,ස්ථාවර වත්කම් සමීක්ෂණය /වාර්ෂික ලබඩා තොග සමීක්ෂණය හඳුනා නොගත් සහ අය කර ගත නොහැකි ණය ශේෂයන් පියවීම යන අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දෙන ලදීවර්ෂයේ දී නිකුත් කළ විගණන වාර්තා 2019 තව ද විගණකාධිපති විසින් . සහ විගණන විමසුම්වලින් පෙන්වාදෙන ලද දුර්වලතාවන් නිවැරදි කිරීමට ගන්නා ලද පියවර අඛණ්ඩවම සමාලෝචනය කරන ලදී .

**5.** විගණන කමිටු රැස්වීම්

විගණන .31වැනි දිනෙන් අවසන් වර්ෂය තුළ විගණන කමිටුව හතර වතාවක් රැස්විය දෙසැම්බර් 2019 විගණකාධිපති .කමිටුවේ සියලුම සාමාජිකයින් සෑම විගණන කමිටුවක් සඳහාම ක්‍රියාකාරී ලෙස දායක විය දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙක් ආරාධිත නිරීක්ෂකයෙක් ලෙස සෑම විගණන කමිටු රැස්වීමකටම සහභාගී වියවිශ්වවිද්‍යාලයේ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින්ට අවශ්‍ය වූ විට පැමිණීම සඳහා . ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරනු .ආරාධනා කරන ලදී .ලබයි

නිගමනය

වසර තුළ කමිටුව විසින 2019් සලකා බලන ලද කරුණු සම්බන්ධයෙන් ලබා දෙන ලද නිර්දේශ මත පසුවිපරම් කටයුතු සිදු කිරීමේ සාර්ථකත්වය පිළිබඳව කමිටුව සෑහීමකට පත් විය.

සභාපති
විගණන කමිටුව
කැලණිය විශ්වවිද්‍යාලය

## 13 විගණකාධිපතිගේ වාර්තාව පිළිබඳ කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ නිරීක්ෂණය

කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
களனிப் பல்கலைக்கழகம், இலங்கை
UNIVERSITY OF KELANIYA, SRI LANKA
කැලණිය களனி KELANIYA

මගේ අංකය / எனது இல / My No.
ඔබේ අංකය / உமது இல / Your No.

මගේ අංකය :- UK/IA/04/FAR/2019/Final

ඔබේ අංකය :- HED/E/UOK/1/2019/10

2020 නොවැම්බර් මස 24 දින

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල

කැලණිය විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

ඔබගේ ඉහත සමාංකය සහ 2020 අගෝස්තු 18 දින දරන, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අදාළ පැහැදිලි කිරීම පහත ඉදිරිපත් කෙරේ.

1. මූල්‍ය ප්‍රකාශන

1.1. මතය ව්‍යාවනය

1.2. <u>මතය ව්‍යාවනය සඳහා පදනම</u>

(අ) මෙම ප්‍රත්‍යාගණනය නොකළ ඉඩම් හා ගොඩනැඟිලි ප්‍රත්‍යාගණනය කර 2020 වසරේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කෙරෙමින් පවතී.

(ආ) 2020 වසරේ දී නිවැරදි කිරීමට කටයුතු කෙරේ.

උප කුලපති / உபவேந்தர் / Vice-Chancellor 2914474 Fax : 2911485
ලේඛකාධිකාරී / பதிவாளர் / Registrar 2911569 Fax : 2908167
මූල්‍යාධිකාරී / தவிசாளர் / Bursar 2911393 Fax : 2911393
සාමාන්‍ය / பொது / General 2911391, 2911397 2910164, 2911407 2913854-8

1

(ඇ) 2020 වසරේ දී නිවැරදි කිරීමට කටයුතු කෙරේ.

(ඈ) ජ'නල් අංක R-0111 මගින් 2020 වසරේ දී නිවැරදි කර ඇත.

(ඉ) මෙවැනි අඩුපාඩු ඉදිරියේ දී අවම කිරීමට අවශ්‍ය උපදෙස් දී ඇත.

(ඊ) ලීබඩු 10% බැගින් ද, කාර්යාල උපකරණ හා විද්‍යුත් උපාංග 20% බැගින් ද, වාර්ෂිකව සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කිරීම විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තියවේ. මෙය පැහැදිලිව මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය ප්‍රතිපත්තිය යටතේ දක්වා ලීබඩු හා කාර්යාල උපකරණ වෙන් වූ කාණ්ඩ 02 ක් වශයෙන් 2020 මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු සලසා ඇත.

(උ) විගණන කටයුතු සිදුවෙන කාලය වන විට ජ'නල් වවුචර මිටි වශයෙන් බැඳීම පිළිබඳව ගැටළුවක් තිබුනේ වී නමුදු එම වවුචර විගණනය කිරීමේ බාධාවක් තිබුනේ නැත. මිටි බැඳ තිබූ ජ'නල් වවුචර රජයේ විගණන අංශයට ඉදිරිපත් කර ඇත.

වවුචර බැඳීම බාරව සිටි පොත් බැඳුම්කරු තනතුර පුරප්පාඩුවී තිබීම, ස්ථාවර රජයක් නොමැති වීමේ හේතුව මත නව බඳවා ගැනීමක් සිදුනොවීම සහ COVID-19 බලපෑම යන කරුණු වවුචර මිටි බැඳීම ප්‍රමාද වීමට හේතු විය.

ජ'නල් වවුචර ඉල්ලුම් කරන ලද අංක: HED/E/UOK/1/2019/10 සහ 2020 මාර්තු 04 දිනැති ලිපිය අනුව පහත දැක්වෙන පරිදි ජ'නල් වවුචර රජයේ විගණන කාර්යාලය වෙත බාර දී ඇත.

1. 2020.03.04 දින - පුනරාවර්තන වැය සඳහා වූ ජ'නල් වවුචර් ගොණු 5 ක්

2. 2020.03.11 දින - උපයාගත් ආදායම් වලින් දරණ ලද වැය සම්බන්ධ ජ'නල් වවුචර් ගොණු 13 ක්

3. 2020.03.12 දින - පුනරාවර්තන වැය සඳහා වූ ජ'නල් වවුචර් ගොණු 10 ක්

මීට අමතරව, සියළු ජ'නල් වවුචර වල උප පත්‍රිකා පොත් පසුව රජයේ විගණන අංශය වෙත බාර දී ඇත.

රජයේ විගණන අංශය, විශ්වවිද්‍යාලය තුලම පිහිටුවා ඇති බැවින් ඕනෑම කරුණක් පැහැදිලි කරදීමට ඉඩකඩ තිබුණි. COVID -19 බලපෑම මත නිසිපරිදි මෙම කටයුත්ත සිදුනොවී ඇති බැව් නිරීක්ෂණය වන බැවින් ද, අදාළ ගෙවීම් සඳහා නිසි අනුමැතිය ලබාගෙන ඇති බැවින් ද, මූල්‍ය ප්‍රතිපලය සඳහා එම වවුචර මගින් සිදුවූ ගනුදෙනු විශේෂ බලපෑමක් ඇති නොවන බව පැහැදිලි වේ.

(ඌ)බැංකු ගිණුම්වලට අදාළව දෛනිකව හඳුනාගත නොහැකි ඍජු බැර කිරීම් සම්බන්ධයෙන් මහජන බැංකුව කැලණිය ශාඛාවෙන් දෛනිකව තොරතුරු ලබා ගැනීම මේ වනවිට සිදු කරමින් පවතී.

ඍජු බැර කිරීම් සම්බන්ධයෙන්, අදාළ මුදල් බැර කිරීම් ලදුපත්වල පිටපත් බැංකුවෙන් ලබා ගත්ත ද එම පිටපත්වලට අදාළ ආදායම් බැර කිරීම්වලට අදාළ තොරුතුරු දක්වා නොමැති නිසා ඍජු බැර කිරීම් හඳුනා

2

ගැනීමට අපහසු වී ඇත. තවද, ටෙලර් යන්ත්‍ර භාවිතා කර මුදල් තැන්පත් කිරීම නිසා ආදායම් බැර කිරීම් සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට අපහසු වී ඇත.

හඳුනාගත නොහැකි ඍජු බැර කිරීම් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ සියලු අංශ දැනුවත් කර ඇති අතර තොරතුරු නොලැබීම මත, මුදල් කමිටු ආවරණ අනුමැතියට යටත්ව මිශ්‍ර ආදායම් ලෙස මෙම ඍජු බැර කිරීම් ගිණුම්ගත කර ඇත.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

නීතිරීති/විධානවලට යොමුව

**i. මුදල් රෙගුලාසි 371**

| අත්තිකාරම් මුදල් ලබා ගත් දිනය | ලබා ගත් අයගේ නම | මුදල් (රු) | නොපියවීමට හේතු |
|---|---|---|---|
| **2016.08.18** | මහාචාර්ය සුනන්ද මද්දුමබණ්ඩාර | **74,250.00** | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අඩු කර ඇත. |
| **2016.08.31** | එච්.ජේ.කේ.එස්. සංජීවනී | **82,200.00** | වැටුපෙන් අඩු කර ගැනීමට කටයුතු කර ඇත. |
| **2018.12.09** | ආචාර්ය සී.එස්.කේ. රාජපක්ෂ | **20,000.00** | පියවීමට කටයුතු කරන ලදි. |
| **2010.11.06** | ජේ.ටී.එස්. ගුණසේන මයා | **100,000.00** | |
| **2017.07.05** | ආචාර්ය එච්.එම්.හේරත් | **75,000.00** | පියවීම් වවුචරය ලැබී ඇතත් අඩුපාඩු සකස් කිරීම සඳහා නැවත අදාළ අංශය වෙත යවා ඇත. |
| **2014.10.21** | මහාචාර්ය ආර්.කේ.එල්.එම්. ධර්මසිරි | **66,000.00** | |
| **2017.11.24** | ආචාර්ය පී.ඒ. අමරසිංහ | **71,000.00** | |
| **2018.10.08** | එම්.පී.ඩී.එස්. සෝමරත්න | **82,500.00** | |
| **2017.08.01** | ආචාර්ය අනූෂා එදිරිසිංහ | **50,000.00** | මෙතෙක් පියවා නැත. පියවීම් කරන ලෙස දන්වා දැනුවත් කිරීම් ලිපි යවා ඇත. |
| **2017.01.10** | ආචාර්ය එම්. ගුණානන්ද තෙර | **168,000.00** | |
| **2018.02.23** | ආචාර්ය එම්. ගුණානන්ද තෙර | **50,000.00** | |
| **2018.05.01** | ආචාර්ය චන්දිමා බෝගහවත්ත | **100,000.00** | |
| **2018.08.01** | ආචාර්ය එම්.ජී. කුලරත්න | **200,000.00** | |
| **2010.11.06** | ආචාර්ය පී.ඒ. අමරසිංහ | **100,000.00** | |
| | එකතුව | **1,238,950.00** | |

3

**ii. මුදල් රෙගුලාසි 396**

2017.12.31 දින දක්වා තැන්පත් නොකල චෙක්පත් රු.607,634.11 ක් අදාළ ආදායකයන් දැනුවත් කිරීමෙන් පසුව ප්‍රතිචාරයක් නොලද බැවින් පාලක සභා අනුමැතිය මත ආදායමට මාරුකර ඇත. 2018.01.01 සිට 2019.06.28 දක්වා කාලපරිච්ඡේදයට අදාළ චෙක්පත් සම්බන්ධව අදාළ ආදායකයන් දැනුවත් කිරීම මේ දිනවල සිදුකරන අතර, ඒ සඳහා ප්‍රතිචාරයක් නොලද චෙක්පත් නිසිපරිදි ආදායමට ගැනීමට කටයුතු කරනු ඇත.

**iii.මුදල් රෙගුලාසි 571**

පුස්තකාල තැන්පතු නිදහස් කරනු ලබන්නේ අදාළ සිසුවා විසින් ඒ සඳහා ඉල්ලීමක් කළ පසුවය. ඒ අනුව සිසුන්ගේ ඉල්ලීමක් ලැබෙන තෙක් එම මුදල් නිදහස් කිරීමට විශ්වවිද්‍යාලයට හැකියාවක් නොමැත.

මෙම වසර තුළදී ද 2013 හා 2014 වර්ෂවල සිසුන්ගේ පුස්තකාල තැන්පතුවලින් කොටසක් නිදහස් කර ඇත. ඉදිරියට ද සිසුන්ගේ ඉල්ලීම් ලැබෙන පරිදි එම මුදල් නිදහස් කරනු ඇත.

3. <u>අනෙකුත් විගණන නිරීක්ෂණ</u>

(අ) අදාළ ජාත්‍යන්තර සමුළු හා වැඩමුළු අවසන් වී ඇති බැවින් එම ඉතිරි මුදල්, මුදල් කමිටුව වෙත ඉදිරිපත් කර, එම කමිටු නිර්දේශය අනුව 2020 වර්ෂය තුළදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

එමෙන්ම One Asia Foundation වැඩසටහනට අදාළ ශේෂය සිංහල අංශය මගින් අංශයේ සංවර්ධන කටයුතු සඳහා භාවිතා කිරීමට කටයුතු කරන මෙන් දන්වා ඇත. එම නිසා ජ්නල් අංක 143 මගින් අංශ සංවර්ධන අරමුදලට මාරු කර ඇත. (2020-05 දරන මුදල් කමිටුවේදී නිර්දේශ වී ඇත.)

<u>පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ විදේශ සිසුන් වෙනුවෙන් නේවාසිකාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය.</u>

| අංකය | විස්තරය | දිනය |
|---|---|---|
| 01 | ව්‍යාපෘති සැලසුම් යෝජනා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට භාරදීම | 06.10.2017 |
| 02 | විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය | 12.09.2017 |
| 03 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තොරතුරු ඉල්ලීම | 26.02.2018 |
| 04 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ශක්‍යතා වාර්තාවක් ඉල්ලීම | 23.07.2018 |
| 05 | නැවත විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය | 09.10.2018 |

4

| | | |
|---|---|---|
| 06 | ව්‍යාපෘති සැලසුම් යෝජනාව නැවත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ ඉල්ලීම පරිදි භාරදීම | 16.11.2018 |
| 07 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි අලුත් ව්‍යාපෘති සැලසුම් අයදුම්පත අනුව නැවත ඉල්ලුම් කරන මෙන් දැන්වීම | 01.04.2019 |
| 08 | විශ්වවිද්‍යාලය මෙය නව අයදුම්පතට අදාළ නොවන බව හා නැවත සලකා බලන ලෙස දැන්වීම | 08.04.2019 |
| 09 | නව අයදුම්පත අනුව ව්‍යාපෘති සැලසුම් යෝජනාව නැවත භාරදිය යුතු බව විශ්වවිද්‍යාලයට දැන්වීම | 16.05.2019 |
| 10 | නැවත විශ්වවිද්‍යාලය නව අයදුම්පත අනුව ව්‍යාපෘති යෝජනාව භාරදීම | 07.06.2019 |
| 11 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත | 19.12.2019 |
| 12 | කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු කරන මෙන් ඉල්ලීමක් කර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිපියක් යොමු කර ඇත. | 20.08.2020 |

(ආ)

| තැගි අරමුදල් | |
|---|---|
| 01. පූජ්‍ය කුඩාවැලේ වංගීස නාහිමි අනුස්මරණ ශිෂ්‍යත්ව අරමුදල | 2020.07.08 දින මෙම ශිෂ්‍යත්වය විද්‍යාර්ථීන් තිදෙනෙකුට රු.1,000/- බැගින් ප්‍රදානය කරන ලදි. |
| 02. බුද්ධදාස ගලප්පත්ති ත්‍යාගය | මෙම ශිෂ්‍යත්වය එක් විද්‍යාර්ථියකු සඳහා රු.1,000/- ක් 2020.03.03 දින පිරිනැමීමට අවශ්‍ය කටයුතු කර ඇත. |
| 03. පී.ඒ.පී.ඒ. චන්ද්‍රසේකර ශිෂ්‍යත්වය | මෙම ශිෂ්‍යත්වය විද්‍යාර්ථීන් තිදෙනෙකුට පිරිනැමීමට පාලක සභා අනුමැතිය දින ලැබී ඇති බැවින් එක් විද්‍යාර්ථියකු සඳහා රු. 20,000/- බැගින් පිරිනැමීමට පීඨ මණ්ඩල අනුමැතියට යොමු කර ඇත. |
| 04. ආචාර්ය පී.ඩී. කන්නන්ගර ශිෂ්‍යත්වය | 2017/2018 අධ්‍යයන වර්ෂයේ ඉතිහාසය ශාස්ත්‍රවේදී ගෞරව උපාධි ප්‍රථම වසර සාමාසික දෙකෙහි පරීක්ෂණවලින් වැඩිම ලකුණු ලබාගත් විද්‍යාර්ථියාට පිරිනමනු ඇත. |
| 05. එම්.ඒ.පී. මන්ත්‍රීරත්න අනුස්මරණ ශිෂ්‍යත්වය | අංශ ප්‍රධාන/ භෞතික විද්‍යා අධ්‍යයන අංශය වෙත මෙහි පවතින අක්‍රිය තත්ත්වය දන්වා 2020.02.18 හා 2020.09.10 යන දින වල ලිපි යොමු කර ඇති අතර මේ සඳහා ප්‍රතිචාර දක්වමින් එහි නිර්ණායක සංශෝධනයක් කර සනාතන සභාවට යොමු කර ඇත. |
| 06. මේධා ශ්‍රී ආරියවංශ ශිෂ්‍යත්වය | මෙම ශිෂ්‍යත්වයේ 2019.12.31 දිනට පොලී ශේෂය රු.11,384.14 කි. මෙම ශිෂ්‍යත්වය සඳහා නව නිර්නායකයක් පිළියෙල කර එය පාලක සභා අනුමැතියට යොමු කර ඇත. |
| 07. පූජ්‍ය පණ්ඩිත මුදුකටුවේ ශ්‍රී ඥානාරාම නායක ස්වාමීන්ද්‍ර ත්‍යාගය හා පූජ්‍ය ආචාර්ය කාක්කපල්ලියේ අනුරුද්ධ නායක ස්වාමීන්ද්‍ර ත්‍යාගය. | පවතින නිර්නායකය 1996 වසරේ පිළියෙල කර ඇති එකක් බැවින් නව නිර්නායකයක් පිළියෙල කර 2017/2018 අධ්‍යයන වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත. |

5

| | |
|---|---|
| 08. ආචාර්ය කේ.එම්.පී. කුලසේකර ශිෂ්‍යත්ව අරමුදල | 2017/2018 අධ්‍යයන වර්ෂයේ ඉතිහාසය ශාස්ත්‍රවේදී ගෞරව උපාධි ප්‍රථම වසර සාමාසික දෙකෙහි පරීක්ෂණවලින් වැඩිම ලකුණු ලබාගත් විද්‍යාර්ථියාට පිරිනමනු ඇත. |
| 09. මහාචාර්ය ඒ එස් දිසානායක අරමුදල | මෙම තෑගි අරමුදල් ප්‍රදානය කිරීම සඳහා 2019 වර්ෂයේදී උපාධි ප්‍රධානෝත්සවයක් පවත්වා නොමැත. |
| 10. මහාචාර්ය කාලෝ ෆොන්සේකා ශිෂ්‍යත්ව අරමුදල | මෙම තෑගි අරමුදල් ප්‍රදානය කිරීම සඳහා 2019 වර්ෂයේදී උපාධි ප්‍රධානෝත්සවයක් පවත්වා නොමැත. |
| 11. පවුල් වෛද්‍ය අධ්‍යනාංශ තෑගි අරමුදල | මෙම තෑගි අරමුදල් ප්‍රදානය කිරීම සඳහා 2019 වර්ෂයේදී උපාධි ප්‍රධානෝත්සවයක් පවත්වා නොමැත. |
| **ශිෂ්‍යත්ව අරමුදල්** | |
| 01. පී.පී. ජයවර්ධන ශිෂ්‍යත්ව අරමුදල | මෙම ශිෂ්‍යත්වය සඳහා පවතින නිර්නායකය 1983 වසරේ සැකසූ එකක් බැවින් ගෙවීම් කිරීමේදී කිරීමේදී ගැටලු මතු වී ඇති බැවින් නව නිර්නායකයක් පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. |
| 02. මේරිස් වෙනර් ශිෂ්‍යත්වය | මෙම ශිෂ්‍යත්වය 2020.07.08 දින විද්‍යාර්ථීන් දෙදෙනෙකුට රු.20,000/- බැගින් පිරිනමන ලදි. |
| 03. මහාචාර්ය ෂෙල්ටන් ගුණරත්න ශිෂ්‍යත්ව අරමුදල | 2020.07.15 දින මෙම ශිෂ්‍යත්වය විද්‍යාර්ථීන් 10 දෙනෙකුට රු.5,000/- බැගින් පිරිනමන ලදි. |
| 04. මහාචාර්ය පියදාස රණසිංහ ශිෂ්‍යත්වය | 2020.07.05 දින රන් ආලේපිත ස්වර්ණ මුද්‍රිකාවක් එක් විද්‍යාර්ථියකුට පිරිනැමීමට අවශ්‍ය කටයුතු කර ඇත. |
| 05. මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාතිලක අනුස්මරණ ශිෂ්‍යත්වය. | මෙම ශිෂ්‍යත්වය 2020.07.24 දින විද්‍යාර්ථීන් 06 දෙනෙකට එක් විද්‍යාර්ථියකු සඳහා රු.12,325/- බැගින් පිරිනැමීමට කටයුතු කර ඇත. |
| 06. රත්නාකර ශිෂ්‍යාධාර අරමුදල | මේ සඳහා අංශ ප්‍රධාන වාග් විද්‍යා අධ්‍යයන අංශය වෙත ලිපියක් 2020.09.06 දින ඉදිරිපත් කර තිබූ අතර ඒ සඳහා ප්‍රතිචාර දක්වා මේ වන විට ශිෂ්‍යත්ව ප්‍රදානයට කටයුතු කර ඇත. |
| 07. මහාචාර්ය ලීනස් සිල්වා ශිෂ්‍යත්වය/ ඇග්නස් පේදුරු | අංශ ප්‍රධාන/වාණිජ හා කළමණාකරන අධ්‍යයන අංශය වෙත මෙහි පවතින අක්‍රිය තත්ත්වය දන්වා ලිපි යොමු කර ඇති අතර මේ සඳහා ප්‍රතිචාර දක්වමින් එහි නිර්ණායක සකස් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා සිටි අතර 2020 වසරේ සිට ක්‍රියාත්මක වන බවට දන්වා ඇත. |
| 08. හැවන්පොල ශ්‍රී රතනසාර ශිෂ්‍යත්වය | අංශ ප්‍රධාන පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය මගින් මෙම ශිෂ්‍යත්වය පිරිනැමීම සඳහා නව නිර්නායකයක් පිළියෙල කර පීඨ මණ්ඩල නිර්දේශය සඳහා යොමු කර ඇත. |

**(ඇ) වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ MBA පාඨමාලාවේ 2019 වර්ෂයේ අධ්‍යයන වාරිකාව සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 16 දෙනෙකු වෙනුවෙන් අනියම් දීමනාව ලෙස මෙම මුදල ගෙවා ඇත. මේ සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇති අතර එම අනුමැතිය නොලැබෙන්නේ නම් අදාළ කාර්යමණ්ඩල සාමාජිකයින්ගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.**

6

(ඇ) 2016 වර්ෂයේ ලැබී තිබූ කැමරා 05 ක් පරිගණක යන්ත්‍ර 07 ක් සහ 2017 ජනවාරි 27 මිලයට ගත් කැමරා, රූපවාහිනී සහ පරිගණක යන්ත්‍ර ද අධ්‍යයනාංශය තුළ තොග භාණ්ඩ ලේඛනයට ඇතුළත් කර ඇති අතර ඒවා විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන කාර්යයන් සඳහා භාවිතයට ගන්නා ලෙස අදාළ අංශ ප්‍රධාන මගින් ඒකක ප්‍රධාන වෙත උපකුලපති අත්සනින් යුතු ලිපියක් මගින් උපදෙස් දී ඇත.

(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත ආපදා ණය, ප්‍රවාහන ණය ආදී සියලු සේවක ණය අයවීම වාරික 60 ක් තුල වාරික ලෙස අය කරමින් පවතී. ඒ අනුව ණය මුදල් වසර 06 ක පමණ කාලයක් තුළ දී අයවීම සිදු වේ. ඒ සඳහා 4.2% ක පොලී මුදලක් මාසිකව අය කරයි. ඒ අනුව වසර එකේ සිට වසර හතරක් දක්වා රු.82,561,766/- ක මුදලක් ශේෂ වශයෙන් පවතී.

වසර පහකට වැඩි ණය ශේෂ රු.676,096/-ක් ලෙස විය යුතු අතර ඉන් රු.335,039/- ක මුදලක් සක්‍රිය තත්ත්වයේ පවතින අතර එම මුදලින් රු.173,407/-ක මුදලක් 2020 ජූලි මස වන විට ගෙවා අවසන් කර ඇත.

රු.341,057/- ක මුදලක් දිගු කලක සිට අය නොවන ණය ලෙස හඳුනා ගෙන ඇති අතර ඉන් බොහොමයක් ණය, අර්ථ සාධක අරමුදල් නිදහස් කිරීම මගින් නිදහස් කිරීමට කටයුතු කර ඇත.

1994 හා 2000 වර්ෂ, ණය අයකල අවසන් වසර ලෙස සඳහන් ණය ශේෂ දෙකක තොරතුරු සොයා ගත නොහැකි අතර එම ණය ශේෂ අඩමාන ණය ලෙස හඳුනා ගෙන ඇත.

(ඊ) බාහිර කථිකාචාර්යවරුන්ගේ පැමිණීම වාර්තා කිරීම සඳහා මේ වන විට විශ්වවිද්‍යාලය මගින් නිකුත් කරනු ලබන පැමිණීම පිටවීම සටහන් කිරීම සඳහා ස්වයං අධීක්ෂණයට ලක්වන පරිදි ලේඛනයක් පවත්වාගැනීම මානව ශාස්ත්‍ර පීය කාර්යාලය මගින් සිදුකරනු ලබන අතර අදාළ බාහිර කථිකාචාර්යවරුන්ගේ ගෙවීම් අනුමත කිරීමේදී පැමිණීමේ වාර්තා සහ දේශන පැවැත්වූ පැය සංඛ්‍යාවෙහි නිවැරදිතාව පරීක්ෂා කිරීම එක් එක් අධ්‍යයන අංශය විසින් මාසිකව සිදුකරයි.

(උ) බාහිර කථිකාචාර්යවරුන්ට දේශන පැය වෙන් කිරීම අදාළ අධ්‍යයන අංශ මගින් සිදු කරනු ලබයි. මේ වන විට අධ්‍යයන කාර්ය මණ්ඩලය 637 ක් වන අතර එම කාර්ය මණ්ඩලයේ ඇතැම් පුරප්පාඩු සම්පූර්ණ කිරීමට පුවත්පත් දැන්වීම් පළ කර ඇති අතර, අයදුම්පත් කැඳවා ඇති පුරප්පාඩු සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට සූදානම් කර ඇත.

(ඌ) වැඩකටයුතු අවසන් වූ පර්යේෂණ වෙනුවෙන් ඉතිරි වූ ප්‍රතිපාදන ආපසු එම ආයතන වෙත යැවීමට කටයුතු යොදන අතර මේ වනවිටත් ඇතැම් පර්යේෂණයන් හි ශේෂය ආපසු යවා ඇත. අදාළ පර්යේෂකයන් විදේශගතවීම නිසා ද පර්යේෂණ කටයුතු ඇණහිට ඇති අතර ඇතැම් පර්යේෂණ ව්‍යාපෘතිවල ඉතිරි මුදල් පාලක සභා අනුමැතිය මත වෙනත් පර්යේෂණ සඳහා මාරුකිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

එසේම ඇතැම් පර්යේෂණ ව්‍යාපෘති, පර්යේෂණ සාධක නොලැබීම මත පසුගිය වර්ෂයේ ක්‍රියාත්මක වී නොමැති නමුත් ඉදිරියට ක්‍රියාත්මක වීමට නියමිත පර්යේෂණ වේ.

ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින ව්‍යාපෘති සම්බන්ධයෙන් අදාළ පර්යේෂකයන් දැනුවත් කර මුදල් කමිටු අනුමැතිය ලබාගෙන නැවත අයකර ගැනීමට කටයුතු කරනු ඇත.

7

(ඒ) පශ්චාත් හා ආචාර්ය උපාධි කටයුතු සඳහා විදේශගත වී නැවත සේවයට වාර්තා නොකිරීම නිසා ගිවිසුම් හා බැඳුම්කර කඩකළ ආචාර්යවරු සංඛ්‍යාව මේ වන විට 23 දෙනෙකු වන අතර ඔවුන්ගෙන් අය විය යුතු මුදල රු.111,394,575.30 කි. අධ්‍යයන කාර්ය මණ්ඩලයට තම පශ්චාද් උපාධි සුදුසුකම් සම්පූර්ණ කරගැනීමට විදේශ අධ්‍යයන නිවාඩු නිර්දේශ කෙරේ. මෙම නිවාඩු සීමා කිරීමට හැකියාවක් නොමැත.

(ඒ) ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වනවිටත් අරඹා ඇති අතර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු ද බොහෝ සෙයින් අවසන්ව ඇත. අපහරණය කරන ලද වත්කම් වල මිලදීගත් වටිනාකම් හා දිනයන් පිළිබඳව පැහැදිලි විස්තර නොතිබූ බැවින් ගිණුම්වලට ගැලපීම සිදුකිරීමට නොහැකි විය. කෙසේ වෙතත් 2020 වර්ෂයේ දී ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

(ඔ) පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා විදේශගතව, එම සුදුසුකම් සම්පූර්ණ නොකර නැවත සේවයට පැමිණි අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආචාර්යවරයාගේ නම | වර්තමාන තත්ත්වය |
|---|---|
| අනූෂා සල්වතුර මහත්මිය | ආචාර්ය උපාධි සහතිකය ඉදිරිපත් කර ඇත. |
| මහාචාර්ය උදා හෙට්ටිගේ මහත්මිය | පර්යේෂණ නිබන්ධනය බාර දී ඇති බවට ලිපියක් ඉදිරිපත් කර ඇත. |
| ජී.කේ. රත්නායක මිය | තවදුරටත් ආචාර්ය උපාධිය හදාරමින් සිටී. |
| ඩී.කේ. මනතුංග මහත්මිය | තවදුරටත් ආචාර්ය උපාධිය හදාරමින් සිටී. |
| එම්.ඩී.පී. පීරිස් මහතා | තවදුරටත් ආචාර්ය උපාධිය හදාරමින් සිටී. |

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්. ආර්. ද සිල්වා
උපකුලපති

පිටපත් :- 01 සභාපති :- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
02 ලේකම් :- අධ්‍යාපන අමාත්‍යාංශය
03 ලේකම් :- මුදල් අමාත්‍යාංශය

8